84 වන කාණ්ඩය
11 වන කලාපය

අඟහරුවාදා
1969 මැයි 6

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

### නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1867]

ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනත් කෙටුම්පත [තී. 1922] :
දෙවනවර කියවීම—විවාදය කල් තබන ලදී.

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලද පනත් කෙටුම්පත් [තී. 2023, තී. 2025] :

ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය පනත් කෙටුම්පත [සෙනෙට්]

ලංකා දුම්රිය ගාඩ්වරුන්ගේ සහ ලොකොමොටිව් එන්ජින්මන්වරුන්ගේ අර්ථ සාධක සංගමය (නීතිගත කිරීමේ) පනත් කෙටුම්පත

සංචාරක සංවර්ධන පනත: නියෝග [තී. 2027]

ආහාර පාලන පනත: නියෝග [තී. 2044]

කල්තැබීමේ යෝජනාව [තී. 2046]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 84
இல. 11

செவ்வாய்க்கிழமை
6 மே 1969

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்


விஞக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1867]

காணி கொள்ளுதல் (திருத்த) மசோதா [ப. 1922] :
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

இலங்கை தேசிய கைத்தொழில் மன்ற மசோதா [செனெற்] [ப. 2023] :
இரண்டாம் மூன்றும் மதிப்புக்கள் இடம்பெற்று நிறைவேற்றப்பட்டது

இலங்கை புகைவண்டிக் காவலாளர்களினதும் நீராவியந்திர எஞ்சின் தொழிலாளர்களினதும் சகாயச் சங்கம் (இணைத்தல்) மசோதா : [ப. 2025]
இரண்டாம் மூன்றும் மதிப்புக்கள் இடம்பெற்று நிறைவேற்றப்பட்டது

உல்லாசப்பிரயாண அபிவிருத்திச்சட்டம் : பிரமாணங்கள் [ப. 2027]

உணவுக்கட்டுப்பாட்டுச்சட்டம் பிரமாணங்கள் [ப. 2044]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 2046]


---

Volume 84
No. 11

Tuesday
6th May 1969

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Col. 1867]

LAND ACQUISITION (AMENDMENT) BILL [Col. 1922] :
Second Reading—Debate adjourned

CEYLON NATIONAL CHAMBER OF INDUSTRIES BILL [Senate] [Col. 2023] :
Read a Second, and the Third time, and passed

CEYLON RAILWAY GUARDS' AND LOCOMOTIVE ENGINEMEN'S PROVIDENT ASSOCIATION (INCORPORATION) BILL [Col. 2025] :
Read a Second, and the Third time, and passed

TOURIST DEVELOPMENT ACT : REGULATIONS [Col. 2027]

FOOD CONTROL ACT : REGULATIONS [Col. 2044]

ADJOURNMENT MOTION [Col. 2046]


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

**1969 මැයි මස 6 වන අඟහරුවාදා**

செவ்வாய்க்கிழமை, 6 மே 1969

*Tuesday, 6th May 1969*

---

**පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායක තුමා එම්. සිවසිතම්පරම් මයා. මූලාසනාරූඪ විය.**

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. உப சபா நாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

*The House met at 10* A.M., MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

1. Two regulations made under Sections 29 and 155 of the Army Act (Cap. 357). 2. A set of regulations made under Section 155 of the Army Act (357). 3. A set of regulations made under Section 17 of the Military Training Act (Cap. 363). 4. Two regulations made under Section 161 of the Navy Act (Cap. 358). 5. A regulation made under Sections 29 and 155 of the Air Force Act (Cap. 359).—[*The Hon. Dudley Senanayake.*]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

1. A by-law and a set of by-laws made under Sections 153 and 157 of the Urban Councils Ordinance (Cap. 255).

2. Three by-laws and three sets of by-laws made under Sections 152 and 156 of the Town Councils Ordinance (Cap. 256).

3. Nine orders made under Section 5 of the Village Councils Ordinance (Cap. 257).—[*The Hon. Premadasa.*]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*



## පිළිගන්වන ලද වාර්තා

### சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்

### REPORTS PRESENTED

**පරමාණු බල අධිකාරි මණ්ඩලය පනත් කෙටුම්පත**

அணுசக்தி அதிகார சபை மசோதா

**ATOMIC ENERGY AUTHORITY BILL**

**නියෝජ්‍ය කථානායකතුමා**

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

As Chairman of Standing Committee "B", I present the Report of Standing Committee "B" on the Atomic Energy Authority Bill together with the Minutes of Proceedings.

REPORT

The Committee have considered the Atomic Energy Authority Bill and have agreed to it as amended in the attached reprint.

**පණත් කෙටුම්පත "බී" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි, 1969 ජූනි 9 වන සඳුදා සලකා බලනු ලැබේ.**

மசோதா நிலையற்குழு "பி" யினால் அறிக்கை செய்யப்பட்டவாறு 1969 ஜூன் 9, திங்கட்கிழமை பரிசோதிக்கப்படும்.

*Bill, as reported by Standing Committee "B", to be considered upon Monday, 9th June 1969.*

## 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව

### நிலையற்கட்டளை இல. 51(4) இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்

### REPORT PRESENTED UNDER STANDING ORDER No. 51 (4)

Report on the Bill intituled "An Act to incorporate the Buddhist Publication Society."—[*The Hon. D. P. R. Gunawardena, Minister of Industries and Fisheries, on behalf of the Minister of Education and Cultural Affairs.*]

**පනත් කෙටුම්පත 1969 ජූනි 9 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.**

மசோதா, 1969 ஜூன் 9, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.

*Bill ordered to be read a Second time upon Monday, 9th June 1969.*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினுக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Question No. 1

**පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. பீ. சீ. இம்புலான—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food)

I want one month's time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

விஞவை மற்ளெரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

### ඌරුගොඩවත්තේ කාර්මික පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රදර්ශකයින්
### ஊறுகொடவத்தை கைத்தொழிற் பயிற்சி நிலைய செயல்முறை காட்டுவோர்
### DEMONSTRATORS, TECHNICAL TRAINING CENTRE, URUGODAWATTE

2. **ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කොලොන්නාව මැතිවරණ කොට්ඨාශයේ ඌරුගොඩවත්තේ පිහිටි කාර්මික පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රදර්ශක ත් විසි දෙදෙනාට එක් කෙනෙකුට වැටුප් කීය බැගින් ගෙවන්නේද? (ආ) ඔවුන් සේවයට බඳවා ගනිද්දී හයමාසයක කට පසුව වාර්ෂික වැටුපක් ගෙවන බවට ප්‍රතිඥවක් කාර්යභාර උප කොමසාරිස් තුමා දුන් බව එතුමා දන්නේද? (ඉ) එම ප්‍රතිඥව නිසා සමහරෙක් වෙන රැකියා වන් අතහැර මෙම සේවයට බැඳුණු බව එතුමා දන්නේද? (ඊ) ඔවුන්ට වාර්ෂික වැටුපක් නියම කිරීමටත් සේවය ස්ථිර කිරීමටත් එතුමා ක්‍රියාකරන්නේද? (උ) නො එසේනම්, මන්ද?

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட விஞ: (அ) கொலொன்னுவ தேர்தற் ெருகுதியிலுள்ள ஊறுகொடவத்தையில் அமைந்துள்ள கைத்தொழிற் பயிற்சி நிலையத் தின் செயல்முறை காட்டுவோர் இருபது பேர் களில் ஒவ்வொருவருக்கும் வழங்கப்படும் வேதனம் யாது? (ஆ) அவர்கள் சேவையில் சேர்ந்து ஆறுமாதங்கழிந்ததும் வருட வேத னம் வழங்குவதாக இதன் பொறுப்பை ஏற் றுள்ள உதவி ஆணையாளர் வாக்குறுதியளித் துள்ளதை அவர் அறிவாரா? (இ) இந்த வாக்குறுதியின் காரணமாக சிலர் பிறதொழில் களை விட்டுவிட்டு இச்சேவையில் சேர்ந்தார் கள் என்பதை அவர் அறிவாரா? (ஈ) அவர்க ளுக்கு வருட வேதனத்தை ஏற்படுத்தவும், அவர்களின் சேவையை நிரந்தரமாக்கவும் அவர் ஆவனசெய்வாரா? (உ) இல்லையெனில், ஏன்?

asked the Minister of Labour and Employment: (*a*) What is the salary of each of the twenty Demonstrators attached to the Technical Training Centre at Urugodawatte in the Kolonnawa electorate? (*b*) Is he aware that at the time of their recruitment the assistant Commissioner concerned had given an undertaking that after six months they would be placed on an annual scale of salary? (*c*) Is he aware that some of them left other posts to join this service in view of this undertaking? (*d*) Will he take action to grant them an annual scale of salary and permanent status? (*e*) If not, why?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) ඌරුගොඩවත්තේ ප්‍රධාන වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානයට ප්‍රදර්ශකයන් 8 දෙනෙක් පමණක් පත් කරන ලදී. එක් ප්‍රදර්ශකයකු හට දිනකට (සියළු දීමනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇතුළුව) රු. 3.50 බැගින් ගෙවනු ලැබේ. (ආ) නැත. (ඉ) ඉහළ (ආ) හට දී ඇති පිළිතුරු අනුව පැණ නගින්නේ නැත. (ඊ) මධ්‍යස්ථානයේ සේවයේ නියුක්ත උපදේශකයන් පත් කරන්නාසේම, වාර්ෂිකව ගිවිසුම අළුත්වැඩියා කෙරෙන කොන්ත්‍රාත්තු පදනමක් මත ඔවුන් මාසික වැටුපක් මත තැබීම්වස් භාණ්ඩාගාරය සමඟ ක්‍රියාකරගෙන යනු ලැබේ. (උ) ඉහළ (ඊ) හට දී ඇති පිළිතුර අනුව පැනනගින්නේ නැත.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

භාණ්ඩාගාරය සමග කරන සාකච්ඡාව කවදා අවසාන වේවි ද? හුඟ කාලයක් තිස්සේ මේ ගැන සාකච්ඡා කරන නිසායි මා එසේ ඇසුවේ. මුදල් වෙන් කර තිබෙන බව වැය වාර්තාව අනුව පෙනෙනවා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

වැය වාර්තාවෙන් මුදල් වෙන් වුණාට මොකද තවම භාණ්ඩාගාරයෙන් අවසරය ලැබී නැහැ. එය ලැබුණු වහාම ක්‍රියා කරනවා.

**රාජ්‍ය භාෂාව: භාණ්ඩාගාරයේ උපදෙස්**
*அரசகரும மொழி : திறைசேரி அறிவுறுத்துரை*
**OFFICIAL LANGUAGE: TREASURY INSTRUCTIONS**

3. **ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වර්තමාන ආණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ සේවකයන්ට භාණ්ඩාගාරය මගින් නිකුත් කර ඇති උපදෙස් මාලාව ඉදිරිපත් කරන්නේද? (ආ) නො එසේනම්, මන්ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) தற்போதைய அரசாங்கத்தின் அரசகரும மொழிக் கொள்கையை அமுல் நடத்துவது சம்பந்தமாக அரசாங்க ஊழியர்களுக்கு திறைசேரியினால் வெளியிடப்பட்டுள்ள அறிவுறுத்துரைகளைச் சமர்ப்பிப்பாரா? (ஆ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Finance: (*a*) Will he table the instructions issued by the Treasury to Public Servants on the implementation of the Government's official language policy? (*b*) If not, why?

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(අ) අදාල උපදෙස් අඩංගු භාණ්ඩාගාර චක්‍රලේඛන මේ සමග ඉදිරිපත් කරමි. (ආ) පැන නොනඟී.

**සභාමේසය මත තබන ලද චක්‍රලේඛන මෙසේයි:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட சுற்றறிக்கைகள் வருமாறு :*
*The circulars tabled are as follows:*

**686 වැනි අංකය දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය**

අංකය: 2/9/156/31 (එච්)
1966 මාර්තු මස 26 වැනි ද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

සියළුම ස්ථිර ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

**1966 දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) නියෝග**

අංක: 14,653 සහ 1966.2.3 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කර ඇති 1958 අංක 28 දරණ දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවන ලද, මෙහි පහත නැවත දක්වා ඇති නියෝග වලට ඔබේ අවධානය යොමු කරවනු ලැබේ. එනම්:—

(1) මේ නියෝග 1966 දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) නියෝග යනුවෙන් හැඳින් විය හැකි ය.

(2) ලංකාවේ එක ම රාජ්‍ය භාෂාව සිංහල විය යුතු යයි ප්‍රකාශ කළ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ ක්‍රියාකාරිත්වයට හානියක් නො වන පරිදි—

(අ) උතුරු හා නැගෙනහිර පළාත්වල, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක වුව ද, රජයේ නීතිගත සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක වුව ද, නැත හොත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් විසින් වුව ද රජයේ නීතිගත සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් වුව ද කරනු ලබන සියලු ම ආණ්ඩුවේ හා පොදු කටයුතු ඉෂ්ට කිරීම හා පොදු වාර්තා පවත්වා ගෙන යාම සඳහා ද;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

(ආ) ස්වකීය නිල කටයුතුවල දී නිලධරයන් හැර, දෙමළ භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ තැනැත්තන් හා නිල කටයුතු වල දී යම් නිලධරයකු අතර හෝ දෙමළ භාෂාවෙන් කටයුතු කරන උතුරු හා නැගෙනහිර පළාත්වල යම් ප්‍රාදේශීය බල මණ්ඩලයක් හා නිල කටයුතුවල දී යම් නිලධරයකු අතර සියලු ම ලිපි ගනුදෙනු සඳහා ද,

දෙමළ භාෂාවත් පාවිච්චි කළ යුතු ය.

(3) 1958 අංක 28 දරණ දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනතෙහි ප්‍රතිපත්ති හා විධිවිධාන ද මේ නියෝග ද සම්පූර්ණයෙන් බලයෙහි හා ක්‍රියාවෙහි යෙදවීම පිණිස, සියලු ම ආඥාපනත් සහ පනත් ද යම් ලිඛිත නීතියක් යටතෙහි පනවනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ සියලු ම ආඥා, ප්‍රකාශන, ව්‍යවස්ථා අතුරු ව්‍යවස්ථා, නියෝග හා නිවේදන, ආණ්ඩුවේ ගැසට් පත්‍රය හා ආණ්ඩුව විසින්, රජයේ නීතිගත සංස්ථා විසින් හෝ ව්‍යවස්ථාපිත ආයතන විසින් නිකුත් කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන වෙනත් සියලු ම නිල ප්‍රකාශන, චක්‍රලේඛ හා ආකෘති ද දෙමළ භාෂාවටත් පරිවර්තනය කොට ප්‍රසිද්ධ කළ යුතු ය.

2. ඔබ අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි සහ ඔබ ආමාත්‍යාංශය යටතේ ඇති සංස්ථා සහ රජයේ ආයතන වල ද මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම වග බලාගැනීමට අවශ්‍ය පියවර ගනු මැනවි.

3. රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවල ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් මාරු කිරීමට අවශ්‍ය වූ විට පළමු කොට එය දෙපාර්තමේන්තුව තුළ ම කර ගත යුතු ය. එසේ කර ගත නොහැකි වූ විට, අමාත්‍යාංශය යටතේ ඇති දෙපාතර්මේන්තු අතර මාරු කර ගත යුතු ය. අමාත්‍යාංශයෙන් පිටතට නිලධාරීන් මාරු නො කොට කාය්‍යී මණ්ඩලය සකස් කර ගත නො හැකි බව පෙනී ගිය හොත්, අමාත්‍යාංශයෙන් පිටතට මාරු කළ යුතු නිලධාරීන් පිළිබඳ සම්පූර්ණ විස්තර, ඔවුන්ගේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා දැනීම සඳහන් කරමින්, භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් වෙත වාර්තා කළ යුතු ය. මාරු කරනු ලබන නිලධාරීන් වෙනුවට වෙනත් නිලධාරීන් ඉල්ලා සිටින විට, එම නිලධාරීන් ගෙන් අපේක්ෂා කරන සිංහල සහ/හෝ දෙමළ ප්‍රවීණතා වද සඳහන් කළ යුතුය.

හෙ. ජිනදාස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

වාචික පිළිතුරු

**අංක 700 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය**

අංකය : 2/9/156/26 (එච්).
මහා භාණ්ඩාගාරය,
කොළඹ,
1966 සැප්තැම්බර් 4 වැනි දින.

සියළු ම ස්ථිර ලේකම්වරුන් හා දෙපාතර්මේන්තු ප්‍රධානීන් වෙත ය.

**රජයේ සේවකයෝ (ආදි ප්‍රවේශක නිලධාරීහු) සහ රාජ්‍ය භාෂාව**

කැබිනට් මණ්ඩලයේ ලේකම්ගේ අංක කැ.ප.අ. 36/65 හා 1965 ජූලි 27 වැනි දින දරණ ලිපියෙහි අඩංගු රජයේ සේවකයෝ හා රාජ්‍ය භාෂාව පිළිබඳ රජයේ තීරණ අනුව, රජයේ සේවයේ නියුක්ත ආදි ප්‍රවේශක නිලධාරීන්ගේ තත්ත්වය සමාලෝචනය කරන ලදුව එය සාමාන්‍ය ඇනගැනීම සඳහාත්, ඒ අනුව කටයුතු කිරීම සඳහාත් පහත දැක්වේ. මෙම තීරණ අනුව, මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල වීමේත්, එම භාෂාව රජයේ ලියකියවිලිවල භාෂා මාධ්‍යය වීමෙහිත් කිසිදු අන්දමක වෙනසක් නොවන බව මෙහි ලා සඳහන් කරනු ලැබේ. මේ දක්වා සිංහල භාෂාවෙන් ස්වකීය රාජකාරි කටයුතු කරගෙන ගිය ආදි ප්‍රවේශක නිලධාරීන් තමන්ට හැකි සෑම ශක්තියක්ම යොදා එම භාෂා මාධ්‍යයෙන් ම ස්වකීය රාජකාරි කටයුතු දිගටම කරගෙන යනු ඇතැයි ද, එමෙන් ම පරිපාලන කටයුතුවල පමා වීමක් හෝ අවුල් වීමක් හෝ ඇති නොවන පරිදි රාජකාරි කට යුතු කරගෙන යනු වස් අවශ්‍ය රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නොලැබූ නිලධාරීන්හට උද්‍යොගිමත්ව සෑම සහනයක්ම දෙනු ඇතැයි ද රජය උදක් ම බලාපොරොත්තු වෙයි.

2. (අ) **ආදි ප්‍රවේශක නිලධාරීන්ගේ බැඳීම්.**—ස්වකීය රාජකාරි කටයුතු සඳහා සිංහල භාෂාව භාවිතා කළ යුතු යයි ආදි ප්‍රවේශක නිලධාරීන්ට බල නොකළ යුතු ය. කෙසේ වුව ද, ඇතැම් අවස්ථාවල දී මෙම නිලධාරීන්ගෙන් සමහරෙක් ස්වකීය බඳවා ගැනීමේ මාධ්‍යයට අන්‍ය වූ මාධ්‍යයකින් රාජකාරි කටයුතු කිරීමට බැඳී සිටින්නට පුළුවන. (වැඩි විස්තර සඳහා මෙම චක්‍ර ලේඛයේ උප ලේඛනය බලන්න.)

(ආ) **විශ්‍රාම ගැන්වීමේ ක්‍රමය.**—(i) පහත දැක්වෙන (ii) වැනි උපඡේදයේ සඳහන් ආදි ප්‍රවේශක නිලධාරීන් හැර සෙසු නිලධාරීන්ට විශ්‍රාම ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට අවසර දිය හැක. විශ්‍රාම ගැනීමට ඔවුනට අවසර දුනහොත් සෞඛ්‍ය හේතූන් උඩ ඔවුන් විශ්‍රාම ගත්තේ නම්, ඔවුනට ලැබෙන විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ ඔවුනට ලබාගැනීමට හිමිකම් ලැබෙනු විනා රැකියාව නැතිවී යෑමේ හේතුවෙන් වන්දියක් ලැබීමට හිමිකමක් නැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ii) පහත සඳහන් වර්ගවලට අයත් නිලධාරීන්ට ඉහත කී අනුග්‍රහය හිමි නොවේ :—

(අ) සිංහල ප්‍රවීණත්වය උඩ බඳවා ගනු ලැබූ අය (එනම්, පත්වීම් ලැබීම සඳහා සිංහල දැනුම අත්‍යාවශ්‍ය සුදුසුකමක් හැටියට සලකනු ලැබූ අය.) ;

(ආ) සිංහල මාධ්‍යයෙන් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබූවන් හෝ සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබූ විභාගයකින් රජයේ සේවයට බඳවා ගනු ලැබූවන් ;

(ඇ) 1957 මැයි 23 වැනි දින අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සිංහල ප්‍රවීණත්වය ලබා ගැනීම නිසා ප්‍රදානය කළ ප්‍රසාද මුදල ලැබූවන් ;

(ඈ) සුළු සේවක ශ්‍රෙණිවලට අයත් වූවන් ;

(ඉ) 1949 සැප්තැම්බර් 21 වැනි දින අංක 246 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය හෝ ඉන් අනතුරුව නිකුත් කළ චක්‍රලේඛයක් අනුව හෝ නිශ්චිත කාලයක් තුළ සේවය කිරීමට ඇප ඔප්පුවකට හෝ ගිවිසුමකට හෝ බැඳී ඇත්තවුන් හෝ බැඳීමට අවශ්‍ය වූවන් හෝ එසේ බැඳී ඇති සේවා කාලය අවසන් වන තෙක් හෝ, 1956 පෙබරවාරි 23 වැනි දින අංක 298 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ දක්වා ඇති ප්‍රතිපත්ති වලට අනුව ඇප ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් හෝ නිදහස් කර නොමැති අය.

(iii) විශ්‍රාම ගැනීමට ඉල්ලුම් කරන නිලධාරියකු, තමාට සිංහලෙන් රාජකාරි කටයුතු කිරීමට නොහැකි බැවින් රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට රිසි බව සඳහන් ලිඛිත ප්‍රකාශයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත සැපයිය යුතු ය. තමාගේ විශ්‍රාම ගැනීමේ අද්ධ්‍යාශය පිළිබඳ ව තුන් මසක දැන්වීමක් දෙපාර්තමේන්තු ප්‍රධානියාට දිය යුතු ය. දෙපාර්ත මේන්තු ප්‍රධානියකු තම් එබඳු දැන්වීමක් ස්ථිර ලේකම්ට කළ යුතු ය. මෙම ප්‍රකාශයත් හා විශ්‍රාම ගැනීමේ දැන්වීම් සිය ස්ථිර ලේකම් මඟින් භාණ්ඩා ගාරයේ ලේකම් වෙත යැවීම දෙපාතර්මේන්තු ප්‍රධානියාගේ වගකීම වේ.

(iv) විශ්‍රාම ගැනීමේ දැන්වීම ඉදිරිපත් කරන විට ඉහත (i) උප ඡේදයෙහි විධිවිධානයන් අනුව නිලධාරියා විශ්‍රාම ගැනීමේ අවසරය ඉල්ලීමට සුදුස්සෙක් ද යන්නත් නිලධාරියාගේ සේවය රජයට අවශ්‍යවීම නිසා හෝ ඔහුට විරුද්ධව විනයානුකූල ව කටයුතු කිරීමට තිබීමේ හෝ විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇත්නම් එම හේතුව නිසා හෝ විශ්‍රාම ගැනීමට ඉල්වන අවසරය ප්‍රතික්ෂෙප කළ යුතු ද යන්නත් ගැන දෙපාර්තනේතු ප්‍රධානියා විසින් සඳහන් කළ යුතු ය. විශ්‍රාම ගැනීමට අවසර දිය යුතු ද, නැද්ද යන්න භාණ්ඩාගාරයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. අවසරය දුනහොත් නිලධාරියා විශ්‍රාම ගැන්විය හැකි බලධාරියා වෙත ඔහුගේ ඉල්ලුම් පත ඉදිරිපත් කරනු ලැබේ. (1964 ජූනි 25 වැනි දින අංක 648 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විවිධ වර්ගවලට අයිති නිලධාරීන් විශ්‍රාම ගැන්විය හැකි බලධාරියා කවරෙක් දැයි දැක්වේ.)

(v) ලංකා අධිකරණ සේවයේ නිලධාරීන්ට, ගම් බඳ උසාවිවල සභාපතිවරුන්ට හා පළාත් පාලන සේවයේ නිලධාරීන්ට මෙම නියමයන් අදාල නොවේ.

**(ඇ) අනිවාර්‍යයෙන් විශ්‍රාම ගැන්වීම්.**—සිංහල ප්‍රවීණතාවය නොමැතිවීම නිසා නිකුත් කර ඇති විශ්‍රාම ගැන්වීමේ නියෝග ලබා සිටින වයස අවුරුදු 55ක් (වෛකල්පික විශ්‍රාම ගැනීමේ වයස) නොවූ ආදි ප්‍රවේශක නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ නියෝග ඉවත් කර ඔවුන්ට සේවයේ රැඳී සිටීමට ඉඩ දිය යුතුය.

**(ඈ) වයස අවුරුදු 55න් (වෛකල්පික විශ්‍රාම ගැනීමේ වයස) ඔබ්බට සේවා කාලය දීර්ඝ කිරීම.**—විශ්‍රාම ගැනීමේ වෛකල්පික වයස් සීමාව වන අවුරුදු 55න් ඔබ්බට නිලධාරියෙකු ගේ සේවය දීර්ඝ කිරීමට තීරණය කිරීමේ දී රාජ්‍ය භාෂාව පිළිබඳ ඔහුගේ දැනීම සැලකිල්ලට ගනු ඇත.

**(ඉ) වැටුප් වැඩිවීම්.**—රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය ලබා නොගැනීමේ හේතුව උඩ ආදි ප්‍රවේශක නිලධා රීන්ගේ නවත්වා ඇති වැටුප් වැඩිවීම් ආපසු ගෙවා ඔවුන්ගේ වැටුප් ඒ අනුව සකස් කළ යුතු ය.

**(ඊ) උසස්වීම් හා ශිෂ්‍යත්ව.**—දැනට පවතින හෝ මතුවට ඇතිවන ඉහළ ශ්‍රෙණිවල ඇබෑර්තුවලට උසස් කිරීමේ දී ද ශිෂ්‍යත්ව සහ පුහුණුවීමේ පාඨමාලාවන් ආදිය සඳහා තෝරා ගැනීමේ දී ද නිලධාරීන්ගේ රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය ඒ සඳහා කලින් අවශ්‍ය වන සුදුසුකමක් නොවිය යුතු ය. දැනට ඇති ඇබෑර්තු ඇතිවූයේ මෙම චක්‍ර ලේඛය නිකුත් කිරීමේ දිනට කලින් දිනයක සිට වුව ද ඒ ඇබෑර්තු ඇති වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි 1105 වැනි මුදල් රෙගුලාසියේ විධිවිධානවලට යටත්ව ඒවා පිරවිය හැක.

සිංහල දැනීමක් නොමැති නිසා උසස්වීම් අහිමි වූ නිලධාරීන් ගැන 1954 ජූනි 14 වැනි දින අංක 170 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධානවලට යටත් ව, දැනටමත් උසස්වීම් දී ඇති අයට හානි යක් නොවන පරිදි, සමාලොචනයක් පැවැත්විය යුතු ය.

1963 මාර්තු 7 වැනි දින අංක 2/9/156/15/8 (එච්) දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපියට අනුව ආදි ප්‍රවේශක නිලධාරීන්ට කොන්දේසිවලට යටත් ව දෙන ලද උසස්වීම්, සාමාන්‍ය උසස්වීම් බවට හැරවිය යුතු ය.

**(උ) දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ හා කාර්‍යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව).**—දැනට බලපවත්වන බඳවා ගැනීමේ පරිපාටිවලට අනුව පවත්වනු ලබන දෙපාර්තමේන්තුගත විභාග, ආදි ප්‍රවේශක නිලධාරීන් සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ම පැවැත්වෙනු ඇත. කෙසේ වුව ද, ස්වකීය මනාපය පරිදි, ඉංග්‍රීසි මාධ්‍යය වෙනුවට සිංහල මාධ්‍යයෙන් එම විභාගවලට පෙනී සිටීමට ඔවුනට ඉඩ දිය හැක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සටහන.— ආදි ප්‍රවේශක ' යන්න අදාළ වන්නේ 1956 සැප්තැම්බර් 24 වැනි දිනට ප්‍රථම, පළමු වරට රජයේ සේවයේ පත්වීමක් ලැබූ අයෙකු හට හෝ පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් ලැබූ අයෙකු හටය.

3. පහත සඳහන් චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ :—

(1) 1958 ජනවාරි 18 වැනි දින අංක 425 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.

(2) 1958 පෙබරවාරි 12 වැනි දින අංක 430 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.

(3) 1963 මාර්තු 7 වැනි දින අංක 2/9/156/15/8 (එච්) දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය.

(4) 1963 ඔක්තෝබර් 18 වැනි දින අංක 620 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.

(5) 1963 ඔක්තෝබර් 18 වැනි දින අංක 621 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.

(6) 1964 පෙබරවාරි 26 වැනි දින අංක 638 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය.

4. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු ඔබේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නියුක්ත සියලු ම ආදි ප්‍රවේශක නිලධාරීන්ට දන්වනු මැනවි. තවද, මෙය ඔබේ අමාත්‍යාංශය යටතේ ඇති සංස්ථාවන් වෙතට ද පමුණුවන්න.

5. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

හෙ. ජිනදස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

**උපලේඛනය**

[චක්‍රලේඛයේ 2 (අ) ඡේදය බලන්න.]

සේවයට බඳවා ගනු ලැබූ භාෂා මාධ්‍යය හැර වෙනත් මාධ්‍යයකින් රාජකාරි කටයුතු කිරීමේ දී ආදි ප්‍රවේශක නිලධාරීන්ගේ බැඳීම් පහත විස්තර වේ :—

(i) සිංහල මාධ්‍යයෙන් හෝ අන්‍ය මාධ්‍යයකින් හෝ පවත්වන ලද විභාගයකින් ඔවුනොවුන්ගේ සිංහල දැනුම සලකා රජයේ සේවයට බඳවාගනු ලැබූ හෝ අන්තර්ග්‍රහණය කරනු ලැබූ හෝ ශ්‍රෙණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීහු ඔවුන්ට නියම කරන අන්දමකට සිංහලෙන් රාජකාරි කටයුතු කිරීමට බැඳී සිටිති.

(ii) එමෙන් ම, දෙමළ හෝ ඉංග්‍රීසි හෝ අන්‍ය මාධ්‍යයකින් පවත්වන ලද විභාගයකින් ඔවුනොවුන්ගේ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාමය දැනුම සලකා රජයේ සේවයට බඳවා ගනු ලැබූ හෝ අන්තර්ග්‍රහණය කරනු ලැබූ හෝ ශ්‍රෙණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීහු අවශ්‍ය වූ විට ඕනෑ ම අවස්ථාවක එම භාෂාවෙන් රාජකාරි කටයුතු කළ යුතුය.

වාචික පිළිතුරු

(iii) සිංහල සහ/හෝ දෙමළ භාෂාවන් පිළිබඳ සුදුසුකම් ලැබීමේ නියමිත දැනුමක් ලබාගත යුතුව ඇති ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද විභාගයකින් රජයේ සේවයට බඳවා ගනු ලැබූ හෝ ශ්‍රෙණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීහු, තමන් එම භාෂාවන් පිළිබඳ ලැබූ ප්‍රවීණතාවයට සරිලන මට්ටමේ ඕනෑම රාජකාරි කටයුත්තක් ඉටු කිරීමට යටත් පිරිසෙයින් තමා ලද සිංහල සහ/හෝ දෙමළ භාෂා ප්‍රවීණත්වයට සමාන දැනුමකින් යුක්තව සිටිය යුතු ය.

(iv) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සුදුසුකම් ලැබීමේ නියමිත දැනුමක් ලබාගත යුතුව ඇති සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් පවත්වන ලද විභාගයකින් රජයේ සේවයට බඳවා ගනු ලැබූ හෝ ශ්‍රෙණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීන්ට යටත් පිරිසෙයින් තමන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලැබූ ප්‍රවීණත්වයට සරිලන මට්ටමේ ඕනෑ ම රාජකාරි කටයුත්තක් ඉටු කිරීමට පුළුවන් විය යුතු ය.

(v) භාෂාවක් පිළිබඳ ප්‍රවීණත්වය නිලධාරියකුගේ පත්වීමක් සඳහා අවශ්‍ය සුදුසුකමක් විය යුතු හෝ පසු කලක දී ලබා ගත යුතු වූ හෝ අවස්ථාවල දී එවැනි නිලධාරියකු එම භාෂාවෙන් ඕනෑ ම රාජකාරි කටයුත්තක් කිරීම අවශ්‍ය වේ.

(vi) සිංහල සහ/හෝ දෙමළ භාෂාව පිළිබඳ කථා ව්‍යවහාර දැනුමක් හෝ වැඩ කිරීමේ දැනුමක් හෝ පත්වීමක් ලැබීමට අවශ්‍ය සුදුසුකමක් විය යුතු හෝ පසු කලක දී ලබාගත යුතු හෝ අවස්ථාවල දී, යටත් පිරිසෙයින් නිලධාරීන් විසින් එම භාෂාවන් පිළිබඳ එම දැනුමවත් දිගට ම පවත්වාගෙන යා යුතු වේ.

(vii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ කථා ව්‍යවහාර දැනුමක් හෝ වැඩ කිරීමේ දැනුමක් හෝ පත්වීමක් ලැබීමට අවශ්‍ය සුදුසුකමක් විය යුතු හෝ පසු කලක දී ලබාගත යුතු හෝ අවස්ථාවල දී, යටත් පිරිසෙයින් නිලධාරීන් විසින් එම භාෂාව පිළිබඳ එම දැනුමවත් දිගට ම පවත්වාගෙන යා යුතු වේ.

(viii) කිසියම් ප්‍රදේශයක සේවය කිරීමට එම ප්‍රදේශයේ භාෂාවේ ප්‍රවීණත්වය සලකා සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන් ස්වකීය රාජකාරි කටයුතු එම භාෂාවෙන් කළ යුතු යයි අපේක්ෂා කෙරේ.

(ix) ඔවුනොවුන්ගේ සෙසු සුදුසුකම්වලට අමතර ව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් රුස්වීම් ඇමතීමේ හැකියාව ගැන සලකා සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන්, එම භාෂාවන් පිළිබඳ එකී හැකියාව එසේ ම පවත්වා ගත යුතු යයි අපේක්ෂා කෙරේ.

(x) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලඝුලේඛනය සහ යතුරු ලිවීම සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් අවශ්‍ය වුවහොත් එම භාෂාවෙන් එකී රාජකාරි ඉටු කළ යුතු ය.

(xi) සිංහල හැර අන්‍ය මාධ්‍යයකින් ලඝු ලේඛන කටයුතු සඳහා බඳවා ගෙන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් සිංහල ලඝු ලේඛනය පිළිබඳ පුහුණුවක් ලැබූ නිලධාරීන් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක සිංහලෙන් ලඝුලේඛන කටයුතුවල නිරත විය යුතු ය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(xii) සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ දෙපාර්තමේන්තුගත යතුරු ලිවීමේ පරීක්ෂණයන්ගෙන් සමත් වූ නිලධාරීන් හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් සිංහල හෝ දෙමළ යතුරු ලිවීම පිළිබඳ පුහුණුවක් ලැබූ නිලධාරීන් හෝ අවශ්‍ය වූ ඕනෑ ම විටක තමතමන්ට අනුකූලවන අන්දමට සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ යතුරු ලිවීමේ කටයුතුවල නිරත විය යුතු ය.

(xiii) රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය පිළිබඳ ප්‍රසාද මුදල ලැබූ සෑම නිලධාරියෙක්ම තමාගේ සියළුම රාජකාරි ලියකියවිලි හා සටහන් ලිවීම සිංහලෙන් කළ යුතු යයි නියම කරුණු ලැබූ සෑම විටක ම එසේ කළ යුතු ය. අවශ්‍ය වුවහොත් ඔවුන් විසින් රාජකාරි ලියකියවිලිවල සිංහලෙන් ලියන ලද සියළු ම සටහන්වල සාරාංශයක් ඉංග්‍රීසියෙන් දිය යුතු ය.

**අංක 701 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය**

අංකය : 2/9/156/26 (එච්).
මහා භාණ්ඩාගාරය.
කොළඹ.
1966 සැප්තැම්බර් 4වැනි දින.

සියළුම ස්ථිර ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

**රජයේ සේවකයෝ (නව ප්‍රවේශක නිලධාරීහු) සහ රාජ්‍ය භාෂාව—**
**බඳවා ගැනීම හා සේවා කොන්දේසි**

කැබිනට් මණ්ඩලයේ ලේකම් ගේ අංක කැ.ප.අ. 36/65 හා 1965 ජූලි 27 වැනි දින දරණ ලිපියෙහි අඩංගු රජයේ සේවකයන් සහ රාජ්‍ය භාෂාව පිළිබඳ රජයේ තීරණයන් අනුව රජයේ සේවයට නව ප්‍රවේශකයින් බඳවා ගැනීම සහ ඔවුන්ගේ සේවා කොන්දේසි පිළිබඳ ව ගනු ලැබූ තීරණයන් සාමාන්‍ය දැනගැනීම සඳහාත් ඒ අනුව ක්‍රියා කිරීම සඳහාත් පහත දැක්වේ.

2. (අ) **බඳවා ගැනීම සඳහා පවත්වන විභාගයේ මාධ්‍යය**

රජයේ සේවයේ ඕනෑම ශ්‍රේණියකට ඇතුළත් වීමට පවත්වනු ලබන කිසියම් තරඟ පරීක්ෂණයක් වෙතොත්, එවැනි පරීක්ෂණයකට පෙනී සිටීමට සුදුසුකම් ලැබීම සඳහා තමා සමත්වී ඇති විභාගයේ මාධ්‍යයෙන් ම එම තරඟ පරීක්ෂණයට පෙනී සිටීමට සෑම විභාගාපේක්ෂකයෙකුට ම අවසර දිය යුතු ය. කෙසේ වුවද, සිය මනාපය අනුව සෑම අපේක්ෂකයෙකුටම රාජ්‍ය භාෂාවෙන් එම පරීක්ෂණයට පෙනී සිටීමට අයිතියක් තිබේ.

**(ආ) නව ප්‍රවේශකයින්ගේ සේවා කොන්දේසි**

(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂණ කාලය, කිසියම් තනතුරක් සම්බන්ධයෙන් වඩාත් දීර්ඝ කාලයක් නියම කළහොත් විනා, නැතිනම් අවුරුදු තුනක් විය යුතු ය.

**සටහන.**—රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ‘ නව ප්‍රවේශක ’ යන්න අදාළ වන්නේ 1956 සැප්තැම්බර් 24 වැනි දින හෝ ඉන් පසුව හෝ පළමු වරට රජයේ සේවයේ පත්වීමක් ලැබූ “ ආදී ප්‍රවේශකයකු ” ලෙස නොගැනෙන නිලධාරියෙකුහටය.

(ii) 1965 ජූලි 1 වැනි දිනට පසු රජයේ සේවයට බැඳෙන සියලුම නව ප්‍රවේශක නිලධාරීන්, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පවත්නා සියළු ම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුයි.

(iii) (අ) සිය රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා රාජ්‍ය භාෂා දැනුමක් අනවශ්‍ය විශේෂ අය හැර, අන් නිලධාරීන් සිය ආධුනික/පරීක්ෂණ කාලය තුළ දී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂණ කාලය අවසානයේ දී ඔවුන් සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ ඊට අදාල අනෙකුත් කරුණු අතර නියමිත සිංහල පරීක්ෂණවලින් සමත් වීම මතය.

| පරීක්ෂණයේ ප්‍රමාණය | පරීක්ෂණය සමත් වීම සඳහා ඉඩදී ඇති කාල සීමාව |
|---|---|
| I වැනි ශ්‍රේණියේ (තුන්වැනි ප්‍රමාණයේ) ප්‍රවීණතා පරීක්ෂණය | අවු. 1යි |
| II වැනි ශ්‍රේණියේ (පස්වැනි ප්‍රමාණයේ) ප්‍රවීණතා පරීක්ෂණය | අවු. 2යි |
| III වැනි ශ්‍රේණියේ (කණිෂ්ඨ පාඨශාලා) සහතික පත්‍ර විභාග ප්‍රමාණයේ ප්‍රවීණතා පරීක්ෂණය | අවු. 3යි |

ප්‍රවීණතා පරීක්ෂණ, පාලන කටයුතු රාජ්‍ය භාෂාවෙන් කිරීමට අවශ්‍ය උවමනාකම්වලට සරිලන, පාණ්ඩිත්‍යයෙන් තොර වූ, යථායෝග්‍ය ආකාර පරීක්ෂණ වනු ඇත. අවශ්‍ය රාජ්‍ය භාෂා දැනුමක් ලබා ගැනීම පිණිස නිලධාරීන්ට පහසුකම් සලස්වනු ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

පහත දැක්වෙන 2(ඈ) ඡේදයේ සඳහන් අය සම්බන්ධයෙන් හැර, මෙම ප්‍රවීණතා පරීක්‍ෂණ එකින් එක සමත් වීම සඳහා දී ඇති කාලය, පත් වීමේ දින පටන් ගණින් ගැනේ.

**සටහන.**—(1) රජයේ සේවයට බඳවා ගැනීම සඳහා 8 වැනි ප්‍රමාණයට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකමක් අවශ්‍ය නොවන සුළු හා යටත් ශ්‍රේණිවලට අයත් වූවන්, සේවයේ ස්ථිර කිරීමේ අවශ්‍යතාවයක් ලෙස II වැනි ශ්‍රේණියට වඩා උසස් ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම අවශ්‍ය නොවේ. මේ කරුණ සම්බන්ධයෙන් යමක් පැහැදිලි කර ගැනීටම අවශ්‍ය වූ විට ඒ ගැන රාජ්‍ය භාෂා කොමසාරිස්ගෙන් විමසිය යුතු ය.

(2) පහත දැක්වෙන වර්ගවලට අයත් නිලධාරීන්, සේවයේ ස්ථිර කිරීමේ අවශ්‍යතාවයක් ලෙස ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමෙන් නිදහස් කරනු ඇත :—

(අ) රජයේ සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය ;

(ආ) අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිවල අධ්‍යාපන සුදුසුකම් නියම කොට නොමැති සුළු ශ්‍රේණිවලට අයත් අය සහ රාජකාරි කටයුතු කාර්යක්‍ෂම අන්දමින් ඉටු කිරීම සඳහා භාෂා ඥානයක් අවශ්‍ය නොවන, සුළු ශ්‍රේණිවලට අයත් අය.

[ඉහත දැක්වෙන 2(ආ) (i) දරණ ඡේදයේ නියමයන් ගැන නොතකා පත් වීම දෙන බල ධාරියාගේ අභිමතය පරිදි මෙම වර්ගයට අයත් නිලධාරීන්ගේ ආධුනික/පරීක්‍ෂණ කාල ය නියම කළ හැකි වේ.]

**සටහන.**—(3) දැනටමත් සිංහල ප්‍රවීණතාවය ලබාගෙන ඇති, 1964 මාර්තු 23 වැනි දින අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ අඩංගු උපලේඛනයට අනුව සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණවලින් නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබාඇති අය ප්‍රවීණතා පරීක්‍ෂණවලින් නිදහස් කර ගැනීම සඳහා නියමිත බලධාරියා වෙත ඉල්ලුම් කළ යුතුය. මෙම නිදහස් කිරීම සඳහා බලයලත් නිලධාරීන්, 1964 නොවැම්බර් 26 වැනි දින අංක "ජී" 44 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපියේ දක්වා ඇති පරිදි වේ.

(iv) (අ) පරීක්ෂණ තුනම සමත් විය යුතු නිලධාරියකු විසින් I වැනි, II වැනි හා III වැනි ශ්‍රේණිවල ප්‍රවීණතා පරීක්ෂණ හෝ මුල් පරීක්ෂණ දෙක පමණක් සමත් විය යුතු නිලධාරියකු විසින් I වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණය හෝ නියමිත කාලසීමාව තුළදී සමත් නොවුවහොත්, එය ඔහුගේ වැටුප් වැඩිවීම අත් හිටවීමට හේතු වේ. නියමිත කාලයෙන් පසු තවත් හය මසක් ගත වන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවුවහොත්, වැටුප් වැඩිවීම

වාචික පිළිතුරු

අත්හිටුවීම වැටුප් වැඩිවීම නැවැත්වීමක් බවට හැරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තුරු එම නැවැත් වීම බලපවත්වනු ඇත.

පරීක්‍ෂණයකින් සමත් වීමට ඉඩ දී ඇති කාලය තුළදී පරීක්‍ෂණයක් පවත්වනු නොලැබුවහොත්, නියමිත කාලය අවසන් වූ තැන් පටන්, පරීක්‍ෂණය පවත්වනු ලබන දිනය තෙක් නියමිත කාලය දීර්ඝ කළ සේ සැලකිය යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂණ කාලය අවසානයේ දී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත ප්‍රමාණයට එළඹීමට අසමත් වන නිලධාරීන් කෙරෙහි 120 සහ 121 වැනි පාලන රෙගුලාසිවල නියමයන් අදාළ වනු ඇත.

**(ඇ) 1956 සැප්තැම්බර් 24 වැනි දින සහ 1965 ජූනි 30 වැනි දින අතර පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්**

මෙතෙක් නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වී නොමැත්තා වූ ද ඒ හේතුකොටගෙන ස්වකීය තනතුරුවල ස්ථිර කර නොමැත්තා වූද නව ප්‍රවේශක නිලධාරීන්ගේ තත්ත්වය ගැන සලකා බලන ලදුව පහත දැක්වෙන තීරණවලට එළඹ ඇත. —

(i) 1965 ජූලි 1 වැනි දින සිට තවත් අවුරුදු තුනක් ඇතුළතදී ඔවුන් විසින් රාජ්‍ය භාෂාව වන සිංහල විෂයයෙහි ප්‍රවීණතාවය ලබාගත යුතුය. දැනටමත් අත්හිටුවා ඇති /නවතා ඇති කිසියම් වැටුප් වැඩිවීමක් වෙතොත් ඒවා ආපසු ගෙවනු නොලැබේ.

(ii) දීර්ඝ කරන ලද ආධුනික/පරීක්ෂණ කාලය අවසානයේ දී ඔවුන් සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ ඊට අදාළ අනෙකුත් කරුණු අතර ඉහත 2(ආ) (iii) (ආ) දරණ ඡේදයේ සඳහන් ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීම මතය. මෙම එක් එක් ප්‍රවීණතා පරීක්‍ෂණයෙන් සමත් වීමට ඉඩදෙන කාලය 1965 ජූලි 1 වැනි දින පටන් ගණින් ගනු ලැබේ.

(iii) (අ) මෙම නිලධාරීන්ගේ 1965 ජූලි 1 වැනි දිනට හා ඉන් පසුව එළඹෙන වැටුප් වැඩිවීම් සම්බන්ධයෙන් 2 (ආ) (iv) (අ) දරණ ඡේදයෙහි අඩංගු විධිවිධානයන් අදාළ වේ.

(ආ) දීර්ඝ කරන ලද ආධුනික/පරීක්ෂණ කාලය අවසානයේ දී නියමිත සිංහල ප්‍රවීණතාවය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන් කෙරෙහි 120 සහ 121 වැනි පාලන රෙගුලාසිවල නියමයන් අදාළ වනු ඇත.

(iv) සේවයේ ස්ථිර කිරීමට අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීමට නොහැකි වීම, ඒකාන්තයෙන්ම, සේවයේ ස්ථිර කිරීම සඳහා පැවැත්වෙන සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමත් වීමට නොහැකිවීම මිස වෙන අන් හේතුවක් නිසා නො වේ නම්, 121 වැනි පාලන රෙගුලාසියෙහි (2) වැනි විශේෂ නියමය යටතේ (වැටුප් වැඩිවීම් නැවැත්වීම විනා ප්‍රමාද කිරීමක් නොමැතිව) වරින් වර ප්‍රවීණතා පරීක්ෂණ සමත් වන දිනය දක්වා (අදාළ වන පරිදි II වැනි ශ්‍රෙණිය හෝ III වැනි ශ්‍රෙණිය) හෝ එවැනි පරීක්ෂණයක් සම්බන්ධයෙන් ඉඩ දී ඇති කාලය අවසාන වීමේ දිනය දක්වා හෝ යන දින දෙකින් පළමුව එළඹෙන දිනය දක්වා මෙම නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂණ කාලය දීර්ඝ කළ යුතුය.

(v) ඉහත සඳහන් 2(ඇ) (i) දරණ ඡේදය අනුව ඉඩ දෙන ලද වැඩිපුර කාලසීමාව තුළ දී සේවයේ ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සිංහල ප්‍රවීණතාවය ලබා ගන්නා නිලධාරීහු සේවයේ සථිර කිරීමටත් නවත්වන ලද වැටුප් වැඩිවීම්, එම වැටුප් වැඩිවීම් ලැබීමට නියමිතව තිබූ කාලයේ සිට ලැබීමටත් සුදුස්සෝ වෙති. ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අදාළ බලධාරියා විසින් නිගමනය කරනු ඇත.

(vi) සේවයේ සථිර කිරීමට අවශ්‍ය ප්‍රවීණතාවය, 1965 ජූලි 1 වැනි දිනට පෙර ලබාගෙන ඇති නිලධාරීන් ඔවුන්ගේ තනතුරුවල සථිර කළ යුතුය. සේවයේ සථිර කිරීම සඳහා අවශ්‍ය සිංහල ප්‍රවීණතා පරීක්ෂණය සමත් වූ දිනය දක්වා ඔවුන්ගේ ආධුනික/පරීක්ෂණ කාලය 121 වැනි පාලන රෙගුලාසියේ (1) වැනි විශේෂ නියමය යටතේ දීර්ඝ කළ යුතුය.

මේ බව නිලධාරීන්ට ලිපියකින් දැනුම් දිය යුතුය.

**(ඇ) තාවකාලික නිලධාරීන්**

(ආ) සහ (ඇ) උප ඡේදයන්හි විධිවිධානයන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව තාවකාලික නිලධාරීන් කෙරෙහි ද අදාළ වේ.

**3. විශේෂ අවස්ථා**

දෙමළ මාධ්‍ය ගුරුවරුන් ; දෙමළ මාධ්‍ය ගුවන් විදුලි ප්‍රකාශකයින්, දෙමළ මාධ්‍ය සංගීත ගුරුවරුන් සහ දෙමළ මාධ්‍ය ලඝු ලේඛකයින් ; විද්‍යාත්මක, වෛද්‍ය, ඉංජිනේරු හෝ වෙනත් කාර්මික පර්යේෂණාගාරයන්හි සේවයේ යෙදෙන පර්යේෂකයන් යන වර්ගවලට අයත් නව ප්‍රවේශක නිලධාරීන්ට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවේ. එනමුත්, අනිකුත් වෛද්‍යවරුන් ද, ඉංජිනේරුවරුන් ද, විද්‍යාඥයින් ද පාලන කටයුතු වල යෙදී නැත්නම් ඔවුන්ට II වැනි ශ්‍රේණියේ ප්‍රවීණතාවය ලබා ගැනීමට නියම කරනු ඇත. දෙමළ භාෂාව කථා කරන ආදායම් පාලක කොට්ඨාශවල සේවය පිණිස බඳවා ගෙන ඇති ග්‍රාම සේවකයින්ට සහ වෙනත් එවැනි සේවකයින්ට II වැනි ශ්‍රේණියේ ප්‍රවීණතාවය ලබා ගැනීමට නියම කරනු ඇත.

වාචික පිළිතුරු

**4. පත්වීම් ලිපි**

(i) 2 (ආ) දරණ ඡේදයේ සඳහන් තීරණයන් අනුව නව ප්‍රවේශක නිලධාරීන් වෙත නිකුත් කරන පත්වීම් ලිපිවල [2 (ආ) (iii) දරණ ඡේදයේ 2(ආ) දරණ සටහනේ සඳහන් නිලධාරීන් හැර] පහත දැක්වෙන කොන්දේසි අන්තර්ගත කළ යුතු ය:—

"(1) තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත/සථිර හා විශ්‍රාම වැටුප් රහිත, එකක් වන අතර, ඔබේ පත්වීම කලින් තීරණය කරනු ලැබුයේ නම් මිස, නැතිනම් ඔබ පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක් ගතවන තුරු ද, ඔබේ පත්වීම සථිර කොට ලිපියක් ලැබෙන තුරු ද, ඔබ ආධුනික/පරීක්ෂණ තත්ත්වයේ සිටිනු ඇත.

(2) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළු ම නීතිරීති හා ව්‍යවස්ථාවලටත්, මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය ඔබ පිළිගත යුතුයි".

(ii) දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ට නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල 2 (ආ) (iii) සහ (iv) දරණ ඡේදයන්හි තීරණයන් අඩංගු කළ යුතු ය.

(iii) දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගනු ලැබූ තාවකාලික නිලධාරීන්ට නිකුත් කරන පත්වීම් ලිපිවල ඔවුන්ගේ සේවය කලින් අවසන් කරනු ලැබුවේ නම් මිස නැත්නම් III වැනි ශ්‍රෙණියේ (හෝ අදාළ වන පරිදි II වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණය) ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත්වීමට ඔවුන්ට දී ඇති කාලයෙන් ඔබ්බට ඔවුන් සේවයේ තබා ගැනීම රඳා පවත්නේ එවැනි පරීක්ෂණයකින් ඔවුන් සමත්වීම මතය, යන්න ඇතුළත් කළ යුතුය. කෙසේ වුවද, මෙම පරීක්ෂණයෙන් සමත්වීම නිසාම ඔවුන්ට දිගටම සේවයේ සිටීමට ඉඩදෙනු ලැබේ යයි අදහස් නොකරන බව පැහැදිලිව ම පෙන්වා දිය යුතු ය.

**5. දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ සහ කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව)**

උසස් කිරීමේ විභාගවල මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් විභාගවල ද මාධ්‍යය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුල්වීමට පෙනී සිටි තරඟ විභාගයේ මාධ්‍යය හෝ රාජ්‍ය භාෂාව ය. තරඟ විභාගයක් නොමැති ව මුලින් ම සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවල මාධ්‍යය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය.

6. ඉහත 2(ආ) දරණ ඡේදයෙහි සඳහන් තීරණයන් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුලින් ම පළ කෙරෙන රජයේ සේවයේ තනතුරුවලට පත්වීම් දීමේදී අදාළ වන සාමාන්‍ය කොන්දේසිවල අඩංගු කරනු ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

7. මෙම චක්‍රලේඛයේ විධිවිධානයන් ලංකා අධිකරණ සේවයේ නිලධාරීන්ට, ගම්බද උසාවිවල සභා පතිවරුන්ට හා පළාත් පාලන සේවයේ නිලධාරීන්ට අදාළ නොවේ.

8. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය 1962 ජූලි 20 වැනි දින අංක 581 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අභිබවයි.

9. මෙම චක්‍ර ලේඛයේ අඩංගු කරුණු ඔබේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නියුක්ත සියළුම නව ප්‍රවේශක නිලධාරීන්ට දන්වනු මැනවි. තවද, මෙය ඔබේ අමාත්‍යාංශය යටතේ ඇති සංස්ථාවන් වෙතට ද පමුණුවන්න.

හෙ. ජිනදාස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

**භාණ්ඩාගාර චක්‍ර ලේඛය අංකය 753**

අංකය: 2/9/156/26/17/1 (එච්)
මහා භාණ්ඩාගාරය,
කොළඹ.
1968 ඔක්තෝබර් මස 23 වැනි දින.

සියළුම ස්ථිර ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1965 ජූලි මස 1 වැනි දිනට පෙර දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවා ගන්නා ලද "නව ප්‍රවේශක" නිලධාරීහු**

සිය පත්වීම්වල ස්ථිර කරනු ලැබීම සඳහා අවශ්‍ය සිංහල ප්‍රවීනතා පරීක්ෂණවලින් සමත් නොවී සිටි ඉහත සඳහන් ගණයට අයත් "නව ප්‍රවේශක" නිලධාරීන්ට එම පරීක්ෂණ වලින් සමත් වීම සඳහා 1965 ජූලි මස 1 වැනි දින සිට තුන් අවුරුදු කාලයක් දෙන ලද, 1966 සැප්තැම්බර් මස 4 වැනි දින අංක 701 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2(ඇ) වැනි ඡේදය කෙරෙහි අවධානය යොමු කරවමි.

2. 1968 ජූනි මස 30 වැනි දින දක්වා කිසිම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකට පෙනී නොසිටි නිලධාරීන්ගේ ආධුනික පත්වීම්, එක් ලිත් මාසයක දැනුම්දීමකින් අංක 701 දරණ චක්‍ර ලේඛයේ විධිවිධාන ප්‍රකාර නතර කළ යුතු බවට තීරණය කර තිබේ.

3. කෙසේ වෙතත්, සේවය නතර කරන බවට මෙවැනි දැන්වීම් ලද නිලධාරීන්ට, අවශ්‍ය සිංහල ප්‍රවීනතා පරීක්ෂණයන් සඳහා පෙනී නොසිටීම ගැන හේතු දක්වමින්, සේවය නතර කිරීමේ දැන්වීම ලැබුණු දින සිට සතියක් ඇතුළත මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ආයාචනයක් කළ හැකිය. එවැනි ආයාචනයන් වේනොත් ඒවා ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ/පත්වීම් දීමේ බලධාරීන්ගේ මාර්ගයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යැවිය යුතු වන අතර, එකී දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ බලධාරීන් විසින් හෝ එම ආයාචනයන් දෙපාර්තමේන්තුවට ලැබී සතියක් ඇතුළත, ඔවුන්ගේ නිරීක්ෂණ ද සමග රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළයුතු වේ. මෙසේ කරනු ලබන සෑම ආයාචනයකම ඉදිරි පිටපතක් ද කෙළින්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යැවිය යුතු ය. ඉහත සඳහන් කරන ලද නියමිත කාලසීමාවට පසුව කරනු ලබන ආයාචන සලකා බලනු නොලැබේ.

4. ප්‍රවීනතා පරීක්ෂණයකින්/පරීක්ෂණවලින් නිදහස් කරනු ලැබ සිටින නිලධාරීන් මෙම කාර්‍ය්‍ය සඳහා පරීක්ෂණයක් සඳහා පෙනී සිටි නිලධාරීන් ලෙස සැලකිය යුතු ය.

5. මෙම තීරණය වහාම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන, ක්‍රියා කරන ලද ආකාරය පිළිබඳ විස්තර ලේඛන ගත කිරීම සඳහා භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්ට වාර්තා කරනු මැනවි.

6. මෙම චක්‍ර ලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

හෙ. ජිනදාස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

**අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල මාර්ගෝපදේශකත්වය සඳහා කාර්‍ය්‍ය පරිපාටි සටහන**

**(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්වීම්.**—පත්වීම නතර කිරීමේ දැනුම්දීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එක් එක් නිලධාරියකු පිළිබඳව වෙනම වාර්තාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත අප්‍රමාදව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් පිළිබඳ වාර්තා යැවිය යුත්තේ, පිටපත් දෙකකින් යුක්තව, භාණ්ඩාගාරයේ ලේකම් මගිනි.

**(ආ) භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් විසින් කරනු ලබන පත්වීම් (කාර්‍ය්‍යාල සේවක සේවයේ I වැනි හා II වැනි පන්තීන් ද ඇතුළුව ඒකාබද්ධ සේවාවන්).**—පත්වීම නතර කිරීමේ දැනුම්දීම භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එක් එක් නිලධාරියකු පිළිබඳව වෙනම වාර්තාවක්, භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් වෙත අප්‍රමාදව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**(ඇ) වෘත්තීය, විද්‍යාත්මක සහ කාර්මික නිලධාරීන්.**—වෘත්තීය, විද්‍යාත්මක හෝ කාර්මික වැඩවල නියුක්ත යම් විශේෂ නිලධාරියෙකුගේ සේවය අවසන් කිරීමෙන් රජයේ සංවර්ධන වැඩ පිළිවෙලට බරපතල ලෙස හානි සිදු වේ යයි දෙපාර්තමේන්තු ප්‍රධානියා සලකන යම් අවස්ථාවක් ඇති වුවහොත්, ඒ එක් එක් නිලධාරියකු පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ මාර්ගයෙන් භාණ්ඩාගාරයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ කරුණ සම්බන්ධව ස්ථිර ලේකම් ඔහුගේ නිරීක්ෂණ දැක්විය යුතු ය. ඉදින් ඉහත සඳහන් පරිදි වාර්තාවක් භාණ්ඩාගාරයේ ලේකම් වෙත ඉදිරිපත් කොට ඇත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම්, එවැනි අවස්ථාවල දී පත්වීම නතර කිරීමේ දැන්වීම නිකුත් කිරීම වැඩිදුර උපදෙස් ලැබෙන තුරු පමා කළ යුතු ය.

**භාණ්ඩාගාර චක්‍රලේඛය අංක 760**

අංකය : 2/9/156/36 (එච්)
1969 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

සියලුම ස්ථිර ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙතටයි.

**රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීම**

1. **සටහන :** මේ චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳවත් දෙමළ භාෂාවේ සාධාරණ භාවිතය පිළිබඳවත් රජයේ ප්‍රතිපත්තිය පැහැදිලි කරනු පිණිසය. එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ විධාන මෙයින් පනවනු ලැබේ.

1.01 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ අඩංගු වී ඇති පරිදි රජයේ භාෂා ප්‍රතිපත්තිය නම් ලංකාවේ එකම රාජ්‍ය භාෂාව සිංහලය වන බවයි.

1.02 1966 දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) රෙගුලාසි සමග කියවිය යුතු 1958 අංක 28 දරණ දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනතින්, ලංකාවේ එකම රාජ්‍ය භාෂාව වශයෙන් සිංහල භාෂාව භාවිත කරනු ලැබීමට හානියක් නොවන පරිදි පහත සඳහන් කාර්යයන් සඳහා දෙමළ භාෂාව ද භාවිත කිරීම පිණිස විධිවිධාන සැලසේ. එනම් :—

(අ) උතුරු හා නැගෙනහිර පළාත්වල, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක වුව ද, රජයේ නීතිගත සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක වුව ද, නැත හොත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් විසින් වුව ද රජයේ නීතිගත සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් වුව ද කරනු ලබන සියලු ම ආණ්ඩුවේ හා පොදු කටයුතු ඉෂ්ට කිරීම හා පොදු වාර්තා පවත්වා ගෙන යාම සඳහා ; සහ

(ආ) ස්වකීය නිල කටයුතුවල දී නිලධරයන් හැර, දෙමළ භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ තැනැත්තන් හා නිල කටයුතුවල දී යම් නිලධරයකු අතර හෝ දෙමළ භාෂාවෙන් කටයුතු කරන උතුරු හා නැගෙනහිර පළාත්වල යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක් හා නිල කටයුතුවල දී යම් නිලධරයකු අතර සියලු ම ලිපි ගනුදෙනු සඳහා.

2. පහත සඳහන් සවිස්තර විධාන පනවනු ලබන්නේ සියලුම අමාත්‍යාංශයන් ද ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හෝ ආයතනයන් ද රජයේ නීතිගත සංස්ථාවන් හා ව්‍යවස්ථාපිත ආයතනයන් ද (මින් පසු මේවා රජයේ සංවිධාන යනුවෙන් හැඳින් වෙනු ඇත) විසින් අනුගමනය කරනු ලැබීම පිණිසය.

**3. ප්‍රාදේශීය බලමණ්ඩල (එනම් පළාත් පාලන ආයතන) ඇතුළු සාමාන්‍ය මහජනයා සමග කෙරෙන ලිපිගනුදෙනුව පිළිබඳව උපදෙස්**

3.01 රජයේ සංවිධාන විසින් ප්‍රාදේශීය බල මණ්ඩල ද ඇතුළු සාමාන්‍ය මහජනයා සමග කෙරෙන හැම ලිපි ගනුදෙනුවක්ම ඇරඹිය යුත්තේ රාජ්‍ය භාෂාව වන සිංහලයෙනි. එහෙත් උතුරු හා නැගෙනහිර පළාත්වල එය දෙමළෙන් ද කළ යුතු ය. ස්වකීය නිල කටයුතුවල දී නිලධරයන් හැර, දෙමළ භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ තැනැත්තන් හා නිල කටයුතුවල දී යම් නිලධරයකු අතර හෝ දෙමළ භාෂාවෙන් කටයුතු කරන උතුරු හා නැගෙනහිර පළාත්වල යම් ප්‍රාදේශීය බලමණ්ඩලයක් හා නිල කටයුතුවල දී යම් නිලධරයකු අතර සියලු ම ලිපිගනුදෙනු සඳහා දෙමළ භාෂාව ද පාවිච්චි කළ යුතුය.

3.02 රජයේ සංවිධානයක් හා දෙමළ භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ පුද්ගලයකු අතර කෙරෙන හැම ලිපිගනුදෙනුවක් ම රාජ්‍ය භාෂාව වන සිංහලයට අතිරේක වශයෙන් දෙමළෙන් ද විය යුතුය.

**4. දෙපාර්තමේන්තු අතර හා දෙපාර්තමේන්තු ඇතුළත ලිපිගනුදෙනු කිරීම හා කාර්යාලයීය සටහන් ලිවීම**

4.01 රජයේ සංවිධානයන් අතර කෙරෙන ලිපි ගනුදෙනු රාජ්‍ය භාෂාව වන සිංහලයෙන් විය යුතුය. එතෙකුදු වුවත් උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළත පිහිටි රජයේ සංවිධානයන් අතර කෙරෙන ලිපි ගනුදෙනුවලදී දෙමළ පරිවර්තනයක් ද යැවිය යුතුය.

4.02 රජයේ සංවිධානයන් ඇතුළත කෙරෙන කාර්යාලයීය සටහන් ලිවීම රාජ්‍ය භාෂාව වන සිංහලයෙන් කළ යුතුය. එතෙකුදු වුවත් උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි රජයේ සංවිධානයන්හි නම් කාර්යාලයීය සටහන් දෙමළ භාෂාවෙන් ද තැබිය යුතුය.

4.03 විශ්‍රාම ගැනීමේ වෛකල්පික වයසට නොපැමිණියාවූ ද රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රමාණවත් ප්‍රවීණතාවක් නැත්තා වූ ද 'ආදි ප්‍රවේශක' නිලධාරීන්ට රාජකාරී ලිපි ගනුදෙනු හෝ කාර්යාලයීය සටහන් හෝ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකිවනු පිණිස, ඒවායේ ඉංග්‍රීසි පරිවර්තන ලබා දෙන ලෙස නිශ්චිත ඉල්ලීමක් කොට එවැනි පරිවර්තන ලබාගත හැකිය. එපරිද්දෙන්ම රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රමාණවත් ප්‍රවීණතාවක් නැත්තා වූ ද පරිවාසය පිට (එනම් ආධුනිකත්වය පිට) සිටින්නා වූ ද 'නව ප්‍රවේශක' නිලධාරියකුට, තමා රජයේ සේවයට බැඳුණු භාෂා මාධ්‍යය අනුව ඒවායේ දෙමළ පරිවර්තන හෝ ඉංග්‍රීසි පරිවර්තන හෝ ලබා දෙන ලෙස නිශ්චිත ඉල්ලීමක් කොට එවැනි පරිවර්තන ලබාගත හැකිය

රාජ්‍ය භාෂාවෙන් හැර වෙනත් භාෂාවකින් ලියන සෑම කාර්යාලයීය සටහනක් ම රාජ්‍ය භාෂාවෙන් ද තිබීමට සැලැස්විය යුතු ය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිංහල මාධ්‍යයෙන් රජයේ සේවයට ඇතුළු වී සිටින සියලුම 'නව ප්‍රවේශක' නිලධාරීන් ද අන්‍යාකාරයකින් නිදහස් කරනු ලැබ සිටින නිලධාරීන්ගේ ගණයට වැටෙන නිලධාරීන් හැර ස්වකීය තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින අනික් සියලුම 'නව ප්‍රවේශක' නිලධාරීන් ද විසින් කාර්‍යශීලයීය සටහන් ලිවිය යුත්තේත් රාජකාරි ලේඛන වාර්තා දිය තබාගත යුත්තේත් රාජ්‍ය භාෂාවෙනි.

4.04 1957 මැයි මස 23 වැනි දිනය හා 379 වැනි අංකය දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා ප්‍රසාද මුදලක් ලබා ගෙන ඇති 'ආදි ප්‍රවේශක' නිලධාරීන් විසින්, නිල කටයුතු සියල්ලක්ම රාජ්‍ය භාෂාවෙන් කළ යුතු ම ය.

4.05 (1966 සැප්තැම්බර් මස 4 වැනි දිනය හා 700 වැනි අංකය දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුබද්ධ කොට ඇති උපලේඛනය අනුව) 'ආදි ප්‍රවේශක' නිලධාරීන්ගේ බැඳීම් මෙසේ ය—

(i) සිංහල මාධ්‍යයෙන් හෝ අන්‍ය මාධ්‍යයකින් හෝ පවත්වන ලද විභාගයකින් ඔවුනොවුන්ගේ සිංහල දැනුම සලකා රජයේ සේවයට බඳවාගනු ලැබූ හෝ අන්තර්ග්‍රහණය කරනු ලැබූ හෝ ශ්‍රේණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීහු සිංහලෙන් රාජකාරී කටයුතු කිරීමට බැඳී සිටිති.

(ii) එමෙන්ම, දෙමළ හෝ ඉංග්‍රීසි හෝ අන්‍ය මාධ්‍යයකින් පවත්වන ලද විභාගයකින් ඔවුනොවුන්ගේ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාමය දැනුම සලකා රජයේ සේවයට බඳවා ගනු ලැබූ හෝ අන්තර්ග්‍රහණය කරනු ලැබූ හෝ ශ්‍රේණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීහු නියම කරනු ලැබූ විටක දී එම භාෂාවෙන් ද වැඩ කළ යුතු ය.

(iii) සිංහල සහ/හෝ දෙමළ භාෂවන් පිළිබඳ සුදුසුකම් ලැබීමේ නියමිත දැනුමක් ලබා ගත යුතුව ඇති ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද විභාගයකින් රජයේ සේවයට බඳවා ගනු ලැබූ හෝ ශ්‍රේණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීහු, තමන් එම භාෂාවන් පිළිබඳ ලැබූ ප්‍රවීණතාවයට සරිලන මට්ටමේ ඕනෑම රාජකාරී කටයුත්තක් ඉටු කිරීමට යටත් පිරිසෙයින් තමා ලද සිංහල සහ/හෝ දෙමළ භාෂා ප්‍රවීණත්වයට සමාන දැනුමකින් යුක්තව සිටිය යුතු ය.

(iv) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සුදුසුකම් ලැබීමේ නියමිත දැනුමක් ලබාගත යුතුව ඇති සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් පවත්වන ලද විභාගයකින් රජයේ සේවයට බඳවා ගනු ලැබූ හෝ ශ්‍රේණියකට උසස් කරනු ලැබූ හෝ නිලධාරීන්ට යටත් පිරිසෙයින් තමන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලැබූ ප්‍රවීණත්වයට සරිලන මට්ටමේ ඕනෑම රාජකාරී කටයුත්තක් ඉටු කිරීමට පුළුවන් විය යුතුය.

(v) භාෂාවක් පිළිබඳ ප්‍රවීණත්වය නිලධාරියකුගේ පත්වීමක් සඳහා අවශ්‍ය සුදුසුකමක් විය යුතු හෝ පසු කලක දී ලබාගත යුතු වූ හෝ අවස්ථාවල දී එවැනි නිලධාරියකු එම භාෂාවෙන් ඕනෑම රාජකාරී කටයුත්තක් කිරීම අවශ්‍ය වේ.

(vi) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ කතා ව්‍යවහාර දැනුමක් හෝ වැඩ කිරීමේ දැනුමක් හෝ පත්වීමක් ලැබීමට අවශ්‍ය සුදුසුකමක් විය යුතු හෝ පසු කලක දී ලබාගත යුතු හෝ අවසාථාවල දී යටත් පිරිසෙයින් නිලධාරීන් විසින් එම භාෂාව පිළිබඳ එම දැනුමවත් දිගටම පවත්වාගෙන යා යුතු වේ.

(vii) කිසියම් ප්‍රදේශයක සේවය කිරීමට එම ප්‍රදේශයේ භාෂාවේ ප්‍රවීණත්වය සලකා සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන් නියම කරනු ලැබුවහොත් ස්වකීය රාජකාරී කටයුතු එම භාෂාවෙන් කළ යුතු යයි අපේක්ෂා කෙරේ.

(viii) ඔවුනොවුන්ගේ සෙසු සුදුසුකම්වලට අමතර ව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් රුස්වීම් ඇමතීමේ හැකියාව ගැන සලකා සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන්, එම භාෂාවන් පිළිබඳ එකී හැකියාව එසේම පවත්වා ගත යුතු යයි අපේක්ෂා කෙරේ.

(ix) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාවන්ගෙන් ලඝුලේඛනය සහ යතුරු ලිවීම සඳහා බඳවා ගෙන ඇති නිලධාරීන් අවශ්‍ය වුවහොත් එම භාෂාවෙන් එකී රාජකාරී ඉටු කළ යුතු ය.

(x) සිංහල හැර අන්‍ය මාධ්‍යයකින් ලඝුලේඛන කටයුතු සඳහා බඳවා ගෙන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් සිංහල ලඝුලේඛනය පිළිබඳ පුහුණුවක් ලැබූ නිලධාරීන් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක සිංහලෙන් ලඝුලේඛන කටයුතුවල නිරත විය යුතුය.

(xi) සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ දෙපාර්තමේන්තු ගත යතුරු ලිවීමේ පරීක්ෂණයන්ගෙන් සමත් වූ නිලධාරීන් හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් සිංහල හෝ දෙමළ යතුරු ලිවීම පිළිබඳ පුහුණුවක් ලැබූ නිලධාරීන් හෝ අවශ්‍ය වූ ඕනෑම විටක තමතමන්ට අනුකූල වන අන්දමට සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ යතුරු ලිවීමේ කටයුතුවල නිරත විය යුතු ය.

4.06 1957 මැයි මස 23 වැනි දිනය හා 379 වැනි අංකය දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා ප්‍රසාද මුදලක් ලබා ගෙන නැති 'ආදි ප්‍රවේශක' නිලධාරීන්ට දෙපාර්තමේන්තුව ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට අවසර තිබේ. එහෙත් ඔවුන් විසින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට සහයෝගය දිය යුතුය. තම කාර්‍යශීලයීය සටහන් රාජ්‍ය භාෂාවෙන් ලිවීමට පුළුවන්කම තිබේ නම් ඔවුන් විසින් ඒ සටහන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජ්‍ය භාෂාවෙන් ලිවිය යුතු ය. රාජකාරි ඉටු කර ගෙන යෑම සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතාවක් නැති නිලධාරීන්ට මෙම 'ආදි ප්‍රවේශක' නිලධාරීන් සිය කැමැත්තෙන්ම උපකාර කළ යුතු ද වේ.

5. **ලේඛන වාර්තා ආදිය.**—ගිණුම් ද ඇතුළුව රජයේ සියලුම ලේඛන වාර්තා ආදිය තබාගත යුත්තේ රාජ්‍ය භාෂාවෙනි. උතුරු හා නැගෙනහිර පළාත්වල පොදු ලේඛන වාර්තා ආදිය 1966 දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) රෙගුලාසි අනුව දෙමළ භාෂාවෙන් ද තබාගත යුතු ය.

6. **පොදු ආකෘති පත්‍ර.**—රජයේ සංවිධානයන් විසින් නිකුත් කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන මුද්‍රිත ආකෘති පත්‍ර හෝ රෝනියෝ ආකෘති පත්‍ර සියල්ලක්ම, දෙමළ භාෂාමය පරිවර්තනයක් ද සහිතව, රාජ්‍ය භාෂාවෙන් තිබිය යුතුය. පහසුව සඳහා එබඳු ආකෘති පත්‍ර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම සංයුක්ත කොට මුද්‍රණය කළ හැකි ය.

7. **නාම පුවරු හා සංඥා පුවරු.**—රජයේ සංවිධාන විසින් පාවිච්චි කරනු ලබන නාම පුවරු හා සංඥා පුවරු හැමෙකක්ම සිංහලෙන් හා දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් තිබිය යුතුය.

8. **නිල ප්‍රකාශන**

8.01 සියලුම නිල ප්‍රකාශන රාජ්‍ය භාෂාවෙන් තිබිය යුතුය. 1966 දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) රෙගුලාසිවලට අනුකූලව එකී ප්‍රකාශනවල දෙමළ පරිවර්තනයන් ද පළ කළ යුතුය. අවශ්‍ය අවස්ථාවල දී එකී ප්‍රකාශන ඉංග්‍රීසි භාෂාවෙන් ද තිබිය හැකිය.

8.02 දැනට ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් තිබෙන්නා වූ ද නිල කටයුතු සඳහා අවශ්‍ය යැයි හැඟෙන්නා වූ ද දෙපාර්තමේන්තු අත්පොත් හා වෙනත් එබඳු ලේඛන සියල්ලක්ම වහාම සිංහලට හා දෙමළට පරිවර්තනය කරනු ලබන බවට ස්ථිර ලේකම්වරුන් ද දෙපාර්තමේන්තු ප්‍රධානයන් ද වග බලා ගත යුතු ය.

9 **සාමාන්‍ය කරුණු**

9.01 රජයේ කාර්යාලවල කාර්ය මණ්ඩල බෙදා හැරීමේ දී නිලධාරියකුගේ සිංහල ප්‍රවීණතාව කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් දැක්විය යුතුය. නිලධාරීන් මාරු කරන විට ඒ හේතු කොටගෙන, දෙපාර්තමේන්තුවල කටයුතු බාධා විරහිතව රාජ්‍ය භාෂාවෙන් කරගෙන යාමේ වැඩ පිළිවෙළට හානියක් නොවන බවට වග බලා ගැනීමට පරිස්සම් විය යුතු ය.

9.02 රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළවන කරුණු පිළිබඳව ස්ථිර ලේකම්වරුන්ට ද දෙපාර්තමේන්තු ප්‍රධානයන්ට ද රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් සමග කෙළින්ම කටයුතු කළ හැකිය.

10. මේ චක්‍රලේඛයට අනුකූලව, රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලෙස ස්වකීය අමාත්‍යාංශයන් යටතේ ඇති රජයේ සංවිධානයන්ට උපදෙස් දෙන මෙන් ස්ථිර ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**එම්. රාජේන්ද්‍ර,**
භාණ්ඩාගාරයේ ලේකම්.

භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් වෙනුවට.

භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපිය අංක ජී (103)

1965 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

සියළුම ස්ථිර ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත,

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම—විශ්‍රාම ගැනීමේ වෛකල්පික වයස් සීමාවට එළඹි නිලධාරීන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම

1963 ඔක්තෝබර් මස 18 වැනි දින අංක 621 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය හා සබඳි.

වැඩ සහ හැසිරීම අන් සෑම අයුරින් ම සතුටුදායකනම්, නියමිත සිංහල ප්‍රවීණතාවයන් ලබා නොමැති නිලධාරීන්ට වයස අවුරුදු 55 න් (වෛකල්පික විශ්‍රාම ගැනීමේ වයස් සීමාව) ඔබ්බට ද සේවය කිරීමට දැනට ඉඩ දිය යුතු යයි තීරණය කර ඇත. ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම පිළිබඳ ව වැඩි පුර උපදෙස් ළඟදී ම නිකුත් කරනු ලැබේ.

මේ අනුව ක්‍රියා කරනු මැනවි.

හෙ. ජිනදාස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම් වෙනුවට.

(2/9/156/26 (එච්)).

භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය—අංකය. ආයතන 57.

අංකය : 543 ඊ/281 ඕ.
1966 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

සියළුම ස්ථිර ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

රාජ්‍ය සේවයේ නව ප්‍රවේශකයන් සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සහ සේවා කොන්දේසි

රාජ්‍ය සේවකයෝ (නව ප්‍රවේශක නිලධාරීහු) සහ රාජ්‍ය භාෂාව—බඳවා ගැනීම හා සේවා කොන්දේසි පිළිබඳ වූ 1966 සැප්තැම්බර් මස 4 වැනි දින අංක 701 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2(ආ) ඡේදය බලන්න.

2. දෙපාර්තමේන්තුවල පහසුව සඳහාත්, ඒකාකරි භාවයක් ඇති කිරීම සඳහාත්, බඳවා ගැනීමේ පරිපාටියෙහි ඇතුළත් කළයුතු සාමාන්‍ය සේවා කොන්දේසි යට දක්වනු ලැබේ

(අ) බඳවා ගැනීමේ පරිපාටිවල (තාවකාලික තනතුරු සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටි සඳහා හැර) සේවා කොන්දේසි යන ශීර්ෂය යටතේ ඇතුළත් කිරීමට "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු නම්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

(i) ඔවුන්ගේ ආධුනික/පරීක්ෂණ කාලය අවුරුදු 3 ක් විය යුතුය.*

(ii) ඔහු/ඈ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නා වූත් හෝ මතුවට පනවනු ලැබිය හැකි වූ හෝ යම් නීති රීතිවලට සහ ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතු ය.

(iii) ඔහුගේ/ඇගේ ආධුනික/පරීක්ෂණ කාලය තුළ දී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබා ගත යුතු වේ ය.*

(iv) ආධුනික/පරීක්ෂණ කාලය අවසාන යේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර පත්වීමේ දිනයේ සිට පිළිවෙලින්, අවුරුද්දක්, අවුරුදු 2 ක් සහ අවුරුදු 3 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ, II වැනි ශ්‍රේණියේ සහ III වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන් (නැතහොත් අදාළ වන අවස්ථාවල අවුරුද්දක් සහ අවුරු 2 ක් ඇතුළත I වන ශ්‍රේණියේ සහ II වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන් ගෙන්) සමත්වීම උඩ රඳා පවතී.

The proposal now is that every one of the clauses in the Bill be dropped. In other words, in effect the Bill in its original form withdrawn. But instead of withdrawing it and presenting an entirely new Bill, the Government has told us that what it proposes to do is to drop all clauses except the proposed clause introducing new Section 51A, which you will find on page 2 of this Bill under clause 5, and the amendment proposed embodies clearly the principle that was suggested.

That means that, whether the matter goes to the district court by way of action, or whether it comes by way of appeal to the Supreme Court, or whether it is a matter of an application for a mandate in the nature of an order or a writ, etc., absolute priority—I am using my own language—will be given to it in each court, and that will mean that ordinarily it will have priority over all other business. The object of introducing the word " ordinarily " there is to leave that discretion in the court where there can be matters of much higher priority and urgency. For instance, there may be a *habeas corpus* application such as the one we had in the Bracegirdle case which if it was delayed by a few hours, would never have been heard at all. I wish to say that we of the Opposition are quite glad to agree to the proposition of the Government in this matter.

ආර්. එස්. පෙරේරා මයා. (කැළණිය)
(திரு. ஆர். எஸ். பெரேரா—களனி)
(Mr. R. S. Perera—Kelaniya)
නැගී සිටියේ ය—
எழுந்தார்—
*rose*——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

There is only one clause in the Bill which will be amended in Committee. All the other clauses are being dropped.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.22

**ආර්. එස්. පෙරේරා මයා.**

*(திரு. ஆர். எஸ். பெரேரா—களனி)*

(Mr. R. S. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් ගැනීම සම්බන්ධයෙන් කථා කිරීමට මේ අවස්ථාවේදී තරමක් දුරට වත් කාලය පාවිච්චි කිරීමට අපි උත්සාහ කරනවා. මෙම සංශෝධිත පනත යටතේ කතා කරන්න යෙදුන අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) මෙම සංශෝධිත පනත සම්මත වුණොත් නිදහස් පුරවැසියෙකුට තිබෙන අයිතිවාසිකම් උල්ලංඝනය වන හැටි පැහැදිලි කර දුන්නා. එසේ පැහැදිලි කර දීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මෙම පනතේ තිබෙන පුරවැසි අයිතිවාසිකම්වලට හානි වන කොටස් අස් කර ගැනීමට ඇමතිතුමා එකඟ වී තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ සමගම ඉඩම් අත්කර ගැනීම සම්බන්ධව පළාත් පාලන පාලන ආයතනවලට අද සිදු වී තිබෙන තත්ත්වය ගැනත් කරුණු ටිකක් පැහැදිලි කරන්න කැමතියි. විශේෂයෙන් පළාත් පාලන ආයතනයකට පත්වන මහජන නියෝජිතවරුන් එම පළාතේ පදිංචි මහජනයා සම්බන්ධයෙන් ඉටු කළ යුතු දේවල් රාශියක් තිබෙනවා. මා සිතන හැටියට මේ ගරු සභාවේ සිටින අයගෙන් සෑහෙන පිරිසක් පළාත් පාලන ආයතනවල නියෝජිතවරුන් හැටියට සේවය කර තිබෙනවා. ඒ සියලු දෙනාම මගේ මේ අදහසට එකඟ වෙනවා ඇති. පළාත් පාලන ආයතනයට අයත් වන ප්‍රදේශයේ පොදු දියුණුව සඳහා පාරක් ගැනීමට, සුසාන භූමියක් සඳහා ඉඩමක් ගැනීමට, ක්‍රීඩා පිටියක් සඳහා ඉඩම් කැබැල්ලක් ගැනීමට හෝ වෙනත් එවැනි කාරණයක් කිරීමට යම්කිසි තීන්දුවක් අරගන්නවා. මා ගරු ඇමතිතුමාට පෙන්නුම් කර දෙන්න කැමතියි, මෙම ගරු සභාවට මහජන ඡන්දයෙන් පත් වන මන්ත්‍රීවරුන්ට වගේම පළාත් පාලන ආයතන නීති යටතේ පත් වන උදවියටත් ඒ ප්‍රදේශවලට සේවය කිරීමේදී අරුම පුදුම අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වන බව.

මෙය මේ රජයට ස්ථිර වශයෙන් කරන චෝදනාවක් නොවෙයි. මා හිතනවා මේ කාරණයට ගරු අගමැතිතුමාත් කන් දුන්නොත් හොඳයි කියා. අද පළාත් පාලන ආයතනවලට මුහුණ පාන්න සිදු වී තිබෙන තත්ත්වය නම් මෙයයි. මම දළුගම සුළු නගර සභාව ගැන තමුන්නාන්සේට කරුණු ටිකක් කියන්නම්. එම සුළු නගර සභාව ඇති වී දැනට 6 අවුරුද්දක් ගත වෙනවා. ඊටත් කලින් කැළණියේ ගම් කාර්ය සභාව තිබෙන කාලයේදී—දැනට අවුරුදු 10 කට කලින්—රජයේ ආධාර මුදලකුත් ලබා ගෙන තලවතුහේන්පිට උතුර-දකුණ ප්‍රදේශයට සුසාන භූමියක් සඳහා ඉඩමක් ගැනීමට කටයුතු කරන්න යෙදුනා. එම ප්‍රදේශයේ තිබෙන තද බදය ගැනත් ජනාකීර්ණ භාවය ගැනත්, කැළණියේ හිටපු මන්ත්‍රීවරයෙක් වන දැන් මෙහි සිටින ගරු රාජ්‍ය ඇමතිතුමා හොඳට දන්නවා ඇති. කොයි තරම් විශාල සෙනගක් සිටින ප්‍රදේශයක්ද කියා එතුමා හොඳට දන්නවා ඇති. ඒ ප්‍රදේශයට සුසාන භූමියකට ඉඩමක් ගැනීම සඳහා ආධාර මුදලක් වශයෙන් රජයෙන් රුපියල් 4,000 ක්ද ඊට අඩුව තිබුණ මුදල වන තවත් රුපියල් 7,000 ක් දැනට අවුරුදු 10 කට කලින් කැළණියේ ගම් කාර්ය සභාවෙන් අයින් කර, වහාම ඒ සඳහා ඉඩමක් ගත යුතුය කියන තීන්දුව උඩ, ඉඩම් අමාත්‍යාංශයට එවා තිබෙනවා. මෙය ඉතාමත් හදිසි කාරණයක් හැටියට දන්වමිනුයි මෙම මුදල එම අමාත්‍යාංශයට යවා තිබෙන්නෙ.

ඒ ප්‍රදේශයට සූසාන භූමියක් අවශ්‍යය කියා දන්වා යවා දැනට අවුරුදු 10 ක් ගත වී තිබෙනවා. මේ සම්බන්ධයෙන් මූලිකව කටයුතු කළ තලවතුහේන්පිට ග්‍රාම සංවර්ධන සමිතියේ මූලිකයෝ දැන් මරණයට පත් වීත් අවසානයි. සුසාන භූමියක් අවශ්‍යය කියා ඒ සම්බන්ධයෙන් කටයුතු කළ අයගෙන් වැඩි දෙනෙක් මරණයට පත් වී අවසානයි. නමුත් සුසාන භූමිය නම් තවමත් ලැබී නැහැ. සල්ලි ටික කච්චේරියේ. කැලණිය ගම් කාර්ය සභාව තිබෙන කාලයේදී—දැනට අවුරුදු 10 කට පෙර—ඒ ප්‍රදේශයට සුසාන භූමියක් සකස් කර දිය යුතුය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

කියා තීන්දු කර ඒ සඳහා අවශ්‍ය සල්ලිත් ලබා දුන්නා. ප්ලෑන් පවා සකස් කළා. සල්ලි ටික කච්චේරියේ තිබෙනවා. සුසාන භූමිය තවමත් නැහැ. කැළණියේ ගම් කාර්ය සභාව 1964 දී අවසන් වුණා. ඊට පසුව එය සුළු නගර සභාවක තත්ත්වයට පත් වුණා. සුළු නගර සභාවේ පළවෙනි කාල පරිච්ඡේදය අවසන් වුණා. 1966 දී දෙවැනි ඡන්දයකින් අලුත් පිරිසක් පත් වුණා. දෙවැනි පිරිසකුත් පත් වුණා. ඒ අයගේ කාල සීමාවත් 1970 දී අවසන් වෙනවා. නමුත් තවමත් සුසාන භූමියකට ඉඩමක් ගැනීම සම්බන්ධයෙන් පියවරක් ගෙන නැහැ. ඉඩම් අමාත්‍යාංශයෙන් ඒ කටයුතු ටික කර නැහැ. උසාවියේ ප්‍රමාදය නිසා නොවෙයි මෙය සිදු වී තිබෙන්නෙ. උසාවියේ ප්‍රමාදයට වඩා බොහොම භයානක ප්‍රමාදයක් ඉඩම් අමාත්‍යාංශයේ සහ කච්චේරියේ තිබෙනවා. දැනට අවුරුදු 10 ක් ගත වී තිබෙනවා. නමුත් සුසාන භූමියකට ඉඩමක් ගැනීමට කටයුතු කර නැහැ. ඒ වගේම පාරවල් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් මුදල් බැඳ අවුරුදු 4ක් 5ක් පමණ ගත වී තිබෙනවා. නමුත් අවශ්‍ය කටයුතු කර නැහැ. ඔය කියන ක්‍රීඩා පිටිය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු පළාත් පාලන ඇමතිතුමාත් දන්නවා යයි මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවන ලෝක මහා යුද්ධය පැවති කාලයේදී කැළණි කොට්ඨාශයේ වේවැල්දූව නමැති ස්ථානයේ ඉන්දියානු හමුදාව නතර කර තිබුණා. ඒ කඳවුරේ ඉන්දියානු සොල්දාදුවන්ට ක්‍රීඩා කිරීම සඳහා යුද්ධ හමුදා මුදල් වලින් ක්‍රීඩා පිටියක්ද සකස් කර තිබුණා. කාලයාගේ ඇවෑමෙන් යුද්ධය ඉවර වුණා. ඉන්දියානු හමුදාවත් ඉවත් වුණා. ඊට පසුව ඒ ප්‍රදේශයේ තරුණ පිරිස, සකස් කර තිබුණු මේ ක්‍රීඩා පිටිය පාවිච්චි කළා. ක්‍රීඩා පිටියක් සඳහා අප ආණ්ඩුවෙන් "ග්‍රාන්ට්" මුදලක් ඉල්ලූ විට 1958 නැත්නම් 1959 කාලයේදී රුපියල් 4,000 ක ග්‍රාන්ට් මුදලක් ලැබුණා. වැව්ලිවලට හානියක් නොවන පරිදිත්, කිසිම පුද්ගලයකුට පාඩුවක් නොවන අන්දමටත් ක්‍රීඩා පිටියක් සඳහා භූමි භාගයක් ලබා ගැනීමට අප සුපරීක්ෂකාරී වුණා. ඉන්දියානු හමුදාව විසින් සකස් කරන ලද අංග සම්පූර්ණ ක්‍රීඩා පිටියෙන් අක්කර එකයි කාලක බිම් කොටසක් ගන්නට අප කල්පනා කෙළේ ඉඩම අයිතිකාරයාට කිසිම පාඩුවක් නොවන අන්දමටයි. ඒ ඉඩම් කොටසේ තක්සේරුව රුපියල් 5,250 යි. ආණ්ඩුවෙන් ලැබුණේ රුපියල් 4,000 යි. මදි පාඩුව සඳහා කැළණි ගම්කාර්ය සභාව රුපියල් 1,250 ක් වෙන් කළා. මුළු මුදල වූ රුපියල් 5,250 කච්චේරියේ බැඳ දැන් අවුරුදු 10 ක් ගත වී තිබෙනවා. ගරු පළාත් පාලන ඇමතිතුමා මේ කියන දේට හොඳින් කන් දෙනවා නම් බොහොම හොඳයි.

තිරුචෙල්වම් සෙනෙට් මන්ත්‍රීතුමා පළාත් පාලන ඇමතිවරයා වශයෙන් සිටිද්දී මා මේ ගැන එතුමාගෙන් කරුණු විමසුවා. අවුරුදු හතක් අටක් ගත වී තිබෙන මේ ක්‍රීඩා පිටිය පිළිබඳ ප්‍රශ්නය විසඳා නොදෙන්නේ මන්දැයි මා එතුමාගෙන් ඇසුවා. ඉඩම අයිතිකාරයා විරුද්ධකම් ඉදිරිපත් කළා. එහෙත් ඒවා පිළිගත යුතු විරුද්ධකම් නොවෙයි. අවසානයේදී අරුම පුදුම ලිපියක් මට ලැබුණා. සුළු නගර සභාවේ සභාපතිවරයා හැටියටයි, මට ඒ ලිපිය ලැබුණේ. මහජන ක්‍රීඩා පිටි ඒ ප්‍රදේශයේ තිබෙන බවටත් ඒ වාගේම පාඨශාලාවලත් ක්‍රීඩා පිටි තිබෙන බවටත් තමාට වාර්තාවක් ලැබී තිබෙන හෙයින් ඒ ඉඩම පිළිබඳ අදහස අතහැර දමන්නට යනවා යයි ගරු තිරුචෙල්වම් ඇමතිතුමා ඒ ලිපියෙන් කියා තිබුණා. ඒ ලිපිය ලැබුණාට පසුව සම්මුඛ සාකච්ඡාවකට අවස්ථාවක් සලසා දෙන ලෙස ඉල්ලමින් අප තිරුචෙල්වම් ඇමතිතුමාට වහාම ලිපියක් යැව්වා. ඉල්ලන ලද පරිදි ඒ අවස්ථාව ලැබුණා. අර අරුම පුදුම වාර්තාව සැපයුවේ කවුරුන්දැයි ඒ සම්මුඛ සාකච්ඡාවේදී මා ප්‍රශ්න කළා. මම කැළණියේ මන්ත්‍රීවරයා. ඒ වාගේම දළුගම සුළු නගර සභාවේ සභාපතිවරයා. කැළණිය සුළු නගර සභාවට අයිති ප්‍රදේශය තුළ පමණක් නොවෙයි, මුළු කැළණිය පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාශයටම අයිති ප්‍රදේශය තුළ එක මහජන ක්‍රීඩා පිට්ටනියක්වත් තිබෙන බවක් ගරු ඇමතිතුමාට ඔප්පු කරන්න පුළුවන් නම් ක්‍රීඩා පිට්ටනිය සඳහා ඉදිරිපත් කරන ලද මගේ ඉල්ලුම් පත ඉල්ලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අස් කර ගන්නට මා සූදානම් බව ගරු නිරුවෙල්වම් ඇමතිතුමාට මා කියා සිටියා.

එතකොට, ඇත්ත වශයෙන්ම මුළු කැළණිය මැතිවරණ කොට්ඨාශයටම එකම එක ක්‍රීඩා පිට්ටනියක්වත් නැද්දැයි ගරු ඇමතිතුමා ඒ අවස්ථාවේ මගෙන් ඇහුවා. කැළණිය පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාශය සකස් වෙලා තිබෙන්නේ දලුගම සුළු නගර සභා කොට්ඨාශයත්, කැළණිය සුළු නගර සභා කොට්ඨාශයත්, බියගම ගම්කාර්ය සභා කොට්ඨාශයත් යන මේ ආයතන තුනට අයත් කොට්ඨාශ තුන එකට එක්කාසු වීමෙනුයි. එසේ සකස් වී තිබෙන කැළණිය මැතිවරණ කොට්ඨාශය ඇතුළත කොහේවත් මහජන ක්‍රීඩා පිට්ටනියකැයි හැඳින්විය හැකි ක්‍රීඩා පිට්ටනියක් නැහැ. එවැනි තත්ත්වයක් මේ ප්‍රදේශයේ තිබියදී, නිලධාරීන් ඉඩම් හිමියන්ගේ පැත්ත ගෙන ක්‍රියා කරමින්, බොරු වාර්තා ඉදිරිපත් කර අප හැම දෙනාම මෝඩයන් හැටියට සලකාගෙන මේ ප්‍රශ්නය වහන්නට උත්සාහ කරනවා නොවේදැයි ගරු ඇමතිතුමාගෙන් මම ඇහුවා.

මහා විද්‍යාලවලට අයිති ක්‍රීඩා පිට්ටනි තිබෙනවා. එය සත්‍යයක්. පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රයෝජනය සඳහා මහා විද්‍යාලවල ක්‍රීඩා පිට්ටනි තිබෙන බව ඇත්තයි. ඒවා මහජන ක්‍රීඩා පිට්ටනි නොවෙයි. ඒවායේ මුළු අයිතිය සහ පාවිච්චි කිරීමේ සම්පූර්ණ බලය තිබෙන්නේ මහා විද්‍යාලවල සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටයි. ඒ ක්‍රීඩා පිට්ටනි පාලනය වන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේයි. ඒ නිසා ඒවා මහජන ක්‍රීඩා පිට්ටනි වශයෙන් හඳුන්වන්නට බැහැ. ඒවා පාඨශාලාවලටයි අයිති. මෙතැනදී නියම තත්ත්වය හරි හැටි වටහා ගත් ගරු ඇමතිවර නිරුවෙල්වම් මහත්මයාට තරමක් දුරට කේන්ති ගිය බවකුත් පෙනී ගියා. වැරදි අවබෝධයක් ඇති කරන අන්දමේ වාර්තාවක් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලැබීම නිසා තමන්ටත් වැරදි තීරණයක් ගන්නට සිද්ධ වුණු බව ප්‍රකාශ කළ ගරු ඇමතිතුමා 38 වැනි වගන්තිය යටතේ ඒ ක්‍රීඩා පිට්ටනිය වහාම ගත යුතු යයි තීරණය කළා. ඒ ආකාරයට තීරණය කළ ගරු ඇමතිතුමා එතුමාගේ ස්ථිර ලේකම්වරයාට ඒ තීරණය ගැන දැනුම් දුන්නා. හදිසි වැදගත් කටයුත්තක් සඳහා ඉඩම් ගැනීමට බලය දෙන වගන්ති යටතේ ක්‍රීඩා පිටිය ගන්නැයි ගරු ඇමතිතුමා නියෝගයක් කළාය කිව්වා.

ඔය නියෝගය කර දැන් අවුරුදු කීපයක්ම ගත වෙලා තියෙනවා. නියෝගය කළ ගරු ඇමතිතුමා කලකට පස්සේ ඇමතිකමිනුත් බැහැර වීමෙන් ඇමතිවරුන්ගේ මාරුවීම්ද ඇති වුණා. දැන් ඉන්න, පළාත් පාලන කටයුතු භාර ගරු ඇමතිතුමා මේ ගැන දන්නවාදැයි මම දන්නේ නැහැ. සභාපතිවරයා හැටියට මට නැවතත් දැන්වීමක් කළා. කැළණිය ප්‍රදේශයේ රජයට අයිති ඉඩම් තිබෙනවාය, ඒවා සොයාගෙන යනවාය, රජයේ ඉඩම්වලින් ක්‍රීඩා පිට්ටනියකට සුදුසු ඉඩමක් ගන්නට බලාපොරොත්තු වෙනවාය, ඒ නිසා මේ ඉඩම ගැනීමේ අදහස අත් හැරියාය යනුවෙන් එහි සඳහන් කර තිබුණා. සුළු නගර සභා ප්‍රදේශයට අයිති කොටසේ රජයට අයිති ඉඩම් අඟලක්වත් නැහැ. ඒ නිසා මෙවැනි බොරු වුවමනා කරන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ ජීවත් වන අපි එහි නියම තත්ත්වය දන්නවා. ඒ ගැන නියම තොරතුරු අපි දන්නේ නැත්නම් ඒක වෙනම වැඩක්. මෙවැනි බොරු අදහස් ඉදිරිපත් කර මේ වැදගත් කටයුත්ත ඔය විධියට නවත්වන්නට එපායයි මම කියා සිටියා. රජයට අයිති, ඔවුන්නට—කිරීටයට—අයිති ඉඩම් තිබෙනවාය, ඒවායින් ගන්නට අදහස් කරනවාය යනාදී වශයෙන් බොරු කියන්නට වුවමනාවක් නැහැ. ඒ කාරණය අලුතින් පත් වූ ගරු ඇමතිතුමාට දැනුම් දුන්නා. නිකම් ලියුම් කියුම් එහාට මෙහාට තල්ලු වෙනවා පමණයි. දැනට ක්‍රීඩා කරන පිට්ටනිය ගන්නට සහයෝගය නොදෙනවා නම් කොහොමද වැඩ කරන්නේ.

මීට සති තුන හතරකට විතර ඉස්සර වෙලා, වෙනත් ඉඩමක් හොයාගන්නට සභාපතිවරයා කැමති වෙලා තිබෙනවාය, ඒ නිසා මේ ඉඩම ගැනීමේ මුල් අදහස අත් හරිනවාය යනුවෙන් ප්‍රකාශ කළා. එය සම්පූර්ණ බොරුවකැයි දන්වමින් නැවත වරක් ලියමනක් යැව්වා. එවැනි දැන්වීමක් කර නැහැ. මා එදාත්, අදත්, ඉදිරියටත් ඒ ඉඩම ගැනීමටමයි උත්සාහ කරන්නේ. කිසිම කෙනෙකුට පාඩුවක් නොවන ආකාරයටයි මේ කට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

යුත්ත කරන්නට බලාපොරොත්තු වන්නේ, අවුරුදු විස්සක් තරම් වූ කාලයක සිට තිබෙන මේ ක්‍රීඩා පිට්ටනිය මහජන ක්‍රීඩා පිට්ටනියක් හැටියට ගන්නට අපි ක්‍රියා කරනවා. එතැන පොල් ගහක්වත්, කොස් ගහක්වත්, අඹ ගහක් වත් නැහැ. වෙනත් වැවිල්ලක්වත් ඒ ඉඩමේ නැහැ. මේ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර සිටිනවා. මෙය රජය මුලින්ම පිළිගත් ඉල්ලීමක්. මෙය ටවුන් ප්ලෑනර් විසින් අනුමත කරන ලද කටයුත්තක්. කච්චේරියේ මුදල් තැන්පත් කර අවුරුදු 10 ක් ගත වූ ඉල්ලීමක් මෙය. ජනාකීර්ණ ප්‍රදේශයකට නැතිවම බැරි දෙයක් හා සම්බන්ධ ඉල්ලීමක්. මෙය අත්‍යවශ්‍ය කටයුත්තක්. ඒ නිසා මේ ක්‍රීඩා පිට්ටනිය ගැනීමේ කට යුත්ත තව දුරටත් ප්‍රමාද නොකර ඉක්මනින් කර දෙන ලෙස ඉතා ඕනෑකමින්, මිත්‍රයකු හැටියට, මා ඉල්ලා සිටිනවා. මගේ ඉල්ලීම ඉටු කර දෙන්නැයි මා නැවතත් ඉල්ලා සිටිනවා. අපි දෙන්නා එක පන්තියේ හිටපු අය නොවැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මොන පන්තියේදී? ධනපති පන්තියේද? නිර්ධන පන්තියේද?

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

එදා නම් නිර්ධන පන්තියේ. අපි නම් තවමත් නිර්ධන පන්තියේමයි.

තවත් කතන්දරයක් කියන්නට තිබෙනවා. රජයේ වැඩ ඇමතිතුමා ටිකක් ඇහුම්කන් දෙනවා නම් බොහොම හොඳයි.

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

කියන්න; ඕනෑම දෙයක් කියන්න.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

ගරු ඉඩම් ඇමතිතුමාත් ඇහුම්කන් දෙනවා නම් හොඳයි. කැළණියේ හිටපු මන්ත්‍රී ගරු රාජ්‍ය ඇමතිතුමත් මේකට ඇහුම්කන් දෙනවා නම් හොඳයි. තෙල් පිරිපහදුව සඳහා කිරිබත්ගොඩ හන්දියේ සිට සපුගස් කන්ද දක්වා, රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයිති පාර පළල් කරන්නට නියෝග කළා. ඒ පිළිබඳව ගැසට් නිවේදනයකුත් නිකුත් කළා. පාරට වුවමනා ප්‍රමාණය ලකුණු කළා. ඉඩම් අයිතිකාරයන් එකසිය තිස් ගණනක් ඉන්නවා. හදිසි නීති යටතේ ඒ ඉඩම් පවරා ගත්තා. අසවල් දවසට පෙර තම තමන්ගේ ගොඩනැගිලි කඩා ඉවත් කර ගන්නය කියා ඉඩම් අයිතිකාරයන්ට කිව්වා. ඒ ඉඩම් අයිතිකරුවන්ගෙන් එක් කෙනකු හැර නීති ගරුක අනික් සියළු දෙනාම තමතමන්ට අයිති ගොඩනැගිලි කඩා ඉවත් කර ගත්තා. අර නැනැත්තා හැරෙන්නට අනික් සියළු දෙනාම කිසි අවහිරයක් කළේ නැහැ; ඒ වැදගත් කර්මාන්තය ඇති කිරීමට සම්පූර්ණ සහයෝගය දුන්නා. ඒ අය තමන්ගේ ගොඩනැගිලි කඩා ඉවත් කරගෙන මායිම් ගල් පිටිපස්සට ගත්තා. මා කිව්වා එක් කෙනෙක් සහයෝගය දුන්නෙ නැත කියා. කිරිබත්ගොඩ හන්දියේ තත්ත්වය ගැන ගරු රාජ්‍ය ඇමතිතුමාටත් හොඳ දැනීමක් තිබෙනවා. තොරණ හන්දියේ ගොඩනැගිල්ල සම්බන්ධ සිද්ධියට හවුල් වුණු නැනැත්තම —

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

එයා මට විරුද්ධව වැඩ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)
පළමුවෙන් පක්ෂව වැඩ කළා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
පස්සෙ විරුද්ධ වුණා.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)
දේශපාලනය ගැන සලකන විට ඒක ස්වභාව ධර්මයක්. එයා අපේ පැත්තට කොහොමටවත් හිටියෙ නැහැ. [බාධා කිරීමක්] කොයි පැත්තට හිටිනවද දන්නෙ නැහැ, ඔහේ ඉන්නවා. ඒ විලේගොඩ මහත්මයට අයිති ගොඩනැගිලි කැඩුවෙ නැහැ. ඒ ප්‍රදේශයේ මහ පාර පළල් කිරීමට හොඳ වෙළඳසැල් තිබුණු ගොඩනැගිලි කැඩුවා. දැන් ඒ පැත්තෙන් ගොඩනැගිලි කඩලා, මේ පත්තෙන් ගොඩනැගිලි කඩලා, ඉංග්‍රීසියෙන් කියනවා නම් මොනියුමන්ට් එකක් වගේ විලේගොඩ මහත්මයාගේ ගොඩනැගිල්ල පාර මැද්දේ තිබෙනවා. මේ පාර පළල් කිරීමට ගොඩනැගිලි කැඩීම නිසා සමහරුන් වෙළඳාම නැති කර ගත්තා. සමහරුන් ඉන්නට තැන් නැතිව අද පැල්පත්වල ජීවත් වෙනවා.

මේ සම්බන්ධයෙන් සැලකිය යුතු කරුණු දෙකක් තියෙනවා. ගොඩනැගිලි අයිතිකාරයන් ඒවා ඉවත් කරගෙන දැනට අවුරුදු ගණනක් ගත වී තිබෙනවා. එහෙත් ඒ ගොඩනැගිලි අයිතිකාරයන්ට වන්දි වශයෙන් මේ මොහොත දක්වා ශතයක්වත් ගෙවා නැහැ. ඒ අතර දැනට අවුරුද්දකට පමණ පෙර ඒ විලේගොඩ මහත්මයාගේ ගෙදර දේශපාලන බණක් කිව්වා. ඒක වගා බණක් නොවෙයි, දේශපාලන බණක්. දේශපාලන සංඝයා වහන්සේ නමක්—දැවමොට්ටාවේ අමරවංශ ස්වාමීන් වහන්සේ—විලේගොඩ මහත්මයාගේ ගෙදර දේශපාලන බණක් කිව්වා. සද් ගුණවත්, සද් කීර්තිමත්—නමුත් හිඟන්නකුට ශතයක්වත් නොදෙන — මේ මහත්මයට [illegible] දෙන්නය කියා බණක් කිව්වා. විලේගොඩ මහත්මයා සෑහෙන පුණ්‍ය කර්මයක් කරල තියෙන බව — දානයක් දීල තියෙන බව —පෙනෙනවා. ටික දිනකට පසු අරුම පුදුම සිද්ධියක් ඇති වුණා. මා කතෝලික යෙක්. මා මේ ගැන හරියට දන්නෙ නැහැ. මගේ නොදැනීම ගැන මා සමාව ඉල්ලනවා. බෞද්ධ ස්වාමීන් වහන්සේලා පී. ඩබ්ලිව්. ඩී. ඉංජිනේරුවන් හැටියට වැඩ කරන බව මා දැනගත්තේ ඊට පසු වයි. දැවමොට්ටාවේ අමරවංශ හාමුදුරුවො ඉංජිනේරුවන් සමග ඇවිත් මහ දවල්, මහ පාරේ මායිම් ලකුණු කළා. වේප් එක ඔහෙන් අල්ලපන්, මෙහෙන් අල්ලපන්, මේ ඉඩමට අත තිබ්බොත් මම උපවාස කරනවා, මේක මේ විධියට කරන්න ඕනෑය කියා නියෝග කළේ ඒ ස්වාමීන් වහන්සේයි. ඒ විධියට නියෝග කරන ඉංජිනේරුකම ඒ ස්වාමීන් වහන්සේට දුන්නේ කවදාද කියා මා දැන ගන්නට කැමතියි. ඊට පසු විලේගොඩ මහත්ම යාගේ ඉඩම ගැනීම නතර කර නැවත ගැසට් නිවේදනයක් නිකුත් කර තිබෙන බව මට ආරංචියි. ලැජ්ජයි, බොහොම ලැජ්ජයි. මේ විධියට කටයුතු කිරීම ගැන ආණ්ඩුවක් ලැජ්ජා වන්නට ඕනෑ. ඉඩම් ඇමතිතුමා මේ ගැන වග කියන්නට ඕනෑ. ඉඩම් අමාත්‍යාංශයේ නියෝගයක් උඩ ඒ ඉඩම ගැනීම — ඒ ගොඩනැගිල්ල කැඩීම — නතර කර තිබෙනවා. පාර දෙපැත්තේම අනික් ගොඩනැගිලි කඩා වැටවල් පස්සට අරගෙන තිබෙනවා. මේ ගොඩනැගිල්ල මහපාර මැද්දේ අදත් පෙනෙන්නට තියෙනවා. නීත්‍යානුකූලව කටයුතු කර මේ වැරදි හදනවද කියා මා අහනවා. ලැජ්ජා නැති වැඩ කිරීම ගැන මා මේ ආණ්ඩුවට චෝදනා කරනවා. ඉඩම් මැදින් පාරවල් හදන්නට සැලසුම් කර ඉඩම් රජයට අත් පත් කර ගැනීමට නියෝග කරනවා. එහෙත් තමන්ගේ පක්ෂයට සම්බන්ධ උදවියගේ ඉඩම්, ගොඩනැගිලි, කඩ පේළි පාර මැද තිබෙන්නට ඉඩ හරිනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
එයා මට විරුද්ධව වැඩ කළා. අපට සම්බන්ධ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

ඒක නිසා තමයි දැන් ඒක ඉතුරු කරල තියෙන්නෙ! ඔය පැත්තෙ නොයෙක් කණ්ඩායම් ඉන්නවා.

අනික් කාරණය, දැන් අවුරුදු ගණනක් වෙනවා, අනික් එකසිය තිස් ගණනටම තවම සත 5ක් වත් දීල නැහැ. කලින් බොහොම හොඳින් ගෙවල්වල ජීවත් වූ උදවිය මේ නිසා අද පැල්පත්වල ජීවත් වන බව කියන්නෙ කනගාටුවෙන්. ඉඩම් පාරට අසු වූ නිසා ගෙවල් කැඩුණා. ගෙයක් හදා ගන්න ඉඩමක් මිළ දී ගන්න මුදල් ලැබුණෙ නැහැ. ඒ නිසා ඉඩම් අමාත්‍යාංශයෙනුත් අනිකුත් අමාත්‍යාංශවලිනුත් මා එක්තරා ඉල්ලීමක් කරන්නට කැමතියි. රටේ දියුණුවට අදාළ වන, රටේ සංවර්ධනයට ඉවහල් වන මහජන කටයුතු සඳහා පෞද්ගලික ඉඩම් රජයට අත් කර ගැනීමට සිදු වෙනවා. ඒ තත්ත්වය අපි පිළිගන්නවා. එහෙත් ඉඩම් රජයට අත් කර ගැනීමෙන් පසු ඒ ඉඩම්වලින් වෙන් වී යන අයිතිකාරයින්ට කලට වේලාවට ඒ වෙනුවෙන් ලැබිය යුතු මුදල් ලැබෙන්නට සලස්වන්නට ඕනෑ. අද රටේ අපට වුවමනා හැටියට ඉඩම් මිළයට ගන්නට පුළුවන් කමක් නැහැ. ඉඩම් වෙළඳාම අද කළුකඩ ව්‍යාපාරයක් වගේ දෙයක්. ඉඩමක් මිළ දී ගැනීම බොහොම අමාරුයි. විශේෂයෙන් අපේ ප්‍රදේශවල ඉඩම් හිඟ නිසා ඉඩමක් මිළ දී ගැනීම හරි අමාරු වැඩක්. මා කලින් සඳහන් කළා, මා දැන් සඳහන් කළ පාර තැනීම සඳහා ඉඩම් ලබා ගත් උදවියට තවම මුදල් ගෙවා නැති බව. ඒ නිසා මෙයම ප්‍රශ්නයක් කොට ගෙන හදිස්සියේ හෝ වේවා, හදිසියක් නැතිව හෝ වේවා, යම්කිසි මහජන කටයුත්තක් සඳහා ඉඩමක් රජයට පවරා ගත් විට එහි ඔප්පු හා අයිතිය පිරිසිදු නම් වහාම එහි අයිතිකරුවන්ට එම ඉඩමේ වටිනාකම ගෙවන ලෙස සෑම අමාත්‍යාංශයකටම නියෝගයක් කරන්නට ඕනෑ බව මා මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවෙනි වර පෝර කර්මාන්තශාලාව වෙනුවෙන් ලබාගත් ඉඩම් වෙනුවෙන් දැන් මුදල් ගෙවා තිබෙන බව මා දන්නවා. එහෙත් ඒ මුදල් ගෙවීම තරමක් ප්‍රමාද වීමේ හේතුවෙන් සමහර පවුල්වලට පැල්පත්වල ජීවත් වන්නට සිදු වුණා. එතැන දීත් වරදක් සිදු වුණා. තෙල් පිරි පහදුව තැනීම සඳහා සපුගස්කන්දේ ඉඩම් ලබා ගන්න අවස්ථාවේදී එවකට සිටි ඇමතිතුමා වන මෛත්‍රීපාල සේනානායක මහත්මයාට මම දැනුම් දුන්නා, "ඒ ඉඩම්වල පදිංචිව සිටින්නේ මුල් ගම්කාරයන් නිසා ඔවුන්ට යන්නට වෙනත් ස්ථානයක් නැත, අවුරුදු සිය ගණනක් පරම්පරා කිහිපයක් ජීවත් වූ ගමේම ජීවත් වන්නට ඔවුන් ආසා කරන නිසා ඒ අවටින් ඉඩමක් ලබාගෙන ඔවුන්ට පදිංචි වීම සඳහා එය සකස් කර දෙන්න" කියා. එවකට සිටි ඇමතිතුමා ඒ ඉල්ලීම ඉටු කළා. ඒ අවට බටලන්ද කියන ප්‍රදේශයෙන් ඉඩම් ලබාගෙන ඉඩම් අහිමි වී ගිය උදවියට පදිංචි වන්නට ඉඩම් කොටස් ලබා දුන්නා. එහෙත් පෝර කර්මාන්ත ශාලාව සඳහා පසුව ඉඩම් ලබා ගත් අවස්ථාවේදී එහෙම දෙයක් සිදු වුණේ නැහැ. එහෙම කළා නම් බොහොම අගෙයි. ඒ උදවිය දැන් ජීවත් වන්නේ ඉබාගාතෙයි. සමහර උදවිය අනුන්ගේ ගෙවල්වල ජීවත් වන අතර තවත් සමහරු අනුන්ගේ අගුවල ජීවත් වෙනවා.

රජය ඉඩම් පවරා ගන්න මිළට පුද්ගලයින්ට ඉඩම් මිළ දී ගන්නට බැහැ. ඒ නිසා යම්කිසි පොදු මහජන කටයුත්තක් සඳහා රජය මඟින් යම්කිසි ගමක ඉඩම් රජයට පවරා ගැනීමේදී තමන්ගේ පදිංචිය අහිමි වන උදවිය සිටිනවා නම් ඒ උදවියට පදිංචි වීම සඳහා ඒ අවට ප්‍රදේශයකින් රජයේ තක්සේරු අනුව සාධාරණ මිළකට ඉඩම් කැබලි ලබා දීම රජයේ පරම යුතුකමයි. රජයේ තක්සේරු අනුව යම්කිසි ඉඩම් කැබැල්ලක් වෙනුවෙන් රජය රු. 10,000 ක් ගෙව්වොත්, ඒ රු. 10,000 න් තමන්ගේ ඉඩමේ ප්‍රමාණයෙන් දෙකෙන් පංගුවක තබා හතරෙන් පංගුවක තරමවත් විශාල ඉඩමක් මිළ දී ගන්නට බැහැ. ඒ නිසා ඒ කටයුත්ත ගැන හොඳින් කල්පනා කර බලන්න ඕනෑ. පොදු කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීමේදී රජය කළුකඩ මිළට ඉඩම් ගන්නෙ නැහැ. සාමාන්‍ය මිළ හෙවත් වෙළඳපොලේ මිළත් රජය ගන්න මිළත් සංසන්දනය කර බැලුවාම රජය ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිල දී ගන්නේ ඉතාම අඩු ගණනකට බව පෙනී යනවා. එහෙම නම් රජය අඩු ගණන් ගෙවා ඉඩම් ලබා ගන්න මිනිසුන්ට වෙනත් ස්ථානවලින් රජය මගින්ම ඉඩම් ලබා දීම සුදුසුයි. ඒ නිසා ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, පෝර කර්මාන්තශාලාව තැනීම සඳහා ඉඩම් ලබාගත් උදවියගෙන් සමහරු තවමත් දුක් විඳින නිසා ඔවුන්ට සහනයක් සලසන්න කියා. ඔවුන්ගේ ගෙයත් කැඩුණා; ඉඩමත් නැතිව ගියා. ආණ්ඩුවේ තක්සේරුව අනුව අතට ලැබුණේත් මුදල් ටිකයි. ඒ මුදලින් ඉඩමක් මිල දී ගන්න අමාරුයි. ඒ නිසා අද ඔවුන්ට පදිංචි වන්නට තැනක් නැහැ. මා ඉල්ලා සිටින්නේ මුල් පිරිසට ඉඩම් ලබා දුන්න බටලන්දේම තවත් ඉඩම් තිබෙන නිසා මේ උදවියටත් ඒ ප්‍රදේශයෙන්ම ඉඩම් කොටස් ලබා දෙන්න කියායි. ඒ ඉඩම බොහොම පරණ රබර් වගාවක් තිබෙන ප්‍රයෝජනයක් නැති ඉඩමක්. පළමුවෙන් තෙල් පිරිපහදුවට ඉඩම් යට වූ උදවියට පදිංචි වීම සඳහා අපි ඉඩම් ලබා දුන්නේ ඒ විධියේ ඉඩමකිනුයි. ඒ නිසා පොහොර කර්මාන්ත ශාලාව නිසා ඉඩම් අහිමි වූ අයට බටලන්දෙන්ම ඉඩම් ලබා දුන්ණොත් ඔවුන් ලබන මුදලෙන් ප්‍රයෝජනයක් ලබන්නට පුළුවන් වෙනවා. රජය කලින් ඉඩම් ලබාගත් තැනැත්තාගේම ඉඩම් බටලන්දේ තිබෙනවා. අයිතිකාරයාත් ලක්ෂපතියෙක්. දරුවනුත් නැහැ. ඒ රබර් වත්තෙනුත් ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා පදිංචියට තැනක් නැතිව ඉබාගාතේ ඉන්න ඒ පවුල් සිය ගණනට බටලන්දෙන් ඉඩම් ලබා දුන්ණොත් එය ඉතාම වැදගත්. එසේ වුණොත් ඔවුන් ලැබූ මුදලෙන් ප්‍රයෝජනයක් ලබා ගන්නට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවට නොමැකෙන කැළලක් ඇති වුණු අරවිලේගොඩ මහතාගේ ඉඩම රජයට ගැනීම සම්බන්ධයෙන් කළ ඒ කැත කටයුත්ත නැවත නිරාකරණය කරන්නයි මා මේ කරුණු ඉදිරිපත් කරන්නේ. තමුන්නාන්සේලා පාරවල් හදන්නේ පාර මැද ගෙවල් තබා ගෙනද?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
ගස් නම් තිබෙනවා.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)
එක ගහක්වත් නැහැ. ඒ ගොඩනැගිල්ල තවම තබාගෙන ඉන්නේ මොකක් සඳහාද? ඉංජිනේරුවන් එක් කරගෙන ඇවිත් ඕවා මන්නවන්නට දැවමොට්ටාවේ අමරවංශ හාමුදුරුවන්ට තිබෙන බලය කුමක්ද? අනික් අතට බුලර්ස් පාරෙන් දුන්නානේ? කිරිබත්ගොඩිනුත් දෙන්නද හදන්නේ? මේ වැඩේ වැරදියි. ගරු ඇමතිතුමා ගිහින් බලන්න. මේ පැත්තෙනුත් කඩලා; අර පැත්තෙනුත් කඩලා; පාර මැද කඩ පේලියක්. සල්ලි තිබෙනවා නම් කරන්න බැරි දෙයක් නැත කියා ඔහු ප්‍රසිද්ධියේ කියනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
එයා මට විරුද්ධවත් වැඩ කළා.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)
මට විරුද්ධවත් වැඩ කර තිබෙනවා. මා මෙය කියන්නේ ඒ නිසා නොවෙයි. ඒ මහත්මයාත් සමග මගේ දේශපාලන විරුද්ධයක් නැහැ. ඒ මහත්මයා දන්න දේශපාලනයකුත් නැහැ. හම්බ කරන්න පමණයි දන්නේ. ඒ ගැන නොවෙයි ප්‍රශ්නය. මේ වැඩේ ආසාධාරණයි. ඉඩම් රජයට ගත් ඒ 132 දෙනාගෙන් වැඩි හරිය මගේ විරුද්ධකාරයින්ය කියලයි මා හිතන්නේ. එය වෙනම ප්‍රශ්නයක්. දේශපාලන පොර පිටියේදී ඒ ගැන බලා ගනිමු. අසාධාරණයක් වෙනවා නම් කාට වුණත් අසාධාරණය අසාධාරණයමයි. ඒ එක්කෙනෙකුටවත් මුදල් ගෙව්වේ නැහැ. විලේගොඩ මහතා නම් බේරුණා. දැවමොට්ටාවේ අමරවංශ හාමුදුරුවන්ටත් සෑහෙන දානයක් ලැබුණා වගේ මට පෙනෙනවා.

**ටී. බී. ඉලංගරත්න මයා.**
*(திரு. ரீ. பி. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ආමිස පූජාවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එස්. පෙරේරා මයා.**

*(திரு. ஆர். எஸ். பெரோரா)*

(Mr. R. S. Perera)

මේවා රජයන් කුණු වන සිද්ධීන්. ඒ නිසා මේ ගැන වහාම රජය කටයුතු කරන්න.

අවසාන වශයෙන් නැවතත් මතක් කර නවා අර ක්‍රීඩා භූමිය ගැන. සුළු නගර සභාව අවුරුදු ගණනාවක සිට ඉල්ලා සිටින ක්‍රීඩා භූමි, පාරවල්, සුසාන භූමි ආදිය ඉක්මනින් ලබා දෙන්න. ඒවා මට නොවෙයි, මහජන යාටයි. මා මැරුණත් වළලන්නේ ඒ පිට්ට නියේ නොවෙයි. ඒ ගැන බය වෙන්න එපා. ඉල්ලුවේ ඒකට නොවෙයි. මට මො නවා වුණත් කමක් නැහැ. මහජන කටයුතු සඳහා ඉල්ලන ඉල්ලීම් ගැන සාධාරණව සළකා බලා කටයුතු කරන්න.

විශේෂයෙන් පාර පිළිබඳ කටයුත්ත ගැන මා ඇමතිතුමාට මතක් කරනවා. පාර මැද ගෙවල් තබාගෙන පාර හදන්න නම් එපා. ඔය වැඩේ නම් කරන්න එපාය කියා ඉඩම් ඇමතිතුමාටත් මා කියනවා.

සපුගස්කන්දේ කර්මාන්ත ශාලාව නෙක් ඒකසිය ගණනකගෙන් ගත් ඉඩම් වලට ඉක්මනින් මුදල් ගෙවන්න. අවුරුදු ගණනාවක් ගත වී තිබෙනවා. කොහේ හෝ මුදල් ඇති. ඒවා තැන්පත් කර තැබීමෙන් වැඩක් නැහැ.

මීට වඩා කථා කරන්නට මා බලාපො රොත්තු වන්නේ නැහැ. මේ වගේම දුක් විඳින පළාත් පාලන ආයතන තවත් තිබෙ නවා. පාරවල්, ක්‍රීඩා භූමි, සුසාන භූමි ආදී පොදු කටයුතු සඳහා ගත යුතු ඉඩම් තිබෙ නවා. ඒවා ඉක්මනින් ලබා දෙන්න. මා සඳහන් කළ අර ප්‍රශ්න දෙක ගැන කළ ඉල්ලීම ගම්සභාව කාලයේදී පටන් ගත්තා. ගම්සභාව ඉවර වී සුළු නගර සභාවක් බවට පත් වුණා. සුළු නගර සභා වේත් පළමු වැනි කාලපරිච්ඡේදයත් ඉවර වුණා. දෙවැනි කාලපරිච්ඡේදය ඉවර වන් නටත් තව අවුරුද්දයි තිබෙන්නේ. තව මත් වැඩ ඉවර නැහැ. පොදු කටයුතු සඳහා යයි ඒ ආයතනවලට පත් වන නියෝජිත යින් යෝජනා ඉදිරිපත් කර තීන්දු කර රජයට ඉදිරිපත් කළාට ඇති වැඩක් නැහැ. නිකම් මහජනයාගේ හාස්‍යයට ලක් වෙනවා පමණයි. " සුසාන භූමියක් ඉල්ලුවා, නමුසෙත් එය සම්මත කළා, වැඩි හරියක් මැරීගෙනත් යනවා, නමුසෙත් ඉන්නවා සුසාන භූමියක් නම් නැහැ" කියනවා. අන්න ඒ නිසා විශේෂයෙන්ම පළාත් පාලන ආයතන මගින් පොදු කටයුතු සඳහා ඉඩම් ලබා ගැනීමට කරන ඉල්ලීම් සාධාරණ යයි තීරණය කරනවා නම් හා නගර නිර්මාණ ශිල්පියා එය හරියි කිය නවා නම්, කරුණා කර එය ඉටු කර දෙන්න. එසේ නැත්නම් පළාත් පාලන ආයතනවල නියෝජිතයින් හැටියට පත් වීමෙන් වැඩක් වන්නේ නැහැ; අර්ථය කුත් නැහැ.

මෙවැනි තවත් තැන් තිබෙනවා. නමුත් නාන්සේලාගේ පක්ෂයේ, අගලවත්තේ විජේතුංග මහත්මයා මා සමග කීවා, මොකක්දෝ කටයුත්තක් සඳහා සල්ලි බැඳ ඉඩමක් ඉල්ලා දහඅට අවුරුද්දක් ගත වී ඇතත් තවම ලැබුණේ නැත කියා. ඉඩම් ඇමතිතුමාත් ඒ දහඅට අවුරුද් දෙන් දහතුන් අවුරුද්දක්ම ඉඩම් ඇමති ධුරය දැරුවා. නීතියත් තවම එහෙමමයි. කච්චේරියේ ඉඩම් ගැනීම සම්බන්ධයෙන් ඉන්නේ එකම නිලධාරියකු පමණයි. ඒ නිලධාරියා දවසක් මට කීවා, " ආර්.එස්., ඉඩම් සම්බන්ධ කටයුතු පිළිබඳ ලිපිගොනු 600 ක්ම මට තිබෙනවා, ඉතින් කොහො මද ඉක්මන් කරන්නේ " කියා. ඇත්ත වශයෙන්ම එක් නිලධාරියකුට භාර වී ඇති ලිපිගොනු සංඛ්‍යාව වැඩියි. එම නිසා ඒ කටයුතු සඳහා තව තවත් නිලධාරීන් පත් කරන්න. ඇමතිතුමා මෙවැනි සංශෝධිත පනත් කෙටුම්පත් ඉදිරිපත් කළාට මදි. මේ කටයුතු පමා වන්නේ ඇයිද කියාත් හොයන්නට ඕනෑ. ඉල්ලීම් ඉදිරිපත් කර අවුරුදු 18 කට පසු ලැබෙන මිනී පිටියෙන් ඇති වැඩේ මොකක්ද? දොළොස් අවුරුද් දකට පසුව පාරක් ලැබීමේ තේරුම මොකක්ද? වඩා ප්‍රයෝජනවත් අන්දමට මේ පනත සංශෝධනය කරනවා නම්, මෙපමණ කාල සීමාවක් ඇතුළත මේ වැඩය නිම කරන්න ඕනෑය කියා නිලධා රීන්ට බල කෙරෙන නීති රීතිත් දමන් නට ඕනෑ. ඔප්පු පිරිසිදු නම්, කටයුත්ත නීත්‍යනුකූල නම්, ඉඩම ගත යුතු නම්, නිර් දේශ කෙරෙනවා නම්, එවැනි කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අසුවල් කාල සීමාව ඇතුළත නිම කළ යුතු යයි නියම කරන්න බැරි ඇයි? මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

පූ. භා. 10.52

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Mr. Deputy Speaker, I am sorry that my good Friend, the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) is not here, but in view of certain remarks he made in the course of his speech yesterday, which I am quite certain in my own mind he made without knowing the true facts, I would like to explain briefly the position to the House.

The hon. Member for Agalawatta referred in the course of his speech to the Ratwatte case. He quoted from the "Daily News" report of the judgment of Mr. Justice Samerawickreme.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(திரு. ஆர். எஸ். பெரேரா)
(Dr. N. M. Perera)

That is all he did.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

What I would like to say is that if he had read the next paragraph of the judgment of the learned judge, which was also reported in the "Daily News", he would have set the matter in correct perspective. The hon. Member also made certain observations about the lands of the hon. Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing (Mr. S. de S. Jayasingha) and of Senator Piyasena. I want to say a word about those two matters.

In the course of his judgment in the Ratwatte case, the learned judge said this also:

"In fairness to the persons against whom the petitioners have made allegations, I should state that this court is not called upon at this stage to consider the truth of the petitioners' case and it has not done so. In fact, this court has not heard what the other persons have to say on the subject. As indicated earlier, my order was made ex-parte and, even upon the application made by the respondents, occasion has not arisen for going into the question of fact."

I am glad that this amendment has been accepted by the Opposition and by the Government, because hon. Members in the Opposition Front Bench know that when they were the Government such problems arose.

When an application goes before a district court, the district judge fixes the date of hearing according to the state of the roll. If it is a light roll, then with a certain amount of luck the matter might be taken up in three months, but if it is a heavy roll it might take one year or even two years before the matter is settled, with the result that an important development programme of the Government is held up.

We completely agree that the inherent rights of the individual must be maintained, and you cannot get a better forum for the preservation of those rights than the courts of law in this country.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

Hear! hear!

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

There is not the slightest doubt about it. We hold that view. When we were in the Opposition we always maintained that the judiciary of this country must hold the scales even in all matters of dispute. We have no quarrel about that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

The Government and the Opposition have accepted the amendment because the intention is to expedite acquisition. If an acquisition is *mala fide*, by all means reject it and let there be no appeal on that.

Now, Sir, these acquisitions are made on the recommendations of experts. The Minister of Land, I am telling you, does not know a thing about——

ඉලංගරත්න මයා.
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

Anything!

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The departmental heads make their representations to the Permanent Secretary and the Permanent Secretary puts the matter before the Minister, and the Minister being the authority under the Act to issue the order, he does so. He does not know whether it is Ratwatte's land that is involved or whether it is Aboosally's land that is involved. He goes on the report that is placed before him by the Permanent Secretary and the planning section of the Ministry.

It is interesting to note that the construction of the Balangoda bypass was first considered on a resolution passed unanimously by the Urban Council, Balangoda, on March 3, 1962.

ගරු ප්‍රේමදාස
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

Who was the Chairman?

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I do not know who the chairman was. I am sorry, I am coming to that. At that time Mr. C. S. Ratwatte, Member of Parliament, was the chairman of the urban council.

The resolution of March 1962 is to the effect that the road from the bus stand to the resthouse approach road and from Koya Hotel to the bridge 9 1/4 should be widened to ease congestion of traffic on the main road. The department considered several schemes of improvement and in 1964 adopted as a temporary measure the one-way traffic scheme by means of which traffic bound towards Haldummulla was diverted through a narrow by-pass road, the resthouse approach road, whilst traffic going in the direction of Ratnapura was permitted to travel along the main road. Up traffic had to be diverted.

On further representations made in 1967 by the urban council, the D. P. W. commenced investigations and a study was made by the Traffic and Planning Division of the P.W.D. on the alternative method of easing congestion—for instance, the widening of the existing main road. The other was providing a by-pass through Balangoda town for through traffic. As the cost involved in widening the main road through the heavily built up bazaar area was too high and traffic congestion would continue in the bazaar area even if it was widened as local traders would continue to park their vehicles on it, the construction of a by-pass for through traffic was recommended by the department. Several places for by-pass roads were examined by the P.W.D. and it had been finally decided to widen an existing road which is called the "Old Road". This road, being known as the "Old Road", must have existed even before the Ratwattes were born. The road platform here was only 10 feet wide at certain areas and 23 feet wide

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

at certain areas; the carriageway was from 7 to 8 feet, and there were no road reservations.

As the urban council had agreed to hand over the "Old Road" for widening and improvement to the department, plans and designs were prepared by the department between July and August 1967. The provision of by-passes on trunk roads passing through heavily built up areas is an accepted method of diverting through traffic in congested and busy commercial areas where there is not only a congestion of traffic but also a concentration of pedestrians. Such by-passes had been constructed in the past in Negombo, Panadura and Ambalangoda. Similar by-pass roads are now under construction at Weligama and Galle. Proposals have been finalized and acquisition proceedings have been initiated for the construction of by-pass roads at Balapitiya and Dondra. In the construction of bypass roads acquisition of land is inevitable, and certain owners of land have objected on the ground that their private interests are adversely affected.

The total length of the bypass road is .63 miles, which is less than a mile. The land to be acquired for road widening and improvement comprises 55 lots—now this is very important—ranging in extent from .21 perches to 31.10 perches. The total extent of acquisitions involved is 2 acres, 1 rood, and 27.74 perches. Claimants of 35 of the 55 lots of land to be acquired had no objection to the acquisition.

Road formation on the first quarter mile has already been completed. In this quarter mile, the land to be acquired varies in width from 42 ft. to 53 ft. In the second quarter mile, the width varies from 45 ft. to 48 ft. and in the third quarter from 42 ft. to 45 ft.

The original designs provided for a road formation width of 52 ft. and a carriage way of 40 ft. On the 3rd of October 1968 the road had been inspected by the Government Agent of the Ratnapura District, the Deputy Director of the Public Works Department, the Chief Engineer Designs and the Chairman of the Urban Council, in the presence of the objectors.

Out of consideration for the land owners, the original designs were revised by the department and traces amended to avoid, as far as possible, the acquisition of buildings. The maximum possible reductions were also made in the standard adopted by the department in the construction of main roads. The road formation width of 52 ft. originally designed for the second and third quarter miles had been reduced to 42 ft. and the carriageway from 42 ft. to 30 ft.

To create the least amount of hardship to private owners we went to that extent. As I said the total extent involved is 2 acres, 1 rood and 27.74 perches. Of the 55 lots, only 5 lots are owned by the Ratwattes, and the total extent of the Ratwatte holding is 29 perches. Sir, the Ratwattes are aware that there are 160 perches to an acre and the extent of their land that is to be acquired is only 29 perches.

I shall now give you how this extent is split up, this 29.12 perches to be exact. I am going to table this. C. S. Ratwatte, the owner of lot No. 37 owns .30 perches ; Dr. M. Ratwatte, the owner of lot No. 30, owns 2.31 perches ; and Dr. S. Ratwatte owns 8.90 perches. The other Ratwatte is Mr. B. S. C. Ratwatte who owns 9.98 perches and also lot No. 38 which is 7.63 perches in extent. Mr. B. S. C. Ratwatte was not a party to the injunction.

So, what is the final result ? Mr. C. S. Ratwatte and Dr. M. Ratwatte are objecting to the acquisition of 2.61 perches, and Dr. S. Ratwatte to the acquisition of 8.90 perches. The total area of their objection is a little over 11 perches.

Now, if they object to a bypass road and that on the ground that 11 perches is to be acquired, it is ridiculous. I cannot understand why they should



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

object to it because this bypass road will help to develop the whole area and will help to provide a network of roads which will be in the national interest. I am glad the Public Trustee has not been a party to the injunction at all. That is why I am so happy that this House has accepted this amendment. What does Justice Samarawickrame's judgment mean ? It means that the case goes before the district court. But no time has been fixed by Justice Samarawickrame for the case to be taken up before the district court. They may take even six months to file an action in the district court, and the district court roll may be such that the case might come up 1½ years hence, and it will be Doomsday before the matter is settled. That is why the Government has brought this Bill, so that within a matter of three months the Supreme Court would hear the case and we shall be able to go ahead with our development programme.

The hon. Member for Agalawatta perhaps did not know these facts when he said what he did. If he knew, I am sure he would not have made those remarks. But, since certain statements were made and the Parliamentary Secretary and Senator Piyasena case to see me, I only want to state the facts.

The hon. Member said that the land belonging to the Parliamentary Secretary and Senator Piyasena has been left out whilst Mr. Costa's land is to be taken over. The facts with regard to this matter are these. The then Mayor of Dehiwala-Mount Lavinia, Mr. S. de S. Jayasingha, and Major L. V. Gunaratne came to see me on 24.4.68 at the Ministry. The then Mayor of Dehiwala-Mount Lavinia and Major Gunaratne stated that this is a highly built up area and that a large number of buildings would be affected by the proposed acquisition. The Mayor further stated that the owners had no objection to the acquisition of the land, leaving out the houses. He requested that the houses be left out and the proposed width of the acquisition be reduced. It was finally decided by the Minister that the acquisition be such as to enable the road to be widened to 42 feet, but that the street line be marked at 60 feet. The original intention was to widen the road to 60 feet.

The point made by my hon. Friend, the Member for Agalawatta, was that as a result of all this Senator Piyasena is being benefited, and that Mr. Costa is going to be hit badly. Now, I have with me the note sent to me by my Permanent Secretary, and he says that the statements made by the hon. Member for Agalawatta are incorrect. The original widening of Hospital Road from Galle Road to the hospital was done some years ago. Subsequently, after the present Government took office, steps were taken to widen the road from the hospital to Kohuwala Junction. This presumably is the half mile referred to by the hon. Member.

The original application made by the Ministry on the recommendation of the officers of the P. W. D. who had prepared the designs, was an acquisition to widen the road to 60 feet. That application included only six perches of land belonging to Senator Piyasena, six perches belonging to Mr. Nelson de Costa and 4½ perches belonging to Mr. Siritunga de Costa. No objections were lodged to the acquisition by Senator Piyasena while an objection had been mdae by Mr. Nelson de Costa. While acquisition proceedings were in progress a deputation consisting of the then Mayor of Dehiwala-Mount Lavinia, Mr. S. de S. Jayasingha, and the preset Mayor, Major L. V. Gunaratne, interviewed me on 24.4.68 and requested that the width of the road be reduced to 42 feet. This was agreed to by me and a fresh application was accordingly made. In the revised application 11 perches belonging to Senator Piyasena are beig acquired, while acçording to the original application only six perches belonging to him were to be acquired.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

So where is this partiality for Senator Piyasena? I will make all the files available to the hon. Member. I will get my Permanent Secretary to show him all the tracings and files. What has happened is that, instead of six perches, 11 perches are now being acquired from the land belonging to Senator Piyasena, while the extents belonging to Messrs. Nelson de Costa and Siritunga de Costa taken over have been reduced to 4½ perches belonging to the first Mr. de Costa and 3½ perches belonging to Mr. Siritunge de Costa. Here Senator Piyasena gives more land while the Costas are giving less land. I am sure my good Friend, the hon. Member, was not aware of the facts. The point made by him was that because Senator Piyasena was a U. N. P. Senator or a sympathizer with the Government, we are showing favouritism to him .But what has happened is quite the reverse. I have shown that Senator Piyasena is getting a harder whack than before. One could construe from this—it was generally under stood; at least I understood it that way—that what they are saying is that these things are done to favour certain individuals as against certain others.

In regard to the question of the hon. Member for Kelaniya, Wilegoda is by no means a supporter of this Government.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

Why not? He is an "A" Class, Grade I, supporter.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

He is anti-J. R.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

He is anti-J. R. due to a personal matter.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

If Wilegoda is against the Minister of State, then he is against the Government.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

No, no, he is an "A" Class, Grade I U.N.P.'er.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

He is pro-Dudley and anti-J. R.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

There are two factions in your party: you know that.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I think we have had enough humour on this matter. Really, the facts are these. I myself did not want to leave out Wilegoda's land. When Mr. Sam P. C. Fernando came with Wilegoda, I refused.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Hear, hear! What does that mean?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

Sam P. C. Fernando came as a lawyer, he did not come as a member of the S. L. F. P. and he was entitled to see me. I said "No, I want to acquire it."

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

Who said, "Yes"?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Wilegoda knows it very well. He was very annoyed with me. I said, "No, I am sorry, I am not going to stop acquisition." Mr. Sri Khanta is here, he knows about it. Then what happened? Representations were made.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

By whom?

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Well, representations were made, but do not ask me by whom.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

By your "executive engineer", Rev. Devamottawe.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

And I asked whether this is going to hinder him any way. Wilegoda's point was that he spent some money, nearly Rs. $1\frac{1}{2}$ to Rs. 2 lakhs.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

It is an old and dilapidated building; there was no investment.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

What I did was, I sent my Designs Engineer with Wilegoda. But whom else Wilegoda approached I do not know. I sent an engineer with Wilegoda to look into the objection. The report came to me from the Designs Branch that there will be no hindrance. You know, large bowsers have to go on that road. The engineer's report is that there is no hindrance, and the smooth flow of traffic will be ensured. Wilegoda's house is standing like a monument. I can assure you that whatever happens, if, after further consideration, the Petroleum Corporation desires Wilegoda's land to be acquired, I will send the acquisition papers to the Ministry. If the Petroleum Corporation writes to me tomorrow——

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

Lionel Gunatilleke.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

Why do you mention Lionel Gunatilleke's name? What has that got to do with this? He has never seen me any day on this matter. After all, he is entitled to see me. If the Petroleum Corporation writes to me tomorrow that it wants the Wilegoda buildings acquired—I can give this assurance to the House—I will send a requisition to the Minister for immediate acquisition. I think the House will be satisfied with all this. That is all I have to say, and I am very glad that this House was unanimous on the importance of this Bill.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

ඒ ප්‍රකාශය පිළිගන්නට බැහැ. මෙකී ගොඩනැගිල්ල රුපියල් ලක්ෂ ගණනක් වියදම් කොට ඉදි කරන ලද එකක්යයි තමුන්නාන්සේ කියනවා. මා කියූ දේ මා පැහැදිලි කළ යුතුයි. "පෙට්රෝලියම් කෝප රේෂන්" එක කියනවා නම්, මෙය අද වුවත් කඩා දමන්නට තමුන්නාන්සේ සූදානම් බව ඇන් තමුන්නාන්සේ කියනවා. මෙහා පැත්තේ ඇති කඩ, වෙළෙඳ සැල්, සියල් ලක්ම කඩා——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

මන්ත්‍රීතුමා කියන දේ මට හොඳට පැහැදිලියි. මා කෙනකුට පෞද්ගලික උපකාරයක් කරන්නට යනවායයි හිතන්න එපා.

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

ඇත්ත වශයෙන්ම පෞද්ගලික උපකාරයක්. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Why does the hon. Member not give way to one of his fellow Members, who may speak on it? The Hon. Member for Kamburupitiya.

පූ. භා. 11.18

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

මේ සංශෝධන පණතෙන් නිරාකරණය වී තිබෙන්නේ එක් ප්‍රශ්නයක් පමණයි. උසාවියට ඉදිරිපත් වන කරුණු ඉක්මන් වීම පමණයි මෙයින් සිදු වන්නෙ. එහෙත් උසාවිය ඉදිරියට යන්නේ ඉතාම ස්වල්පයයි. වැඩි කොටසක් උසාවියට යන්නේ නැහැ. කුමන අමාත්‍යාංශයක් යටතේ ඉඩමක් අත්පත් කර ගන්නට සූදානම් වුවත් එය ඉඩම් අමාත්‍යාංශයට පැමිණි විට එතැන ප්‍රමාද වෙනවා. මෙය අවුරුදු ගණනක් තිස්සේ තිබෙන තත්ත්වයක්. මේ නිසා, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් වශයෙන් අපට නොයෙක් ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා.

ගරු ඇමතිතුමාගේම ඥාතින් සිටින කරපුටුගල නමැති ගමේ සුසාන භූමියක් සඳහා ඉඩමක් ගත් අවස්ථාවේදී වුණු දේ තමුන්නාන්සේ දන්නවා. එම ඉඩමෙහි කෙනකු බලහත්කාරයෙන් පදිංචි වුණා. දිසාපතිතුමා ඔහුට විරුද්ධව නඩු පැවරුවා. එහෙත් ඇමතිතුමාගේ නියෝගයක් උඩ එම නඩුව ඉල්ලා අස්කරගෙන, ඉඩමෙහි පදිංචි වූ මිනිහාට එහිම ඉන්නට ඉඩ හැරියා. ඔහුට ඉඩමක් දෙන්නට ඕනෑ නම් වෙනත් තැනකින් දෙන්නට බැරිද? සුසාන භූමියට ගත් ඉඩමම දුන්නේ ඇයි? සුසාන භූමිය සඳහා දුන්නේ මහා විශාල කන්දක්. එහි මිනී වළලන්නට තබා නිකම්වත් කෙනකුට යන්න බැහැ. අද ඒ පළාතේ සුසාන භූමියට ඉඩමක් නැහැ. මෙය දැන් අවුරුදු 5ක් පමණ වන ප්‍රශ්නයක්. කඹුරුපිටිය ආසනයේ පලොල්පිටියේ එක්තරා මහත්මයකුට අයිති ඉඩමක්, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ අත්පත් කර ගැනීම සඳහා දිසාපතිතුමාත් පරීක්ෂණ පවත්වා ඉඩම් හිමියාගෙනුත් සාක්ෂි විමසා සියලු කටයුතු අවසන් කර තිබුණා. නිතර ගංවතුරෙන් යට වන ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ඉල්ලීමක් ඉටු කිරීම සඳහායි, මේ ඉඩම ගන්නට කටයුතු කර තිබුණේ. මීට ප්‍රමුඛස්ථානය දෙන ලෙසත් ඉල්ලා තිබුණා. නමුත් ඉඩම් අමාත්‍යාංශය අතට මෙය පැමිණි හැටියෙම එතන නතර වුණා. මෙය උසාවිය ඉදිරියට ගිය කරුණක් නොවෙයි. එම නිසා, උසාවියේ ප්‍රමාද වැළැක්වීමට වඩා කළ යුතුව තිබෙන්නේ අමාත්‍යාංශයේ ප්‍රමාදය නැති කිරීමයි. ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ කටයුතුවලදී, ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාට තිබෙන බලතල අනෙක් අමාත්‍යාංශවල ස්ථිර ලේකම්වරුන්ටත් දෙන්නට බැරි ඇයි?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දීලා තිබෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

දීල තිබුණාට වැඩක් නෑ; ප්‍රමාදය නැති වුණේ නැහැ. ඔය ආදී වශයෙන් කාරණා ගණනාවක් පෙන්වන්නට පුළුවනි.

ඉඩම් අමාත්‍යාංශයෙන් චක්‍ර ලේඛ එක පිට එක නිකුත් කළත්, රජයෙන් දෙන ඉඩම් කැබැල්ලට බලපත්‍ර ලබා ගන්නට අවුරුදු ගණනාවක් යන තුරු බැහැ; රජයෙන් වෙන් කරන ඉඩමේ මායිම් නැහැ; ඉඩමක් වෙන් කළත් යන්නට



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

පාරක් නැහැ. මේවා හේතුකොටගෙන ගම්වල නොයෙකුත් ආරාවුල් ඇති වෙනවා. එම නිසා කරදර ඇති වන්නේ අපටයි. මේ ප්‍රශ්න නිරාකරණය කරන්නේ කවදද? මේ ආණ්ඩුව ආවත්, අර ආණ්ඩුව ආවත්, ඉඩම් ඇමතිතුමා එතැනමයි. ප්‍රශ්නත් එතැනමයි. මෙය සෙල්ලමක් නොවෙයි. මේ සංශෝධන පනතින් සෑහීමකට පත් වන්නට පුළුවන් එක ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පමණයි. මේ ප්‍රශ්න උසාවියට ඉදිරිපත් වුණොත්, එහි ඇති වන ප්‍රමාදයන් වළක්වාලන්නට පමණයි, මේ පනතින් විධිවිධාන සලස්වා තිබෙන්නේ. එහෙත් මේ ප්‍රමාදවීම් ඇති වන්නේ අමාත්‍යාංශයේදීයි. මොන කටයුත්තක් සඳහාවත් අවුරුදු හතරක් පහක් නොගිහින් ඉඩමක් අත්පත් කර ගන්නට පළාත් පාලන ආයතනයකට පුළුවන්කමක් නැහැ. කඹුරුපිටිය නගරයේ වැසිකිළි ගැනීම සඳහා අක්කරයකින් 1/8 ක් ලබා ගන්නට මට අවුරුදු 5 ක්ම ගියා. වෙනත් කටයුතු ගැන කියනුම කවරේද? කරුණා කර මොනවා හෝ ක්‍රමයක් යොදන්න, අමාත්‍යාංශයෙන් මේ කටයුතු ඉක්මන් කරවා ගන්න.

මා ඉදිරිපිටදීම තමුන්නාන්සේ පොරොන්දු වුණා, ගංවතුරෙන් යට වන අයට බුල්ජන්ස් වත්තෙනුයි බෙල්පිස් වත්තෙනුයි ඉඩම් බෙදා දෙන්න. ඒ සම්බන්ධයෙන් දිසාපතිතුමාට අයත් වැඩ කොටස ඉවර කර අමාත්‍යාංශයට එවා තිබෙනවා. මා හිතනවා, ඉඩම් ඇමතිතුමා ලබන සතියේම ඒ පිළිබඳව නියෝගයක් නිකුත් කරයි කියා. මොනවා වුණත් ඉඩම් ඇමතිතුමා දිව දොවිට දමාගෙන ලියනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ලියන්නේ නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඉඩම් අමාත්‍යාංශයේ අර පැත්තෙත් විශාල ලිපිගොනු ගොඩක්, මේ පැත්තෙත් විශාල ලිපිගොනු ගොඩක්, අනෙක් පැත්තේ තවත් ලිපිගොනු ගොඩක් ඉස්සරහින් තවත් ගොඩක් තිබෙනවා. ඉතින් ඇමතිතුමා දිව එළියට දාගෙන අත්සන් කරනවා. ඒවායේ මොනවා තිබෙනවාද දන්නෙ නැහැ. අර විලේගොඩ මහත්මයාගේ ඉඩම ගැන අත්සන් කළ හැටි කැළණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. එස්. පෙරේරා මයා.) කිව්වා. මොනවට අත්සන් කරනවද කියා දන්නෙ නැහැ, ඔහේ අත්සන් කරනවා.

දැන් අගමැතිතුමා සිටින නිසා ඉඩම් ගැනීමේ ප්‍රශ්නය ගැන මා අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. මේ ඇමතිතුමාට වැඩ වැඩියි. වැඩ වැඩි නිසා වැඩ කරන්න අමාරුයි. ඉඩම් අත්පත් කර ගැනීමේ වැඩ ඉක්මණින් කර ගැනීමට පිළිවෙළක් ඇති කරන්න ඕනැ. දැන් මෙම සංශෝධන පනතින් බලාපොරොත්තු වන්නේ ඒ පිළිබඳ වැඩ කටයුතු උසාවියෙන් ඉක්මන් කරවා ගැනීමයි. උසාවියෙ නොවෙයි දැනට ප්‍රමාදය තිබෙන්නෙ, අමාත්‍යාංශයේයි. ඒ මොකද? පළාත් පාලන ඇමතිතුමාත්, නිවාස ඇමතිතුමාත්, රාජ්‍ය ඇමතිතුමාත් ආදී සියලුම ඇමතිවරුන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු යවන්නේ ඉඩම් ඇමතිතුමා වෙතයි. ඉතින් ඔය සියල්ලක්ම ගියාම අත්සන් කරනවාට වැඩිය දෙයක් කරන්න බැහැ. ඒ අතින් බලන විට අපට කනගාටු සිතෙනවා. දෙපාතීමේන්තු 22 ක වැඩ කොහොමද එක මනුෂ්‍යයෙක් කරන්නෙ? ඇමතිතුමා නම් උදේ සිට හැන්දෑ වන තුරු වැඩ කරනවා. වැඩ කරන්නෙ නැත කියා අපි කියන්නෙ නැහැ. කොපමණ වැඩ කළත් වැඩ ප්‍රමාදයි, ප්‍රතිඵලයක් නැහැ.

සුසාන භූමියක් සඳහා ඉඩමක් ගැනීමේ ප්‍රශ්නයක් ගැන බලමු. මෙය ඉතාමත් අවශ්‍ය දෙයක්. යම් කිසි ඉඩමක් ගත්තොත් කරුණාකර ඒ තීරණය අවසාන තීරණය හැටියට ගන්න. තීරණයක් ගත්තට පස්සෙ නව කෙනෙක් ගොස් කරුණු ඉදිරිපත් කළ විට ඒ තීරණය අවලංගු වෙනවා. පසු ගිය ආණ්ඩු කාලයේදී මහා විද්‍යාලයක ක්‍රීඩා භූමියක් සඳහා ඉඩමක් ගත්තා. ඒ ඉඩම අයිති වැලිගම පදිංචි මුස්ලිම් මහත්මයෙකුටයි. ඒ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයා මුස්ලිම් මහත්මයකු වුණ නිසා අත්පත් කර ගත් ඉඩම "කැන්සල්" වුණා. ඒකත් හොඳද ඉඩම් ඇමතිතුමා? ඔය ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමාමයි. මොන ආණ්ඩුව ආවත් ඔය ඇමති තුමා එතන. කියන්න තිබෙන දේ මම කියනවා. කොයි ආණ්ඩුවෙන් කළත් වැරදි වැඩේ වැරදි බව මා කොතැනදීත් කියනවා.

පුහුල්වැල්ල මහා විද්‍යාලයට ක්‍රීඩා භූමි යක් සකස් කිරීම පිණිස දැන් ඉඩමක් අර ගෙන තිබෙනවා. ඉඩම පිළිබඳ සියලුම කට යුතු අවසානයි. දැන් තිබෙන්නේ පාසලට භාර දෙන එක පමණයි. කෝ තවම මෙහෙන් නියෝගය ගියේ නැහැ. මේ විධි යට වැඩ කරන්න පුළුවන්ද? එම නිසා මේ සංශෝධන පනතට අනුව, උසාවියෙන් වැඩ ඉක්මන් කර ගැනීම උසාවි මට්ටමෙන් සිදු වුණත්, අමාත්‍යාංශ මට්ටමෙන් ඉක්මන් වීමක් නැති නිසා අන්න ඒ අමාත්‍යාංශ මට්ටමේ වැඩ කටයුතු ඉක්මන් කර ගැනී මේ වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉඩම් ඇමතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙ නුත් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.27

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සංශෝධන පනත ගැන කථා කිරීමට අද හසක් නොතිබුණත්, ඉබේම වාගේ ඊට සම්බන්ධ වෙන්නට මට සිදු වුණා. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ කොටස් මහා රාශියක් අස් කරගෙන එක වගන්ති යක් යෙදීමේ ප්‍රශ්නයයි මේ වේලාවේ සාකච්ඡාවට භාජන වෙමින් තිබෙන්නෙ. කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙයින් කිසිම කෙනකුට සෑහීමට පත් වෙන්නට බැහැ. මෙයින් අදහස් කරන් නේ උසාවියට ගිය අවස්ථාවේදී නඩුව ඉක් මන් කර ගැනීමයි. රජය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කර නඩු ඉක්මනින් අව සන් කර ගැනීම සඳහා දින ලබා ගන්නට පුළුවන් වේවි. එහෙත් උසාවියට යන්නට කලින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වල ප්‍රමාදය නැති වීමට මෙය උපකාර වෙන්නේ නැහැ.

පළාත් පාලන ආයතනවල සේවය කළ කීප දෙනකුම දැන් මන්ත්‍රීවරුන් හැටියට කරුණු ඉදිරිපත් කළා. ඒ පළපුරුද්ද මටත් තිබෙනවා. පළාත් පාලන ආයතන යකට යම් කිසි ඉඩමක් අවශ්‍ය අවස්ථා වක එය නිදහසේ ඉඩම් අයිතිකරුවන් සමග බේරා ගැනීමට බැරි නම් අපට තිබෙන්නේ දිසාපති මාර්ගයෙන් එය ලබා ගැනීමයි. ඒ සඳහා අඩු වශයෙන් අවුරුදු තුන හතරක්වත් ගත වෙනවාට කිසිම සැකයක් නැහැ. ඉඩම් අමාත්‍යාංශයට ඇවිත් ප්‍රමාද වන්නා වාගේම මේ කට යුතු ප්‍රමාද වන තවත් දෙපාර්ත මේන්තුවක් තිබෙනවා. එනම් මිනින්දෝරු දෙපාතීමේන්තුවයි—Surveyor-General's Department. මුළු ලංකාවේම ඉඩම් අත් පත් කරගැනීමේ කටයුතු සෑම දිසාපතිවර යකුම මිනින්දෝරු දෙපාර්තමේන්තුවට යැවූ විට ඒවා එතැන හිර වෙනවා. ඉඩම් ඇමතිතුමාගේ කාර්යාලයටත් වඩා හිර වෙන තැනක් තමයි මිනින්දෝරු දෙපාතී මේන්තුව. ලංකාවේ දිසාපතිවරුන් විසි දෙදෙනෙක් සිටිනවා. මෙම දිසාපති කාර් යාලවලින් අනුමත කර යැව්වත් මිනින් දෝරු දෙපාර්තමේන්තුවේ අවුරුදු ගණනා වක් ප්‍රමාද වෙනවා. ප්‍රමාදය ගැන ප්‍රශ්න කළොත් ඊට කලින් එවා ඇති ඒවා හමාර කළ යුතු බව කියනවා. ඔය අන්දමට ප්‍රමාද වන නිසා පළාත් පාලන ආයතනයක ආයුෂ කාලයේදී එම කටයුතු අවසන් කරන් න පුළුවන් වන්නේ නැහැ. එම නිසා කොයි විධියේ පනත් මෙම පාර්ලිමේන්තු වට ඉදිරිපත් කර සම්මත කර ගත්තත් මේ කටයුතු ඉක්මනින් කර ගැනීමට ඒවා යින් ප්‍රයෝජනයක් වෙනවායයි මා විශ් වාස කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගල වත්තෙ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල් වින් ආර්. ද සිල්වා) ඊයෙ මෙම ගරු සභා වේදී යම් යම් ප්‍රකාශ වගයක් කළා. මා එතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ සම්බන් ධයෙන් මගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් සලසා දීම ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණු කොළඹ ආරෝග්‍ය ශාලාවට ඉස්සර පාරක් මැන තිබුණා. ඒ සම් බන්ධයෙන් කථා කිරීමට පෙර එහි ඉති හාසය ගැන යමක් ප්‍රකාශ කිරීම ඉතාමත්ම උචිතයයි මා කල්පනා කරනවා. 1952 දී දෙහි වල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සභාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

සභාපති හැටියට, ගල්කිස්ස ආසනයට අග ලවත්තේ ගරු මන්ත්‍රීතුමා සමග තරග කොට මා ජයග්‍රහණය කළා. එසේ ජයග්‍රහණය කිරීමෙන් පසුව, පළාත් ආණ්ඩු සභාවේ නිලධාරීන් සහ මගේ හිතවතුන් සමග මා සාකච්ඡා කළා, පළාතේ මන්ත්‍රීවරයා හැටියට මෙන්ම පළාත් පාලන සභාවේ සභාපතිවරයා වශයෙන්, පළාතට ඇති අඩු පාඩුකම් මොනවාද, පළාතට කළ යුතු සේවය මොකක්ද කියා. එවිට නිලධාරීන් කියා සිටියා, පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ පාරවල් සෑදීම, කානු සෑදීම බෝක්කු තැනීම වාගේ කටයුතු පළාත් ආණ්ඩු සභාවෙන් කරන්න ඕනෑ බව. එසේ වුණත් මෙයින් පිටස්තර කටයුතු, අඩුපාඩුකම් සපුරා ගැනීම අවශ්‍ය නිසා, ප්‍රදේශයට ආරෝග්‍ය ශාලාවක් ලබාගැනීම, ප්‍රදේශයට නල මගින් ජලය සපයා දීම, අවශ්‍ය පාසැල් ලබා ගැනීම, ඔය ආදී අඩුපාඩුකම් සම්බන්ධයෙන් සාකච්ඡා කොට පසුව මගේ නමින් පාර්ලිමේන්තුවට මෙම යෝජනා ඉදිරිපත් කරනු ලැබුවා. මා කලින් සඳහන් කළ ලෙස එසේ ඉදිරිපත් කළ යෝජනාවලින් එකක් තමයි, දකුණු කොළඹ ආරෝග්‍ය ශාලාවක් තැනිය යුතුය කියන යෝජනාව. එම යෝජනාව ගරු සභාවේදී ස්ථිර වුණත් ක්‍රියාත්මක කිරීමට බාධා රාශියක් ඇති වුණා.

අපේ ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී දකුණු කොළඹ ආරෝග්‍ය ශාලාව කොළඹින් දකුණේ පිහිටුවිය යුතුය, එය කටුබැද්දේ ඇනට කාර්මික විද්‍යාලය තනා ඇති භූමියේ තැනීම වඩාම සුදුසුය කියා එවකට සෞඛ්‍ය ඇමතිවරයාව සිටි දැනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති ඊ. ඒ. නුගවෙල මහතා තර්ක කළා. මෙයට විරුද්ධව ආණ්ඩු පක්ෂය තුළම විශාල සටනක් ගෙන යාමට මට සිදු වුණා. මෙම සාකච්ඡාවේදී කොයි තරම් දුරට බහින් බස් වීමක් ඇති වුණාද කියනවා නම් අතරමගදී පුටුවලින් නැගිට යාමට පවා අපට සිදු වුණා. එදා පසුපස ආසනවල සිටි මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු මට වචනයෙන් ආධාර දුන්නා පමණක් නොවෙයි, ක්‍රියාවෙන්ද තිස්සමහාරාමය මන්ත්‍රීවරයාත් (සී. ඒජ්. ඩබ්ලිව්. එදිරිසූරිය මයා.) එවකට පාණදුර මන්ත්‍රීවරයාව සිටි කන්නන්ගර මහතාත් ආධාර දුන් බව මතක් කරන්න කැමතියි. එදා මේ සම්බන්ධයෙන් විකට චිත්‍ර ප්‍රවෘත්ති පත්‍රවල පළ වුණා. එක් විකට චිත්‍රයක, නුගවෙල අධ්‍යාපන ඇමතිතුමාට ලොකු ශල්‍ය කර්මයක් කිරීමට, මා ලොකු කැත්තක් අරගෙන සිටිනවා ඇඳ තිබුණා. එහි, තිස්සමහාරාමයේ මන්ත්‍රීතුමා නුගවෙල මහතාගේ කකුල් දෙකෙන් අල්ලාගෙන සිටින අතර කන්නන්ගර මහතා ඔළුවෙන් අල්ලාගෙන සිටිනවා ඇඳ තිබුණා. එතරම් දරුණු සටනක් ගෙන ගොස් අන්තිමේදී ඒ ඇමතිතුමාට මා කීවා, කටුබැද්දෙ ඔය ආරෝග්‍ය ශාලාව තැනුවොත් එතුමාට රත්මලානෙන් එහාට යන්න දෙන්නෙ නැහැයි කියා.

පසුව එවකට ගරු අගමැතිව සිටි ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා මෙයට මැදිහත් වී මෙය සාමකාමීව බේරා ගත යුතු ප්‍රශ්නයක්ය කියා, නියෝග කළා, දෙහිවල—ගල්කිස්ස ප්‍රදේශයේම මෙය තැනීම සඳහා එම ප්‍රදේශයෙන්ම ඉඩමක් සොයා දෙන්නටය කියා. රත්මලානේ මෙන් නොව, ඒ අවදියේ දෙහිවල—ගල්කිස්ස ප්‍රදේශයෙන් ඉඩම් සොයා ගැනීම ඉතාමත්ම අමාරුයි. රත්මලානේ අහස්යාත්‍රා තොටුපළ පිහිටා ඇති නිසා, ගුවන් රෙගුලාසි අනුව එම ප්‍රදේශයේ තැනීම අපහසු නිසා රත්මලාන ප්‍රදේශයෙන් සුදුසු ඉඩමක් සෙවීමේ අදහස අත් හැරියා. එම නිසා ප්‍රමාණවත් ඉඩමක් සෙවීමේදී ඉතාමත්ම අමාරුවෙන් අක්කර දාහතරක පමණ භූමි භාගයක් කළුබෝවිල ප්‍රදේශයෙන් සොයා ගත හැකි වුණා. මෙම ඉඩම අයත් පුද්ගලයා මගේ ඥාතියෙක් වීම නිසා පෞද්ගලික වශයෙන් ඔහු හමු වී මෙම ඉඩම ලබාගැනීමට සාකච්ඡා කිරීමට මට හැකි වුණා.

ඉඩම ලබාගැනීමෙන් පසුව ආරෝග්‍ය ශාලාවට යාම පිණිස පාරක් තැනීමද ඉතාමත්ම වැදගත් ප්‍රශ්නය වශයෙන් සැලකුවා. මෙම ඉඩම පිහිටා තිබුණේ ගාලු පාරටත් හයිලෙවල් පාරටත් අතර නිසා මේ පාරවල් දෙක සම්බන්ධ වන ආකාරයට ආරෝග්‍ය ශාලාව අසලින් මාර්ගය තැනීම අවශ්‍ය වුණා. කෙසේ හෝ වේවා, ආරෝග්‍ය ශාලාව තනා අවසන් වන විට මාර්ගයෙන් භාගයක් සම්පූර්ණයෙන්ම සකස් කර අවසන් කරන්නට හැකි වුණා. ඉතිරි කොටස ගැන ප්‍රශ්නයයි ඊයේ පැනනැගුණේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙරේදා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ දින යක්. පෙරේදා හිරියාලේ ගරු මන්ත්‍රීතුමා (එස්. බී. හේරත් මයා.) ඉදිරිපත් කළ යෝජනාවක් යටතේ කථා කරමින් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රමාද ගැනත් ඒවාගේම කොහුවල සිට ඔය ආරෝග්‍යශාලාවට යන පාර පළල් කිරීමේ ප්‍රමාදය ගැනත් මා විශේෂයෙන්ම සඳහන් කරන්නට යෙදුණා. ඒ අවස්ථාවේදී නගරාධිපති හැටියට පත් වන විටත් මා ඒ යෝජනාව ඉදිරිපත් කළාය, ඊටපසු මන්ත්‍රීවරයා හැටියටත් මා ඒ යෝජනාව ඉදිරිපත් කළාය, අවුරුදු හතරක් දැනට ගතවී තිබෙනවාය නමුත් මේ වැඩේ තවමත් කර ගන්නට බැරි වූවාය කියා මා කරුණු විස්තර කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර අඩි 60 කට පළල් කළයුතුය කියා රජයේ වැඩ දෙපාර්තමේන්තුව යෝජනා කළා. මේ පාරේ අඩි 60ක් තිබෙන්නේ ආරෝග්‍යශාලාව ඉදිරිපිට පමණයි. ගාලු පාරේ සිට ආරෝග්‍යශාලාවේ මායිම වන තෙක් තිබෙන්නේ අඩි 40 යි. ඔය මෝටර් රථ වාහන යනාදිය නැවැත්වීමට ආරෝග්‍යශාලාව ඉදිරිපිට පමණක් පාර අඩි 60 ක් පළල් කළා. ගාලු පාරේ සිට ආරෝග්‍යශාලාවේ මායිම වන තෙක් තිබෙන්නේ අඩි 40 යි. එමනිසා මේ පාරේ එතැන සිට කොහුවලට යන තෙක් පාර අඩි 60 ක් දක්වා පළල් කළයුතුය කියා රජයේ වැඩ දෙපාර්තමේන්තුව යෝජනාවක් ඉදිරිපත් කළා. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඉන්ජිනේරුවරුන් හෝ වේවා වෙන කවුරුන් හෝ වේවා උර හිස් දෙක උඩ ඔළුව තිබෙනවා නම් එවැනි යෝජනාවක් කරන්නට පෙර ඒ පාරේ ටිකක් ඇවිද බලන්නට ඕනෑ. අඩි 60 කට පාර පළල් කළයුතුය කියා යෝජනාව ඉදිරිපත් කළාම, ඔච් ප්‍රශ්නයක් නැහැ, ගෙවල් හුහල් කැඩෙනවා, පාර තිබෙන්නේ අසුවල් ප්‍රමාණයටය කියා මා කිව්වා. ඒ අවස්ථාවේ වැඩ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නැහැ, නැහැ කියා තර්ක කළා. එහෙම නම් එනව යන්නට පෙන්වන්නට කියා මා ඔවුන් රැගෙන ගියාම ඇස් ඇරුණා. ඇස් ඇරී අඩි 40 ක් ප්‍රමාණවත්ය කියා කිව්වා. අඩි 40 ක් ප්‍රමාණවත් වන පාර කොහුවල දක්වා පළල් කිරීමට කටයුතු යොදන මෙන් මා රජයේ වැඩ දෙපාර්තමේන්තුව භාර ඇමතිතුමාට කිව්වා.

ඔය අවස්ථාව වන විට ආණ්ඩු පක්ෂයේ රුස්වීම් දහයක් තිබුණා නම් රුස්වීම් හය කදීම මා මේ කාරණය ගැන කථා කර තිබෙනවා. එවැනි තත්ත්වයකට ඇවිත් මේ පාර පළල් කිරීමට වැඩ කටයුතු කරගෙන ගියා. මේ පාරේ සෙනෙට් මන්ත්‍රී වයි. ආර්. පියසේන මහත්මයා පදිංචි වී සිටිනවා. පාර පළල් කරන තැන හන්දියේ තිබෙන කඩේ හැරිසන් මුදලාලිත් හොඳ යූ. එන්. පී. කාරයෙක්. මට හැමදාම ආධාර කරනවා. ඔහු හැමදාම යූ. එන්. පී. කාරයෙක්. ඒකෙ කිසිම සැකයක් නැහැ. ඒ කඩේ තිබෙන ඉඩම අයිති මගේ ඥාතියකුටයි. මුදලාලි කඩේ කුලියට ඉන්නවා. මගේ ඥාතියා වන සුගතදාස මහත්මයා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙක්. ඉඩම ගන්නවාට ඒ මගේ ඥාතියාගෙන් කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒවාගේම කඩය කැඩෙනවාට හැරිසන් මුදලාලිගෙනුත් කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ දෙදෙනාම කැමතියි. ඒවාගේම තමාගේ ඉඩම අයිනෙන් පාර යනවාට වයි. ආර්. පියසේන සෙනෙට් මන්ත්‍රීතුමාගෙනුත් කිසිම විරුද්ධත්වයක් නැහැ. එතුමාගේ නිවස ළඟ නිතර නිතර මෝටර් රථ ලොරි අනතුරු සිද්ධ වන නිසා කෙසේ හෝ මේ පාර පළල් කර ගැනීමට එතුමාටත් ඕනෑකම තිබෙනවා. ඒවාගේම ඉඩකඩම් අයිති අනෙකුත් සියළු දෙනාම පාර පළල් කරනවාට සතුටුයි. ඒ අයගේ විරුද්ධත්වයකුත් නැහැ. පාර පළල් කිරීම ගැන ඒ අයගේ විරුද්ධත්වයක් නැත, ගෙවල් පමණක් බේරන්නය කියා ඒ අය රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ලියුම් යවා තිබෙනවා. ඒ ලියුම් උඩ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඉන්ජිනේරුවරුන් එක් කර ගෙන ඇවිත් මෙන්න ගේ, ගේ ළඟ සිට මෙතැනට අඩි මෙපමණ ගණනක් තිබෙනවාය, ඒ ප්‍රමාණය ගන්නට පුළුවන්ය කියා අප පෙන්වා දුන්නා. ඒ අය කැමති වුණා. ඔය කෝස්තලා කියන උදවියත් මගේ ඥාතිවරුනුයි. ඒ අය විරුද්ධය කියා අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කියනවා නම් ඒක සම්පූර්ණ අසත්‍යයක්. අපේ කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]
විරුද්ධත්වයක් නැත, මේ පාර පළල් වෙන්නට ඕනෑය කියා ඒ අයත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ලියුම් ලියා තිබෙනවා. මෙතැන තිබෙන්නේ එක ප්‍රමාදයයි. ඒක රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයයි. පළාතේ මන්ත්‍රීවරයාගේ ප්‍රමාදයක් නැහැ. එක් ස්ථානයක පදිංචිව සිටින ඒ සෙනෙට් මන්ත්‍රීතුමාගේ ප්‍රමාදයක් නැහැ. ඉඩම් අයිති අනෙකුත් උදවියගේ ප්‍රමාදයකුත් නැහැ. ප්‍රමාදය තිබෙන්නේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේයි.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
ඒක සම්පූර්ණයෙන්ම වැරදියි.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)
හරිය කිව්වත් ඇමතිතුමා වැරදිකාරයා නොවැ. එමනිසා වැරදිය නොකියා වෙන මොකක්ද කියන්නෙ ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
මේක හැමදාම කියනවා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)
ඇමතිතුමා කියන කථාව හරි. මා හැමදාම මේ ගැන කියනවා. නමුත් නාන්සේ අවුරුදු හතරක් තිස්සේ මේ වැඩේ කළේ නැහැ. පළාතේ මන්ත්‍රීවරයාගේ නැදෑයින්ගේ ඉඩම් අසුවන නිසා, වයි. ආර්. පියසේන මහත්මයාගේ ඉඩම් අසුවන නිසා මේ වැඩේ නොකරනවාය යන අදහසයි අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන්නට ලෑස්ති වුණේ. නමුත් මෙතැන තිබෙන ප්‍රමාදය රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයයි. මෙතැන පමණක් නොවෙයි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රමාද තිබෙන්නෙ. ප්‍රමාද වෙලා තියෙන්නේ ඒවා විතරක් නොවෙයි. රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් අත්තිඩිය ප්‍රදේශයේ උස්ඒදණ්ඩ පාලම අවුරුදු තුනක් තිස්සේ හැදුවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුවට බෙල්ලන්විල බෝක්කුව හදන්න අවුරුදු දෙකක් තිස්සේ වැඩ කරන්නට සිදු වී තිබෙනවා. මේවා මාස දෙකෙන් කරන්නට පුළුවන් වැඩ බවයි කියන්නට තිබෙන්නේ. ගරු ඇමතිතුමා තමන්ගේ දෙපාර්තමේන්තුවේ වැඩ ගැන බලන්නේ නැතැයි මා කියා සිටිනවා. එතුමාට විනෝදය. එතුමාට තමන්ගේ ඉංජිනේරුවන් මොනවා හරි කිව්වොත් ඒවා හරි. අපි රටෙන් බැණුම් අහනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்தன)*
(Mr. Ilangaratne)
වැලිගම පාර ඉක්මනට හැදුවා.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)
වැලිගම පාර නම් හැදුවා. ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී අහන්නට මා යෝජනාවක් කල් දී තිබෙනවා. සල්ලි නැති නම් වැලිගම පාරෙන් සල්ලි අරගෙන මගේ පාර හදන්නැයි මා ඒ මගින් ඉල්ලුම් කර තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Order, Please! We are discussing the Land Acquisition (Amendment) Bill.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)
සල්ලි නැතිනම් එහෙන් සල්ලි අරගෙන කොහුවල ආරෝග්‍යශාලාව ළඟට එන පාර පළල් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් මේ සම්බන්ධයෙන් මා ඒ තරම් දුරට වැඩ කර තිබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்தன)*
(Mr. Ilangaratne)
හපුතලේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

මම ඒ ගැනත් කියා තිබෙනවා. වැල්ල වායේ සිට හපුතලේට යන පාරට වෙන් කර ඇති මුදල්වලිනුත් කොටසක් ලබා ගෙන ඒක සකස් කරන්නැයි මා කියා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Not on this Bill.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

පෞද්ගලික පැහැදිලි කිරීමක් හැටියට එම කාරණය මෙම සභාවේ ප්‍රකාශ කරන්නට මට සිදු වුණා. පෙරේදා අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) විසින් පවත්වන ලද කතාවෙන් අවබෝධ කර දෙන්නට සූදානම් වුණේ කුමක්ද? එම කතාවට කන් දුන් කෙනෙකුට අවබෝධ වන්නේ තම හිතවතුන්ගේ සහ නෑදෑයන්ගේ ඉඩම් තිබෙන නිසා පළාතේ මන්ත්‍රීවරයා මෙය කරන්නේ නැත යන්නයි. එම නිසයි මෙම කරුණ මෙසේ අවබෝධ කර දිය යුතුව තිබුණේ. ඒ පිළිබඳ නියම තත්ත්වය මෙම සභාවත් රටත් දැනගෙන සිටින්නට ඕනෑ. පළාතේ මන්ත්‍රීවරයා වැඩ කරනවාද නැද්දැයි ඒ උදවිය දැන ගෙන සිටිය යුතුයි.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I want to make a personal explanation. The hon. Parliamentary Secretary is not saying the truth.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

What is the lie I said? I am speaking the truth; you are not doing the work.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Shall we come back to the Land Acquisition (Amendment) Bill?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I want to make a personal explanation, Sir.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I will give you an opportunity.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி. எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

මොන මොන අන්දමට "එක්ස්ප්ලනේෂන්ස්" දුන්නත් ඇමතිතුමා වැඩේ කරන්නේ නැහැ. ඒක කවුරුත් දන්නවා. අපට වුවමනා කරන්නේ "එක්ස්ප්ලනේෂන්ස්" නොවෙයි; අපට වුවමනා කරන්නේ වැඩයි. අපේ පළාතේ ඡන්ද දායකයන්ට වුවමනා කරන්නේ තමන්ගේ මන්ත්‍රීවරයා කර තිබෙන වැඩ බලන්නයි. එසේ නැතුව තමන්ගේ මන්ත්‍රීවරයා කරන කතා අසන්නට නොවෙයි. ඒ උදවියට කතා අසන්නට වුවමනා නම් හැමදාම අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා තෝරා ගනීවි. ඒ උදවිය ජයසිංහව පත් කර ගන්නේ වැඩ කර ගන්නටයි. උන්නැහේ අවුරුදු 3 ක් කතා කරනවා. මම අවුරුදු 3 ක් වැඩ කරනවා. උන්නැහේ අවුරුදු 5 ක් කතා කරනවා. මම අවුරුදු 5 ක් වැඩ කරනවා. දෙහිවල-ගල්කිස්ස ඡන්දදායකයන් අපව පත් කර ගන්නේ එහෙමයි. කතා අහන්නට ඕනෑ නම් උන්නැහේව පත් කර ගන්නවා; වැඩ කරන්නට ඕනෑනම් මාව පත් කර ගන්නවා. මගේ ඡන්දදායකයන්ට වුවමනා කරන්නේ කතා නොවෙයි; වැඩයි. තත්ත්වය මෙසේ හෙයින් මේ ඇමතිතුමාගේ ක්‍රියාපටිපාටිය නිසා අපේ ඡන්දදායකයන් නොමග ගොස් අපේ මන්ත්‍රීවරයා නිදා සිටිනවායයි සිතනවා.

ඔය කියන ආරෝග්‍යශාලා පාරට ඉඩම් දීමට සැම කෙනෙක්ම කැමැත්තෙන් සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

ඊයේ පෙරේදා ඔය දෙපාර්තමේන්තුවෙන් කරපු මොට්ටකමක් ගැන සඳහන් කරන්නට කැමතියි. "තමුන්නාන්සේලාගේ ඉඩම් අපි ගන්නවා; ඒ සඳහා කටයුතු කරන්නට නිලධාරීන් එවනවා; එම නිසා වැටවල් පස්සට ගන්න" කියා යම් යම් අයට දන්වා යවා තිබෙනවා. අසුවල් ඉඩමෙන් මෙච්චර පර්චස් ප්‍රමාණයක් ගන්නවාය එහෙම කියා නැහැ. මේ ගන්න ඉඩම්වලට මුදල් ගෙවනවාද නැද්ද කියන එක ගැන සඳහන් කිරීමකුත් නැහැ. ඒ කිසිම විස්තරයක් නැතුව ලියමනක් පමණක් යවනවා. ඔහොම මොට්ට ලියුම් අනුව ඉඩම් අයිති උදවිය ඉඩම් දේවිද? "අපේ නිලධාරියෙක් මායිම් ගහන්නට එනවා; එම නිසා වැට පස්සට ගන්න" කියන එකයි ලියා යවන්නේ. නොම්මර 38 පදිංචි ඒබ්‍රහම් පෙරේරාගේ ඉඩමෙන් පර්චස් 2.7 ක් ලබා ගන්නවාය කියන එකවත් ලියා යවන්නට එපායැ. දෙපාර්තමේන්තුවල වැඩ කරන්නේ මෙහෙමද? [බාධාකිරීමක්] කෙසේ කළත් කොහුවල හන්දියේ සිට ආරෝග්‍ය ශාලාවට තිබෙන දුර ප්‍රමාණය සැතපුම් බාගයකට වැඩි වුණොත් ඉතා ටිකයි. මේ ගැන ඇමතිතුමාට අවුරුදු 4 ක් තිස්සේ මා කියා තිබෙනවා. එම නිසා මේ පිළිබඳව පළාතේ මන්ත්‍රීවරයා සලකන්නේ නැතැයි යමෙක් කියනවා නම් එය සම්පූර්ණයෙන්ම අභූත චෝදනාවක්. මෙම පාරවල් මෙතරම් ඉක්මනින් පුළුල් කරන්නට සිදු වුණේ එම ආරෝග්‍ය ශාලාවට එන ජනගහනය වැඩි වීමත් ලංගම බස් ධාවනයත් නිසයි. දැන් ලංගම බස් ඉස්සර තිබුණු ඒවා වාගේ නොවෙයි. ඊට වඩා විශාලයි. ඒවා දෙකකට මාරු වෙන්න එම පාර ප්‍රමාණවත් මදි. එසේ හෙයින් ඔය සැතපුම් බාගයේ සුළු ප්‍රදේශය නිතරම වාගේ ජනාකීර්ණයි. රථවාහන ගමනාගමනයත් වැඩියි. එම නිසා නිතර නිතර අවහිර සිදු වෙනවා. එම ප්‍රදේශයේ එහෙන් මෙහෙන් හැරිලා යන්නට පුළුවන්කම ඇති පාරවල් තිබෙන නිසා රථවාහන තදබදය ඇති වන අවස්ථාවලදී එම රෝහලට හදිසි ලෙඩෙක් ගෙන යා යුතු වූ විට එවැනි පාරවලින් ගමන් කිරීම නිතර පාහේ සිදු වෙනවා. එක පැත්තකින් මේ රටේ ප්‍රධාන පාරක් වූ ගාලු පාර තිබෙනවා. අනෙක් පැත්තෙන් තවත් ප්‍රධාන පාරක් වූ හයි ලෙවල් පාර තිබෙනවා. මේ පාරවල් දෙකේම විශාල වශයෙන් රථවාහන ගමන් කරනවා. මේ පාරවල් දෙකම සම්බන්ධ වන පාර ගැනයි, මා ඔය කිවේ. බොහෝ දෙනා මෙය අතුරු පාරක් හැටියටත් පාවිච්චි කරමින් හයි ලෙවල් පාරට එසේ නැත්නම් ගාලු පාරට යන්නේ ඔය පාරෙනුයි. ඒ නිසා මේ පාර පළල් කිරීමේ අවශ්‍යතා හුඟක් තිබෙනවා. මේ ප්‍රමාදයට හේතුව නිලධාරීන්ගේ නොසැලකිල්ල මිස වෙන කිසිම කාරණයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක් ගරු මන්ත්‍රීවරයකු විසින් ඊයේ කරන ලද කථාව නිසයි, මට මේ වචන ස්වල්පය කියන්නට සිදු වුණේ. එසේ නැත්නම් මේ සාකච්ඡාවට සම්බන්ධ නොවන්නටයි, මා අදහස් කරගෙන සිටියේ. කෙසේ වුණත් ගරු ඉඩම් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම සංශෝධන පනතින් ගරු මන්ත්‍රීවරුන්ගේ හෝ පළාත් පාලන ආයතනවල හෝ අදහස් ඉෂ්ට කර ගන්නට අමාරුයි. ඇත්තෙන්ම මෙම පනතේ සඳහන් කාරණා ප්‍රමාණවත් මදි. ඒ නිසා වෙනත් විධියකින් අතුරු ව්‍යවස්ථා පනවා හෝ අඩු වශයෙන් අවුරුද්දක් ඇතුළතදීවත් පොදු කටයුත්තක් සඳහා ඉඩමක් ගන්නට විධිවිධාන යොදන ලෙස ඉල්ලා සිටිනවා.

මේ අතර අද කෙරීගෙන යන සෙල්ලමක් ගැනත් මතක් කරන්නට ඕනෑ. යම්කිසි කෙනකුගේ ඉඩමක් තිබෙනවා නම් එය පොදු කටයුත්තක් සඳහා ගන්නට වුවමනා යයි ඇතැම් පළාත් පාලන ආයතන යෝජනා කරනවා. එහෙත් ඇති පොදු කටයුත්තක් නැහැ. ඊට පසුව යම් යම් උදවිය ඉඩම් අයිතිකාරයා සොයාගෙන යනවා. ඉඩම් අයිතිකාරයා මුණ ගැසීමෙන් පසුව ඒ ඉඩම් අත්පත් කර ගැනීම නවතිනවා. මෙවැනි තත්ත්වයක් පැවතීම නුසුදුසුයි. ඒ නිසා අන්න එවැනි කටයුතු සම්බන්ධයෙනුත් ආරක්ෂාව ඇති වන පරිද්දෙන් පනත සකස් කරන හැටියටත් මා මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එක්තරා ගරු මන්ත්‍රීවරයකු විසින් ඊයේ කරන ලද කථාව නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙම ගරු සභාවට වැරදි අවබෝධයක් ඇති වුණා නම් එය නැති කිරීම පිණිසයි, මෙම වචන ස්වල්පය ප්‍රකාශ කරන්නට මට සිදු වුණේ.

අ. භා. 11.47

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I wish to make a personal explanation on this matter. It is strange that a Parliammentary Secretary of the same Government should attack a Minister without knowing the facts.

The facts are these. The total cost of acquisition is Rs. 1.6 million. I included that item of work in the Draft Estimates for last year and it was turned down by the Treasury. I have included that again. These are the simple facts.

Hon. Members are aware that the Hon. Minister does not acquire land unless there is financial provision. The whole time the hon. Parliamentary Secretary has gone on saying this both in Parliamentary Group meetings and in this House. The people must know the facts. This is the first internal strife between the two of us. It is not fair. I have told him fairly and clearly that my officers are completely tied down. Rs. 1.6 million is the total cost of acquisition and the Treasury has turned it down, and I have now included that item for this year and if the Treasury turns it down this year too there will be no acquisition.

The people must also appreciate that we cannot blame the officials if they do not take action because there is no financial provision. Is the hon. Parliamentary Secretary going to deny that ? If he says there is financial provision, I challenge him to say that there is money. The Hon. Minister of Finance is here. I have told the Hon. Minister of Finance in my proposals that I think this work is absolutely necessary and this should be done but the Finance Minister finds it difficult to provide the money. When he finds it difficult to provide the money the proposal is turned down.

The hon. Parliamentary Secretary says my officers are not acting, that I am lethargic, that I am doing no work. There is no money provision. I challenge him to deny that. This is all wrong. I do not think a Parliamentary Secretary with a sense of responsibility should make statements like this in this House. He is not only a Parliamentary Secretary, he was also Mayor of the Dehiwala-Mount Lavinia Municipal Council, and he should know to be fair in his criticisms.

If he says now that there is financial provision in the Budget, I am prepared to apologize to him a hundred times.

එස්. ද එස්. ජයසිංහ මයා.
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

A personal explanation, Sir.—[*Interruption*]. It is for the Hon. Minister to find out whether there is provision in the Budget and not a matter for the Members.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

A Minister can only ask the Finance Minister for money provision.

එස්. ද එස්. ජයසිංහ මයා.
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasingha)

That is a matter between the Ministers.

අ. භා. 11.51

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனை)*
(Mr. T. B. M. Herath—Walapane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත ගැන පවතින සාකච්ඡාවේදී අපට හොඳ හොඳ රඟ දැක්වීම් කීපයක් දැක බලා ගන්නට අවස්ථාව ලැබුණා. මීට වඩා හොඳ රඟ දැක්වීම් ඉදිරි කාලයේදී දකින්නට ලැබේවි. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන පනත සම්පූර්ණයෙන්ම වාගේ ඉල්ලා අස් කරගෙන දැන් නැවත පොඩි පනතක් ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරිපත් කර තිබෙන ඒ අලුත් පොඩි පනතේ ඉංග්‍රීසි පිටපතක් පමණක් ඉදිරිපත් කිරීම ගැන මුලින්ම මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒ අලුත් පනත ඉංග්‍රීසියෙන් පමණක් ඉදිරිපත් කිරීම ගැන විරෝධය දැක්වීමක් වශයෙන් මා මේ ඉංග්‍රීසි පිටපත ඉරා දමනවා. [බාධා කිරීමක්]. මෙවැනි පනතක් ඉදිරිපත් කරන විට ඉංග්‍රීසියෙන්වත් එහි පිටපත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට සැපයිය යුතු බව වගකිව යුතු ඇමතිවරයකු වශයෙන් ගරු ඉඩම් ඇමතිතුමා දැන ගන්නට ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

We have only one copy of that.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

සියලු දෙනාටම එක පිටපත බැගින් සැපයීමට තිබෙන අමාරුව මොකක්ද? අපට සාකච්ඡා කරන්නට කියන්නේ නොදන්නා සංශෝධන ගැනද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! May I explain the position? That document was the copy which the Hon. Minister had for his own use. As a matter of courtesy he had given it to the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva), and he passed it on to the hon. Member. When the amendment is moved at the Committee stage it will be in all three languages. It is absolute discourtesy on the part of the hon. Member for Walapane that he should have torn a document which was given to him as a matter of courtesy by the Hon. Minister. When the amendment is moved in the evening at the Committee stage it will be in the three languages. It is at that stage that the hon. Member should raise this matter.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අපට කියන්නේ නොදන්න දේවල් ගැන සාකච්ඡා කරන්නට කියලද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

This is something which the Hon. Minister drafted for his own use. The Hon. Minister read it out. This was given by him as a matter of courtesy. —[*Interruption*]. He read it out.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

හරි, තිබුණ පනත ඉල්ලා අස් කර ගත්තා නම් අලුතෙන් ඉදිරිපත් කර තිබෙන්නේ මේ සංශෝධනය නම් අපි ඒ ගැන සාකච්ඡා කරන්නේ නැතිව මොකක් ගැනද සාකච්ඡා කරන්නෙ? තිබුණ පනත ඉල්ලා අස් කර ගත්තා. එහෙම නම් ඇමතිතුමාගේ යුතුකමක් තිබෙනවා මේ සංශෝධනයේ කොපි— ඇමතිතුමාට සිංහල බැරි නම් ඉංග්‍රීසි කොපිවත්—මන්ත්‍රීවරුන් අතරේ බෙදා දීමට. මේ සංශෝධිත පනතේ ඉංග්‍රීසි කොපිවත් මන්ත්‍රීවරුන් අතරේ බෙදා දීමට තමුන්නාන්සේට යුතුකමක් තිබෙනවා. දැන් උදේ 10.30 ට මේ සංශෝධනය ඉදිරිපත් කළා. දැන් පැය එකහමාරක් පමණ ගත වුණා. නමුත් තවමත් අපේ පාවිච්චිය සඳහා පිටපතක් ලැබී නැහැ. අපට ඉංග්‍රීසි පිටපතක් හෝ ලබා දෙන්න යුතුකමක් තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. එතුමාගේ ඉඩම් අත්පත් කර ගැනීමේ කට යුතුත් ඔය ආකාරයටමයි සිදු වන්නෙ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

What is the amendment, Sir? He has torn it up.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ මොකක් ගැනද කතා කළේ ? පනත ඉල්ලා අස් කර ගත්තා නම් මොකක් ගැනද කතා කරන්නෙ ? [බාධා කිරීම්] ඒකත් නැහැ, මේකත් නැහැ. දැන් අපට ඕනෑ එකක් ගැනයි අපි කතා කරන්නෙ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

මම උත්තර දෙන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තමුන්නාන්සෙට කීකරු වෙන්නම්. මම වාඩි වුණාට පසුව ගරු ඇමතිතුමාට උත්තර දෙන්නය කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් අත්පත් කර ගැනීමට ඉක්මණින් උසාවියෙන් බලය ලබා ගැනීම සඳහායි මේ සංශෝධනය ඉදිරිපත් කර තිබෙන්නෙ. උසාවියේ ප්‍රමාදය වළක්වන්නයි මෙය ඉදිරිපත් කර තිබෙන්නෙ. නමුත් ඇමතිතුමාගේ තිබෙන ප්‍රමාදය ඉක්මන් කරන්න වැඩපිළිවෙළක් නැහැ. ඇමතිතුමාගේත් අමාත්‍යාංශයේත් තිබෙන්නේ පුදුම ප්‍රමාදයක්. ගරු මන්ත්‍රීවරුන් විසින් සඳහන් කරන්න යෙදුනා, ඉඩමක් ගන්න ගිය විට සමහර විට අවුරුදු 15 ක්, 20 ක්, 25 ක් පමණ ගත වෙන බව. ඉඩමක් වුවමනා වුණ විට මේ අමාත්‍යාංශය ක්‍රියා කරන්නේ පිස්සන් වගෙයි. මගේ කොට්ඨාශයේ පාසැලක් සෑදීම සඳහා ඉඩමක් ලබා ගත්තා. උසාවියේ බලය පිට ඒ ඉඩමේ පදිංචිව සිටි තුන් දෙනෙක් එළියට ඇද දැම්මා. එක්කෙනෙක් දසසිල් මාතාවක්. ඒ දසසිල් මාතාවගේ පන්සල කඩා ඇය එළියට දැම්මා. ගෙවල් දෙකක පදිංචිව සිටි පදිංචිකරුවන් දෙදෙනෙක් එළියට ඇද දැම්මා. ඊට තුන් මාසයකට පසුව කියනවා ඒ ඉඩම පාසැල සෑදීමට සුදුසු නැත, ඒ නිසා ඒ ඉඩම අවශ්‍ය නැත කියා. දසසිල් මාතාවගේ පන්සල කඩා දමා, අර දුප්පත් මිනිසුන් දෙදෙනාගේ ගෙවල් කඩා දමා, ඒ මිනිසුන් එළියට ඇද දමා තුන් මාසයකට පසුව කියනවා එම ඉඩම අවශ්‍ය නැත කියා. මේ වගේ ඔළ මොට්ටල වැඩ කරන ඉඩම් අමාත්‍යාංශයක් අපට අවශ්‍යද ? 1960 ගණන්වල අවශ්‍ය වුණ ඉඩම් ගැන අවසානයේදී ඇමතිතුමා නිවේදනය කර එවනවා, අසවල් ඉඩමේ භුක්තිය අසවල් පුද්ගලයාට පවරන්නය කියා. පළාතේ මන්ත්‍රීවරයාටත් කියා එවනවා. ඇමතිතුමා එතුමාගේ ප්‍රීතියත් ප්‍රකාශ කරමින් ඒ නිවේදනය එවනවා. නමුත් ඊළඟ සුමානයේදී එය අවලංගු කර එවනවා. භුක්තිය භාර ගන්නත් කලින් එය අවලංගු කර එවනවා.

සුසාන භූමියක් සදා ගන්න ක්‍රමයක් නැහැ. ආණ්ඩුවට අයිති ඉඩමක් පවරා ගන්න ගිය අවස්ථාවකදී මොකක්ද සිදු වන්නෙ ? ගම් කාර්ය සභාවක් විසින් ඉඩම් කෑල්ලක් ඉල්ලු විට මොකක්ද වෙන්නෙ ? මගේ කොට්ඨාශයේ ගම්කාර්ය සභාවකට වුවමනා වුණා, රුපියල් 15,000 ක් වියදම් කර ගොඩනැගිල්ලක් තැනීමට. ආණ්ඩුවේ ඉඩම් තිබෙනවා ඕනෑ තරම්. ඒ ගොඩනැගිල්ල තනා ගැනීම සඳහා අක්කර කාලක් අවශ්‍යය කියා ඉඩම් කච්චේරියට දැන්නුවා. නමුත් කච්චේරිය නොවෙයි උත්තර දුන්නෙ. එසේ වුවත් නුවරඑළියේ කච්චේරියේ—ඉඩම් කච්චේරි අවශ්‍ය නැහැ—නිලධාරියෙකුට රුපියල් 250 ක් දුන්නොත් ඉඩම් ලබාගැනීමට බලපත්‍ර නිකුත් කරන ක්‍රමයක් තිබෙන බවට අප විසින් තමුන්නාන්සේට පැමිණිලි කර තිබෙනවා. නමුත් තමුන්නාන්සේ අපට පිළිතුරු දුන්නේ නැහැ. ඉඩම් පැවරීම පිළිබඳව දූෂණ පිට දූෂණ ඇති වෙනවා. හැම පැත්තෙන්ම දූෂණ. ඉඩම් කච්චේරි වුවමනා නැහැ, සල්ලි තිබෙනවා නම් ඉඩම් ගන්න පුළුවනි. පළාත් පාලන ආයතනයකින් සොහොන් පිට්ටනියකට හෝ ඉඩමක් ගන්න ගියාම බොහොම අමාරුයි. නමුත් රුපියල් 250 ක් තිබේ නම් නුවරඑළිය කච්චේරියෙන් ඉඩමක් ගැනීම බොහොම පහසුයි. මෙන්න මේ වගේ තත්ත්වයක් අද ඇති වී තිබෙන්නෙ. මේවා ගැන කතා කිරීමෙන් කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ප්‍රයෝජනයක් නැහැ. මේ විධියේ ඔල මොට්ටල වැඩ කරන මේ ඉඩම් අමාත්‍යාංශයේ වැඩවලින් මුළු රටම විනාශයට පත් වී තිබෙනවා. කරුණාකර ඒ තත්ත්වය නැති කරන්න සංශෝධන පනතක් ගෙන එන්න. තමුන්නාන්සේගේ වැඩ ඉක්මන් කිරීම සඳහා සංශෝධනයක් ගෙන එන්නේ නැද්ද? තමුන්නාන්සේගේ වැඩ ඉක්මන් කරන්න, ඇලි මැලි දුබල ගතිය නැති කරන්න, සංශෝධනයක් ගෙන එන්න. දූෂණවලින් පිරී තිබෙන ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරීන් තව දුරටත් ආරක්ෂා කරන්නද තමුන්නාන්සේ කල්පනා කරන්නෙ? මේ ඉඩම් ගැනීමේ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අඩපනව ගොස් තිබියදීත්, නැත්තටම නැතිව යමින් තිබියදීත්, තමුන්නාන්සේ නැවත තත් ඔතනම වාඩි වෙන්න එන බවත් කියනවා. එහෙම ආවොත් නම්, අර ගැමි කතාවක් තිබෙනවා නේ, බබිත් සුං බබීගේ මවත් සුං කියා, අන්න ඒ වගේ දෙයකුයි සිදු වන්නෙ. ඔක්කොම ඉවර වෙනවා. ඒ නිසා කරුණාකර මෙය විනාශ කරන්නේ නැතිව, ඔය අමාත්‍යාංශය කරන්න පුළුවන් කෙනෙකුට භාර දී යන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M. On resumption the hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 2 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜி. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 2 P.M., and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *in the Chair.*

**ඇස්. බී. යාලේගම මයා.** (රත්තොට)
*(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)*
(Mr. S. B. Yalegama—Rattota)

ගරු සභාපතිතුමනි,—

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ගරු සභාපතිතුමනි, ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறைவெண் இருந்ததனால்—

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**යාලේගම මයා.**
*(திரு. யாலேகம)*
(Mr. Yalegama)

ගරු සභාපතිතුමනි, ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු අප කාගේත් පාහේ සිත් තුළ එක්තරා බියක් ඇති කළ වගන්තිය අස් කර ගැනීමට ගරු ඉඩම් ඇමතිතුමා ඉදිරිපත් වීම ගැන අප කවුරුත් සන්තෝෂ විය යුතුයි. උසාවිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කෙනකුට ඇති මූලික අයිතිවාසිකම ඉතා වැදගත් දෙයක් බව කාගේත් පිළිගැනීමයි. තමන්ගේ දුක්ගැනවිලි වෙතොත් ඒවා ඉදිරිපත්කර අධිකරණයෙන් හෝ සාධාරණයක් ලබා ගැනීමට ලැබෙන මූලික මානුෂික අයිතිවාසිකම වැළලී යන අන්දමේ නීතියක් සම්මත කර ගත්තොත් එය මානුෂික මූලික අයිතිවාසිකමක් වළලා දැමීමක් හැටියට මා විශ්වාස කරනවා. මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයෙන් පෙන්වා දෙන ලද කරුණු පිළිගෙන ගරු ඇමතිතුමා ඒ වගන්තිය ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමාට අප ස්තුතිවන්ත විය යුතු බව මා ප්‍රකාශ කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙහිදී තවත් වැදගත් කාරණයක් කෙරෙහි සැලකිල්ල යොමු කරවන්නට කැමතියි. මේ වගන්තිය යටතේ උසාවියට යෑම අවශ්‍යද යන්න ගැන සොයා බලන්නට ඕනෑ. ඉඩම් අමාත්‍යාංශය කොයි තරම් දුරට කාර්යක්ෂමද යන්නත් සොයා බලන්නට ඕනෑ. ඉඩම් අමාත්‍යාංශයේ වැඩ කටයුතු අද කරගෙන යන ආකාරය ගැන කල්පනා කරන විට උසාවියට ගියත් නොගියත් මට නම් සෑහීමකට පත් වන්නට බැහැ. බොහෝ අවස්ථාවල ලත් අත්දැකීම් අනුව මා කලකිරී සිටිනවා. ලියුම් යවා, ඉඩම් අමාත්‍යාංශයට ගොස් එහි නිලධාරීනුත් —සමහර විට ඉඩම් අත්පත් කර ගැනීම භාර දිසාපතිවරයාත්, ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය භාර වෙනත් නිලධාරිනුත්—ගරු ඇමතිතුමාත් හමු වී සාකච්ඡා කර ගැනීමෙන් පසුව වුවත් අපේක්ෂිත කාර්යය ඉෂ්ට කර ගන්නට නොහැකි වන විට ඇති වන හැඟීම කුමක්ද? උසාවියට යෑමෙන් පමණක් හෝ උසාවියට යෑම වැළැක්වීමෙන් පමණක් හෝ අවශ්‍ය කාර්යය කරවා ගන්නට බැරි බව එයින් පැහැදිලියි. මුළු අමාත්‍යාංශයම ප්‍රතිසංශෝධනය කළ යුතුයි. මා එසේ කියන්නේ යම්කිසි අත්දැකීමක් උඩයි.

ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ සියේට දෙකක ප්‍රමාණයක ඉඩම් අත්කර ගැනීමේ ක්‍රමය අනුව රත්තොට මැතිවරණ කොට්ඨාශයෙන් අක්කර 200 ක් පමණ අත්පත් කර ගැනීමට මුදල් වෙන් කර තිබෙනවා. එහෙත් පසුගිය අවුරුදු හතරක කාලයක් තිස්සේ උත්සාහ කිරීමෙන් පසුවත් තවම අක්කර 25 ක්වත් හරියට බෙදා දෙන්නට බැරි වුණා.

මගේ ආසනයේ සමහර ඉඩම් අත්පත් කර ගැනීමට 1965 සිට මා උත්සාහ කරනවා. එහෙත් ඉඩම් අත්පත්කර ගැනීමේ වැඩපිළිවෙළ ඉතාමත් අවුල් සහගත නිසා ඒ ඉඩම් අත්පත් කර ගැනීමට බැරි වී තිබෙනවා. දිසාපතිවරයා ඉඩම් පරීක්ෂා කර බලා ඒවා අනුමත කර ඉඩම් අමාත්‍යාංශයට එවනවා. අමාත්‍යාංශය ඒවා අත්පත් කර ගැනීමට ගැසට් නිවේදනත් නිකුත් කරනවා. ඊට පසු ඒ ඉඩම ගැනීම අත් හරින්නය කියා දිසාපතිතුමාට අමාත්‍යාංශයෙන් නියෝගයක් එවා තිබෙනවාය කියා දිසාපතිතුමා කියනවා. සමහරවිට ඉඩම් කට්ටිකරුවන් තේරුවාට පසුත් ඒ ඉඩම් ගැනීම අත්හරිනවා. රත්තොට ආසනයේ වේවැල්මඩ වත්ත නමැති ඉඩමේ අක්කර 25 ක් උඩගම වසමේ කට්ටිකරුවන් වෙත බෙදා දෙන්නට 1964 සිට කටයුතු කළත් තවමත් එය ඉටු කර ගන්නට බැරි වුණා. අද වන තුරුත් ඒ කට්ටිකරුවන් ඒ ඉඩමේ පදිංචි කරවන්නට බැරි වුණා. ඒ ආසනයේ ඕවිලි කන්ද වත්ත නමින් වතු යායක් තියෙනවා. එහි පදිංචි කරවීමට ඕවිලි කන්ද වසමේ පවුල් 52 ක් තෝරා ගෙන අවුරුදු 4 ක් ගත වී තියෙනවා. එහෙත් ඒ වතු යායේ ගන්නට ගිය අක්කර 15 ගැනීම නවත්වන්නය කියා මෑතදී අමාත්‍යාංශය නියෝගයක් යවා තිබෙනවා. මාතලේ දිසාපතිතුමා කියන්නේ, 'අපට කරන්නට දෙයක් නැහැ; ඉඩමක් තෝරා තිබෙනවා; ඉඩම් කට්ටිකරුවනුත් තෝරා තිබෙනවා; එහෙත් මේක අත්හරින්නය කියා අමාත්‍යාංශය නියෝග කර තිබෙනවා'ය කියායි. මේ විධියට නොයෙක් අයගේ ඇඟිලි ගැසීම් නිසා ඉඩම් රාශියක් අත්පත් කර ගන්නට බැරිව තියෙනවා.

උල්පත්පිටිය යනුවෙන් මගේ ආසනයේ තිබෙන මුස්ලිම් ගමක ජනයා, හරියාකාර ඉඩම් නැතිකම නිසා අවුරුදු ගණනක් තිස්සේ දුක් විඳිනවා. ඒ මුස්ලිම් ජනයා සඳහා බණ්ඩාරපොල නමැති ඉඩමෙන් අක්කර 10 ක් ගන්නට තීන්දු කර ඒ සඳහා සියළුම කටයුතු කළාට පසු අමාත්‍යාංශයේ ඒ සම්බන්ධයෙන් තිබුණු ෆයිල් එකත් අද නැති වී තිබෙනවා. මෑතකදී මා ඉඩම් කොමසාරිස්තුමා හමු වී මේ ගැන ඇහුවම එතුමා ෆයිල් එක සෙව්වා; ෆයිල් එකවත් තිබුනෙ නැහැ. යම්කිසි පුද්ගලයකුගේ ඕනෑකමක් උඩ, දේශපාලන බලපෑමක් උඩ එය සිදු වන බවයි, පෙනෙන්නේ. ගමක සිටින වැසියන් ගැන කල්පනා කරන්නෙ නැතිව එක පුද්ගලයකුගේ යහපත ගැන පමණක් සලකා ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වී තිබෙන්නේ උල්පත්පිටිය නමැති මුස්ලිම් ගමේ ජනයා සඳහා බණ්ඩාරපොල වත්තෙන් ගන්නට ගිය ඉඩම් ගැනීම නැවතී තිබීමයි. අප මේවා ගැන පාර්ලිමේන්තුවේදීත් කියනවා; දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරක සභාවෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

දිත් කියනවා ; අමාත්‍යාංශයටත් කියනවා; ඉඩම් නිලධාරීන්ටත් කියනවා ; දිසාපතිවරුන්ටත් කියනවා. එහෙත් තවමත් කිසිම සහනයක් ලැබී නැහැ. දැන් අපට කල්පනා කරන්නට සිදු වී තිබෙන්නේ මේවා කාට කියන්නද කියන කාරණයයි. මේ විධියේ අකාර්යක්ෂම තත්ත්වයක් තියෙද්දී, ඉඩම් අත්පත් කර ගැනීම ඉක්මන් කරන්නට ඕනෑ නිසා උසාවියකට යෑම වලක්වන්නට කටයුතු කරනවා නම් ඒක කිසි තේරුමක් නැති වැඩක්. ඇත්ත වශයෙන් ඉඩම් අත්පත් කරගැනීම ඉක්මන් කිරීමට කටයුතු කරනවා නම් අප ඒ ගැන සන්තෝෂ වන්නට ඕනෑ. එහෙත් අප කියන්නේ මේ පනත ගෙනෙන්නට පෙර දැන් තිබෙන තත්ත්වය කුමක්ද කියා සොයා බැලිය යුතු බවයි. ඉඩම් දෙපාතීමේන්තුව හරියාකාර කටයුතු කර තිබෙනවාද කියා අප සොයා බලන්නට ඕනෑ. අදත් එහි ඇඟිලිගැසීම් තියෙනවා. ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් ගැනීම පමණක් නොවෙයි, පවුල් සිය දහස් ගණනක් පදිංචි කරවීම සඳහා ඉඩම් ගැනීමත් වළක්වන්නට පුළුවන් තත්ත්වයක් තියෙනවා නම් අපට ඒ තත්ත්වය ගැන සෑහීමට පත්වන්නට බැහැ.

එන්සාල් වවන්නට පුළුවන් දේශගුණයක් ඇති, හොඳ පසක් ඇති, අක්කර 2,000 ක් පමණ රත්තොට ආසනයේ කඳුකරයේ තියෙනවා. මා අවුරුදු 3 ක් තිස්සේ මේ සම්බන්ධයෙන් ඉඩම් ඉල්ලුවාම සමුපකාර සමිතියක් ඇති කරන්නය කිව්වා. මම සමුපකාර සමිතියක් පිහිටුවාගෙන අක්කර 2000 ක් ඉල්ලා අවුරුදු 3 ක් ගියත් තවම අක්කර 500 ක්වත් දුන්නෙ නැහැ. ඒ සමිතියට ඉඩම් නුදුන්න නමුත් සමහර පුද්ගලයන්ට අක්කර පනහ හැට දී තිබෙනවා. අදත් දීගෙන යනවා. එන්සාල් වැවීම සඳහා සමුපකාර සමිතියක් මගින් අවුරුදු ගණනාවක් තිස්සේ ඉඩම් ඉල්ලද්දී ඒ උදවියට නොදී හිතුවක්කාර විධියට පුද්ගලයන්ගේ ඉල්ලීම් අනුව ඉඩම් දෙනවා නම් ඒ පිළිබඳව මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන බව මා මාතලේ දිසාපතිතුමාට දැන්නුවා. මේවා ඇතුලෙන් වන දේවල්. අපි ගිහින් කථා කළාම කියනවා, සමිතියක් පිහිටුවාගෙන ඉලන්නය, එවිට ගැසට් කරල ඒ මාගීයෙන් අපි ඉඩම් බෙදා දෙනවාය කියා. එහෙත් මා කලින් සඳහන් කළ අන්දමට පුද්ගලයන්ගේ ඉල්ලීම් උඩත් ඉඩම් බෙදා දෙන තත්ත්වයක් තිබෙනවා. ඇතැම් පුද්ගලයන් රජය සතු ඉඩම් අක්කර දෙසිය, තුන්සිය අල්ලාගෙන අද එන්සාල් වගා කරගෙන යනවා. තුන් හාර සියයක් සාමාජිකත්වය තිබෙන ලියාපදිංචි වූ සමුපකාර සමිතියක් මගින් කරන ලද ඉල්ලීම් පැත්තක තිබෙද්දී එක එක පුද්ගලයන්ට හිතු මනාපයට ඉඩම් බෙදා දීමේ ඉඩම් දෙපාතීමේන්තුවේ ප්‍රතිපත්තිය හරිය කියා මා හිතන්නේ නැහැ. අද තිබෙන තත්ත්වය ඒකයි. ඒ නිසා මේ කරුණු ගැන සොයා බලන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ දැන් මේවා ගැන ක්‍රියා කිරීම එපාවෙලයි තිබෙන්නේ. ලියුම් ලියල, නිලධාරීන් හමුවෙලා, දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවලදී කරුණු ඉදිරිපත් කරල අන්තිමේදී මේවා ක්‍රියාත්මක වෙන්නට ඔන්න මෙන්න කියා තිබෙද්දී හදිසියේ ඒවා නවත්වා දමනවා. ඇයි මේ අන්දමට මිනිසුන් අමාරුවේ දමන්නේ ? ඉඩම් කච්චේරි තබා කට්ටිකරුවන් තෝරා අවුරුදු ගණනාවක් ඒ මිනිසුන් බලා සිටියාට පසු අන්තිමේදී " ඒ ඉඩම් බෙදා දෙන්නේ නැත, ඒ ඉඩම අත්හරින්නය " කියා නියම කරනවා නම් ඒ ප්‍රතිපත්තිය මොකක්ද කියා මා අහනවා.

ඔව්ලිකන්දවත්ත සම්බන්ධයෙන් මා කලින් කිව්වා. ඔව්ලිකන්ද කියන ගම වටේම තිබෙන්නේ ඔව්ලිකන්ද තේවතුයායයි. ජාතික ආදායමක් ලැබෙන විශාල තේවතුවලට හානි පමුණුවනවාට ඇත්ත වශයෙන්ම මමත් කැමති නැහැ. ඒවාට හානි පමුණනවාට මාත් විරුද්ධයි. එහෙත් තේ ගහට වඩා අපි ගම්වල ජීවත් වන ජනතාව ගැනත් කල්පනා කර බලන්නට ඕනෑ. මනුෂ්‍යයන් ජීවත් වන්නේ කොහේද කියා කල්පනා කර බැලිය යුතු අවස්ථා ඇති වෙනවා. මේ ඔව්ලිකන්ද කියන කුඩා ගම වටේම තිබෙන්නේ ඔව්ලිකන්ද තේවතුයාය නිසා මේ ගමේ ජනගහනය වැඩි වෙන්නට පටන් ගත් විට, පවුල් ගණන වැඩි වෙන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පටන් ගත් විට ඒ වතුයායෙන් ඉඩම් කොටසක් ලබාගෙන ඔවුන් අතර බෙදා දීම හැර වෙන මොනවා කරන්නද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි? අද වෙලා තිබෙන්නේ මොකක්ද? තේවතු සශ්‍රීකය කියා ඉන් කොටසක් දෙන්නට බැරිලු. එහෙම නම් ඒ මිනිසුන් කොහේ යන්නද කියන ප්‍රශ්නයයි මා අහන්නේ. අක්කර හාර පන්සියයක් නැත්නම් හත් අට සියයක් තිබෙන වත්තකින් ගම් පළල් කිරීමේ ව්‍යාපාරය යටතේ අක්කර 10 ක් 15 ක් ලබාගෙන එහි ඒ මිනිසුන් පදිංචි කිරීමයි කරන්නට තිබෙන්නේ. මෙතැන තිබෙන්නේ මානුෂික ප්‍රශ්නයක්. මෙතැන තිබෙන ප්‍රශ්නය මේ මනුෂ්‍යයන් ජීවත් වෙන්නේ කොහෙද කියන එකයි. ඒ නිසා මේ කාරණය ගැන විශේෂයෙන් සොයා බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. දිසාපතිතුමා කියන්නේ අමාත්‍යාංශයේ නියෝගයක් පිට මේ ඉඩම් අත්පත් කර ගැනීම නැවැත්වූ බවයි.

ඊළඟ කාරණය: උල්පත්පිටිය ගමට බණ්ඩාරපොල වත්තෙන් ගන්නට ගිය අක්කර 10 නැවැත්වූයේත් අමාත්‍යාංශයේ නියෝගයක් පිටයි. වෙනෙකක් තබා ඒ ලිපිගොනුවවත් අද නැහැ. මේ කරුණු මේ අන්දමට ප්‍රමාද කිරීමෙන් ජනතාවට සිදු වෙන්නේ අයහපතක් බවයි අප කියන්නේ. සමහරවිට ඉඩමක් රජයට අත්කර නොගැනීමෙන් එක් පුද්ගලයෙකුට ලාභයක් සිදු වෙන්නට පුළුවනි. එහෙත්, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය වැනි ව්‍යාපාර යටතේ රජයට ඉඩම් අත්පත් කර ගන්නේ සමහරවිට පවුල් හැට හැත්තෑවක් සඳහා වෙන්නට පුළුවනි; සමහරවිට පවුල් හාර පන්සියයක් සඳහා වෙන්නට පුළුවනි. විශේෂයෙන්ම මේ ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය ඉඩම් අමාත්‍යාංශයේ වැදගත්ම දෙයක්. ඉඩම් ප්‍රශ්නය අද මහජනතාවට බලපාන ලොකුම ප්‍රශ්නයක්. එවැනි කටයුත්තකදීත් මේ අන්දමට උදාසීනව නැත්නම් බලපෑම් උඩ එහෙමත් නැත්නම් නොසැලකිල්ල නිසා මේ අන්දමට කටයුතු සිදු වෙනවා නම් මේ දෙපාර්තමේන්තුවෙන් මේ රටත් මේ රටේ ජනතාවත් බලාපොරොත්තු වන සේවය හරියාකාර ඉටු වෙනවාය කියන්නට බැහැ.

අවසාන වශයෙන් මා ඉල්ලීමක් කරන්නට ඕනෑ. එහෙත් මේ කරුණු ගැන කියන්නත් මට එපා වෙලයි තිබෙන්නේ. එයට හේතුව මා අවුරුදු ගණනාවක්ම ලියුම් ලිව්වාවූත් වරින් වර දෙපාර්තමේන්තුවට ගොස් කියා සිටියාවූත් කරුණු මයි ප්‍රශ්නයේ තිබෙන්නේ. මේ ප්‍රශ්නය සම්බන්ධව පුළුවන් තරම් දුරට සොයා බලා මේ සම්බන්ධව සහනයක් සලසා දෙන ලෙස මා නැවතත් ඉල්ලා සිටිනවා. මා සඳහන් කළ පරිදි සියයට 2 සීමාව උඩ අක්කර 200 ක් ගන්නට කටයුතු පිළියෙළ කර තිබෙනවා. එහෙත් තවමත් නිරවුල් කර අක්කර 25 කට 30 කට වඩා මහජනයාට ලබා දෙන්නට බැරි වී තිබෙනවා. අනික් හැම තැනම අවුල්. ඇසුවොත් කියන්නේ ඒ ඉඩම ගන්නේ නැත ඒ වෙනුවට වෙනත් ඉඩමක් ගන්නවාය නැත්නම් අමාත්‍යාංශයේ නියෝගයක් උඩ ඒ ඉඩම ගැනීම නතර කර තිබෙනවාය කියලයි. ඔය ආදී වශයෙන් මොනවා හෝ කියනවා මිස එහි අවසානයක් නැහැ. අවුරුදු 4 ක් 5 ක් තිස්සේ කට්ටිකරුවන් තෝරාගෙන ඇතත් තවමත් ඔවුන්ට ඉඩම් බෙදා දී නැහැ. එම නිසා අභියාචනා ඉදිරිපත් කිරීමෙන් කාලය ගත වන නිසා ඒ සඳහා ගත වන කාලය කෙටි කරන්නට, අභියාචනා ඉදිරිපත් කිරීම වැළැක්වීමට කටයුතු කර මෙය ඉක්මන් කරන්නට අදහස් කරතත් මේ දෙපාර්තමේන්තුව ඇතුළේමත් හුඟක් දුර්වලකම් තිබෙන බව අපට පෙනීගොස් තිබෙනවා. ඒවා එසේ තිබියදී මේ පනත ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන අදහස කොතරම් දුරට ඉටු වේද කියා හිතන්නට අමාරුයි. ඒ නිසා අඩු වශයෙන් රත්තොට ආසනයේ බෙදාදීම සඳහා තෝරා ගෙන ඇති ඉඩම් කට්ටිවත් බෙදාදීමට ඇති ප්‍රමාදය ගැන කරුණු සොයා බලා ඒවා හැකි තරම් ඉක්මණින් බෙදා දීමට පිළිවෙළක් යොදන හැටියට මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 2.18

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)
*(திரு. பேர்சி சமரவீர—வெலிமடை)*
(Mr. Percy Samaraweera—Welimada)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් අත්පත් කර ගැනීමේ නීතිය සංශෝධනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරවීර මයා.]

කිරීම සම්බන්ධව ඉදිරිපත් වී ඇති මේ පනත උඩ මේ අවස්ථාවේදී ඒ තරම් දීර්ඝ වශයෙන් කථා කළ යුතුයි කියා මා හිතන්නේ නැහැ. එහෙත් මේ සම්බන්ධව මේ ගරු සභාවේදී කරන ලද කථාවලින් අපට හුඟක් දුරට පෙනී ගියේ කුමක්ද? පෞද්ගලික ඉඩම් රජයට අත්පත් කර ගැනීමේ නීතිය සංශෝධනය කරන්නට බලාපොරොත්තු වූ පිළිවෙළේ බරපතලකම විදහා පාමින් ගරු මන්ත්‍රීවරුන් කථා කළ අතර මෙතෙක් රජයට පවරා ගන්නට බලාපොරොත්තු වූ ඉඩකඩම් පවරා ගැනීමේ ප්‍රමාදය ගැන විශාල වශයෙන් සඳහන් වූ බවත් මා අමුතුවෙන් සඳහන් කරන්නට ඕනෑ නැහැ. ඉඩම් අත්පත් කර ගැනීමේ දැනට ඇති නීති රීති සම්බන්ධවත් රජයේ ඉඩම් ඇමතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියා කරවීමේ ඇති ප්‍රමාදය සම්බන්ධවත් මෙහි දී විස්තර වූ ආකාරය හුඟක් දුරට සත්‍යයක් හැටියට අපි මේ අවස්ථාවේදී පිළිගන්නට ඕනෑ. මා කල්පනා කරන හැටියට ඉඩම් අත්පත් කර ගන්නට යෑමේදී දෙපාර්තමේන්තුව නීතිරීති අනුව ක්‍රියා කරන්නට යෑමෙන්ම එවැනි විශාල ප්‍රමාදයක් ඇති වී තිබෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. උදාහරණ කියන්නට ගියොත් උදාහරණ රාශියක්ම කියන්නට පුළුවන්. රජය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලදී දැනට තිබෙන නීතිය අනුවම ක්‍රියා කරන්නට යාම නිසා ඇති වන ප්‍රමාදයන් සම්බන්ධයෙන් එක උදාහරණයක් පමණක් කියන්නම්. මා හිතන හැටියට ඉඩම් ඇමතිතුමා වැලිමඩට පළමු වැනි වතාවට තිල ගමනක් ගියේ 1958 අවුරුද්දේදීයි. ඒ අවස්ථාවේදී එතුමාට සියැසින්ම දැක ගන්නට ලැබුණා, වැලිමඩ නගරයට ආසන්නව උඩහිත් තිබෙන ජනාකීර්ණ ලන්දේගම ග්‍රාමය. එහි අක්කර හයක පමණ ප්‍රදේශයක් තුළ පවුල් පන්සියයක් හයසියයක් පමණ ජීවත් වෙනවා. ඉඩම් ඇමතිතුමාගේ අනුමැතිය ලැබුණු යෝජනාවක් තමයි, සුදු කොම්පැණිකාරයන්ට අයත් "ඌව බෙන් හෙඩ්" කියන වත්තෙන් අක්කර දොළහක් පහළොවක් ගෙන අර ගමේ අයට බෙදා දීම. තමුන්නාන්සේලා අහන්නටත් පුදුම වේවි, අවුරුදු 11ක් ගතා වී 1969 අවසාන භාගයත් ළං වී තිබුණත් නීතියේ දුර්වලකම් නිසා ඇති වූ ප්‍රමාද දෝෂ හේතු කොටගෙන, එම ඉඩම රජයට අත්පත් කර ගන්නට තවම බැරි වී තිබෙනවා. එම නිසා, මේ දක්වාත් ක්‍රියාත්මක වන මේ දුර්වල නීතිය කවර රජයකින් හෝ වේවා කොයි යම් ඉඩම් ඇමතිවරයකු අතින් හෝ වේවා සංශෝධනය විය යුතුමයි. මේ සංශෝධනය සම්බන්ධයෙන් කථා කළ මන්ත්‍රීවරුන් හුඟ දෙනකුම මෙය විවේචනය කළේ සාධාරණ හේතු ඇතිවයි. මගේ පෞද්ගලික අදහසේ හැටියට නම්, "අසුවල් පුද්ගලයන්ට මේ විධියේ සහන දෙන්නට ඕනෑ," යනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේදී රජය යම් යම් පුද්ගලයන්ට සහන දෙන්නට හැදුවොත් නම් අපට ඉදිරියටත් ගමන් කරන්නට සිදු වන්නේ මේ විධියටමයි. එම නිසා, ඉඩම් අත්පත් කර ගැනීමේ නීතිය තව ටිකක් තද වුණාට මා නම් විරුද්ධ වන්නේ නැහැ.

ඉඩම් නැතිකම නිසා අද සෑම පළාතකම වාගේ රජයේ ඉඩම් පවා බලහත්කාරයෙන් වගා කරන පිරිසුත් ඉන්නවා. මහජනතාවට වෛද්‍ය පහසුකම් සැලසීම සඳහා රජයේ ඉඩමක පෞද්ගලික බෙහෙත් මධ්‍යස්ථානයක් ඇති කිරීමට මුල් ගලත් තැබුවාට පසුව ඉඩමේ පවුල් දෙකක් බලහත්කාරයෙන් පදිංචි වුණා. ඔවුන් එම ඉඩමෙන් ඉවත් කිරීම දිසාපතිතුමාටත්, රජයටත් ඒ තරම් ලෙහෙසි පහසු කාර්යයක් වුණේ නැහැ. ඒ, අද තිබෙන නීතියේ ඇති දුර්වලකම් නිසායි. එම නිසාමයි, ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් දැනට තිබෙන නීතිය තව ටිකක් තද වුණාට කමක් නැතැයි මා කියන්නේ.

ඊළඟට තවත් කාරණයක් කිව යුතුව තිබෙනවා. පසුගිය කාලයේ මා මේ ගරු සභාවට එක්තරා යෝජනාවක් ඉදිරිපත් කළා. දැන් එම යෝජනාවම රජයට විරුද්ධ හුඟාක් පළාත් පාලන ආයතනවලින් ඉදිරිපත් කරනවා. ඒ සම්බන්ධයෙන් නොයෙකුත් යෝජනා ප්‍රවෘත්ති පත්‍රවලත් පළ වෙනවා. ඔවුන් අහනවා, මේ රජය ඩී. එම්. කේ. එක ගැන ටිකක් කල්පනාකාරී නොවන්නේ ඇයි කියා. වතුකරයේ දෙමළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උදව්විය නොයෙක් විධියට සංවිධානය වී කවදා හෝ අප සමග සටනට එන්නට සූදානම් වන බවක් පෙනෙනවා. රජය මේ ගැන කල්පනා නොකරන්නේ ඇයි ? උඩරට සෑම වත්තකින්ම අක්කර පණහක් හැටක් පමණ රජයට අත්පත් කරගෙන ඒවායේ සිංහලයන් පදිංචි කරන්නැයි, මට මතක හැටියට පසුගිය අවුරුද්දේදී මා මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා. මා ඒ යෝජනාව ඉදිරිපත් කළේ, වැඩි කාලයක් යන්නට ප්‍රථමයෙන් උඩරට සිංහල ජනතාවට මුහුණ පාන්නට වන බැරෑරුම් ඉඩම් ප්‍රශ්නය සලකාගෙනයි. මගේ ඒ යෝජනාව ක්‍රියාත්මක වෙනවා නම්, කවදා හෝ ඩී. එම්. කේ. ආදි ව්‍යාපාර වලට මුහුණ දෙන්නට පුළුවන් තත්ත්වය කුත් එයින් ඇති වෙනවා. එම යෝජනාව ක්‍රියාත්මක කරන්නට නම් දැනට තිබෙන වාට වඩා විශාල බලතල ඉඩම් ඇමතිතුමාට පැවරිය යුතුයි. එසේ නැතිව නම් කවදාවත් එය ක්‍රියාත්මක කරන්නට බැහැ. වැවිලිකරුවන්ගේ සංගමය නමින් ඉතා ප්‍රබල සංගමයක් තිබෙනවා. එම සංගමය සෑම අතින්ම නීතිය පදනම් කරගෙන නොයෙක් කරුණු ඉදිරිපත් කරන විට, ඊට විරුද්ධව ඉදිරිපත් වී, "අසවල් පොදු කට යුත්ත සඳහා අසුවල් ඉඩම රජයට ගත යුතුමයි" යනුවෙන් කීමට ඉඩම් ඇමති වරයාට පුළුවන් වන විධියේ බලතල එතුමා සතු විය යුතුයි. මේ රටේ මොන ආණ්ඩු තිබුණත් කුමන ඇමතිවරයකු මේ රාජ කාරිය කළත්, ඉඩම් අත්පත් කර ගැනීමේ නීති නම් තව ටිකක් තද විය යුතුමයි. එසේ නීති තද කිරීමෙන්, පොදු ප්‍රයෝජනය සඳහා පහසුවෙන් ඉඩමක් අත්පත් කර ගැනීමේ මාර්ගය පාදා ගත යුතුයි. මේ සංශෝධන පණත කෙසේ වෙතත්, ඉඩම් සම්බන්ධව ඇමතිතුමා අනුගමනය කළ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමෙහි ලා සෑහෙන තරම් ප්‍රමාදයක් සිදු වී ඇති බව අප කවුරුනුත් පිළිගන්නවා. ඒවාගේම, ආණ්ඩු ගණනාවක කාලය තුළ, නීතියේ අවහිරකම් හා අඩුපාඩුකම් නිසාත් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු බොහෝ දුරට ප්‍රමාද වී තිබෙන බවත් ඒ පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්නට බැරි වී තිබෙන බවත් අප කවුරුනුත් දන්නවා. එම නිසා, මින් ඉදිරියටවත් ඉඩම් සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන ප්‍රතිපත්ති ඉතා පහසු වෙනුත් සෑම අතින්ම ප්‍රයෝජනවත් වන අන්දමටත් ක්‍රියාත්මක කිරීමට නිළධාරීන්ට අවස්ථාව ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

මගේ කථාව අවසාන කරන්නට පෙර තවත් කිව යුත්තක් තිබෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) කථා කරන විට මාත් මෙම ගරු සභාව තුළ සිටියා. එතුමාට කථා කරන්නට තිබුණේ ඉඩම් අත්පත් කර ගැනීමේ නීතිය සංශෝධනය කිරීම පිළිබඳව බව එතුමා අමතක කළා. නුවරඑළියේ කච්චේරියේ ඉඩම් නිළධාරීන්ට එතුමා ඉතා බරපතල චෝදනාවක් එල්ල කළා. නුවර එළියේ කච්චේරියේ ඉඩම් නිළධාරියකුට රු. 250 ක් දුන්නොත් ඕනෑම කෙනකුට ඉඩමක් ලබා ගත හැකියයි එතුමා කිව්වා. මා මේ සම්බන්ධව කථා කරන්නේ ඉතා කණගාටුවෙනුයි. මුළු උඩරටම බාරව වැඩ කළ, උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවේ සභාපතිව සිටි විජේකෝන් මහත්මයායි දැන් නුවරඑළියේ මහ දිසාපති වශයෙන් කටයුතු කරන්නේ. වලපනේ ගරු මන්ත්‍රීවරයා කළ ප්‍රකාශය, නුවර එළියේ දිසාපතිතුමාගේ මුහුණේ දැළි ගාන්නට එතුමාට අපහාසයක් කරන්නට කළ එකක් හැටියටයි මා සලකන්නේ. මින් මත්තට මෙම ගරු සභාව තුළදී මේ විධියේ බරපතල චෝදනාවක් යම් කෙනකුට විරුද්ධව කරන විට, එය ඔප්පු කරන්නට පුළුවන් වන අන්දමට ඉදිරිපත් කරන්නට වග බලා ගත යුතුයි. නුවරඑළියේ කච්චේරියේ නිළධාරියකුට රු. 250ක් දුන් විට ඉඩමක් ලබා ගන්නට පුළුවන්යයි ගරු මන්ත්‍රීවරයකු මෙම ගරු සභාව තුළදී ප්‍රකාශ කරන විට, එම මුදල මහ දිසාපති ගන්නවාද, අතිරේක දිසාපති ගන්නවාද, ඉඩම් නිළධාරියකු ගන්නවාද, ආදායම් පාලක නිළධාරි තැන ගන්නවාද යන වග අප දන්නේ නැහැ. එම නිසා, මෙවැනි චෝදනාවක් ඉදිරිපත් කරන විට, අසුවල් නිලධාරියා මෙපමණ මුදලක් ලබාගෙන අසුවල් ඉඩම අසුවලාට දී තිබෙනවාය ආදි වශයෙන් විස්තර සහිතව එය ඉදිරිපත් කළ යුතුයි. මගේත් ඥාතිවරයකු නුවර එළියේ කච්චේරියේ සේවය කරන නිසා මෙම චෝදනාව ගැන මටත් හුඟක්ම හිතට අමාරුයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරවීර මයා.]

ඔබ මේ චෝදනාව කරන්නේ අසුවල් නිලධාරියාටදැයි මා වලපනේ ගරු මන්ත්‍රීතුමාගෙන් ඇසුවා. "නැත, අසුවල් නිලධාරියාටය" යි ඒ අවස්ථාවේදී එතුමා කිව්වා. කාට වුවත් මෙවැනි චෝදනාවක් කරන විට එය සම්පූර්ණයෙන් ඔප්පු කළ හැකි අන්දමට කළ යුතුයි. ඕනෑම දෙයක් මෙම ගරු සභාව තුළදී කියා බේරී යන්නට පුළුවන් වුණු පළියට මෙවැනි ප්‍රකාශ කිරීම කිසිම වැදගැන්මකට නැහැ. පත්තර මාර්ගයෙන් මේවා මහජනයා අත රට ගිය විට ඔවුන් මේවා ගැන මොන විධියට කල්පනා කරත්දැයි අප දන්නේ නැහැ. එම නිසා ගරු සභාපතිතුමනි, මින් මතුවට මෙවැනි චෝදනාවක් මෙම ගරු සභාව තුළදී ඉදිරිපත් කෙරෙතොත් ඔප්පු කළ හැකි අන්දමට ඒවා ඉදිරිපත් කළ යුතුය යන හැඟීම ගරු කථානායකතුමා ඇතුළු තමුන්නාන්සේලා සියලුදෙනාම මෙම ගරු සභාවට දෙනවා ඇතැයි විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.30

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*
(Mr. M. Tennekoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගෙ විශ්වාසයේ හැටියට ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සංශෝධනය කරන්නට සිද්ධ වී තිබෙන්නේ අවුරුදු 20 කට පමණ පසුවයි. එසේ සංශෝධනය කිරීමේදීත් ඉඩම් හිමියන්ට යම් අසාධාරණයක් සිද්ධ වන නිසා එම තත්ත්වය සාධාරණ කර ගැනීම පිණිස යම් යම් සංශෝධන කිරීමට දෙපැත්තම එකතු වී එකඟ වීම ගැන අප සන්තෝෂ වෙනවා. එහෙත් ඉඩම් ආඥා පනතේ පරමාර්ථයන් අනුව එම පනත මුලින් සකස් කළ අවස්ථාවේදී එයින් සහනයක් ලැබීමට බලාපොරොත්තු වූ කොටසට සාධාරණය ඉෂ්ට වී තිබෙනවාද කියා අප ටිකක් පරීක්ෂා කර බැලීම වැදගත් යයි මා විශ්වාස කරනවා.

1949 දී මෙම පනත ඉදිරිපත් කළ කතෘවරුන් ඒ අවස්ථාවේදී බලාපොරොත්තු වුණේ මේ රටේ නොයෙකුත් පොදු කටයුතුවලට ඉඩම් අත්පත් කර ගැනීම වඩා ඉක්මන් කිරීමත් සමගම ගම් පළල් කිරීම යටතේ ගොවිතැනක් බතක් කරගන්නට නැති කෙනෙකුට එය කරගැනීමට ගෙයක් දොරක් සාදා ගැනීම පිණිස ඉඩම් කොටසක් ලබා දීමත් රජයේ වැදගත් යුතුකමක් හැටියට සලකා ඒ කාර්‍යයන් ඉෂ්ට කර ගැනීමයි. එහෙත් අවුරුදු 20කට පසුව, මා සඳහන් කළ ඒ දෙවැනි කාරණය ඉෂ්ට වී තිබෙනවාද කියා අප ආපසු හැරී බලන්න ඕනෑ. ඒ මොකද? ඉඩම් අත්පත් කර ගැනීමේ පනතත්, ඉඩම් අත්පත් කර ගැනීමත්, එසේ අත්පත් කරගනු ලබන ඉඩම් කොටස් මහජනයාගේ පොදු ආර්ථික තත්ත්වය නගා සිටුවීම පිණිස ඉඩම් කැබැල්ලක් නැති කෙනකුට ලබා දීමත් විශේෂයෙන් කන්ද උඩ රට ආර්ථික තත්ත්වය ආරක්ෂා කරන වැදගත්ම පියවරක් හැටියට සැලකිය යුතු නිසයි.

මේ රජය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සංශෝධනය කිරීමට යන අවස්ථාවේදී අපට කුතුහලයක් ඇති වුණා, මෙම සංශෝධනය කරන්නේ ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටින ඉඩම් නැති වැසියන්ට ඉඩම් කොටසක් හැකි තරම් ඉක්මනින් ලබා දීමේ පරමාර්ථය ඇතුවද, එසේ නැත්නම් පොදු වැඩ පිණිස නොයෙක් නොයෙක් අවස්ථාවලදී ඉඩම් පවරා ගැනීම් අවශ්‍ය වූ විට ඒවා ඉක්මන් කර ගැනීමේ අදහස ඇතුවද, එසේත් නැත්නම් ඒ දෙකටම විරුද්ධව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ මාර්ගයෙන් තමන්ගේ දේශපාලන විරුද්ධවාදීන්ගෙන් පලි ගැනීමේ අදහස ඇතුවද කියා. එවැනි කුතුහලයක් ඇති වීමට හේතු වූයේ මේ රජය බලයට පත් වූවාට පසුව ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්‍යයන් විශේෂයෙන්ම ගම් පළල් කිරීම පිණිස කොයි තරම් දුරට වේගවත් වී තිබෙනවාද, ක්‍රියාත්මක වී තිබෙනවාද කියන කාරණය කෙරෙහි සැලකිල්ල යොමු කිරීමෙනුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රජය නිතරම ගොවියාගේ පැත්ත ගන්නා බව, ගොවියාට උදව් කරන බව ගොවියාට සහාය වන බව කියනවා. එය එසේ නම් ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ ඉඩම් ලබාගෙන කන්ද උඩරට ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජීවත්වන අහිංසක ගොවි ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය නිරාකරණය කර දීමට කොයි තරම් දුරට 1965 සිට මේ දක්වා මේ රජය ක්‍රියා කර තිබෙනවාද, එයින් ඒ ගොවි ජනතාව සෑහීමකට පත්ව සිටින වාද කියන ප්‍රශ්න නැගුවොත් ඊට සෑහෙන පිළිතුරක් දෙන්නට මේ ආණ්ඩුවට පුළුවන්කමක් ඇතැයි මා කල්පනා කරන්නේ නැහැ. එය එසේ වුණත් මේ ආණ්ඩුව වගා ව්‍යාපාරය සාර්ථක කර ගැනීම පිණිස යයි කියමින් රජයේ ඉඩම් කොටස් පෞද්ගලික ව්‍යාපාරිකයන්ට බෙදා දීමේ වැඩ පිළිවෙළක් සූදානම් කළා. මේ අන්දමට රජයේ ඉඩම් වෙළඳ ව්‍යාපාරිකයනට කිසිම ලෝභකමක් නැතුව, පරිත්‍යාගශීලීව, පුළුල් ලෙස බෙදා දුන් අතර, කන්ද උඩරට වතුකරයේ හිරවී මිරිකී සිටි අහිංසක ගොවි ජනතාවට, විදේශීය කොම්පැනිකාර වතු හිමියන් ගෙන් අක්කර කාල, භාගය ප්‍රමාණයේ ඉඩම් ලබාගෙන, ඒ අයට බෙදා දී, ඔවුන්ගේ ඉඩම් ප්‍රශ්නය නිරවුල් කර දීමට කොයි තරම් දුරට නිර්ලෝභී වුණාද කියන කාරණය මෙහිදී අපේ සැලකිල්ලට භාජන කළ යුතුව තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඉඩම් අත්පත් කර ගැනීම ගැන කරුණු සෙවීමේදී, 1963-64, 1964-65 සහ 1965-66 යන වර්ෂ වෙනුවෙන් ඉඩම් කොමසාරිස්තුමා නිකුත් කර ඇති වාර්තා බැලූ විට අපට පෙනී යනවා ඉඩම් අත් පත් කර ගැනීම සම්බන්ධයෙන් ඇති වී තිබෙන වෙනස් කම් ගැන. ධනපති වතු හිමියන්ට, විදේශීය කොම්පැනි කාර වතු හිමියන්ට වාසි වන අයුරින් එම වෙනස් කම් ඇති වී තිබෙන බව පැහැදිලිව පෙනී යන කාරණයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1963-64 වර්ෂය තුළ, කඳුකර ප්‍රදේශයේ ඉඩම් අත් පත් කර ගැනීම සඳහා වැය කර ඇති මුදල රු. 6,895 යි. 1964-65 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා යම් මුදල් කොටසක් වෙන් කර තිබෙන අතර එවකට තිබුණු ආණ්ඩුව විශේෂ බදු ක්‍රමයක් ඇති කිරීමට සැලකිල්ල යොමු කර තිබෙන බව පෙනී යනවා. එපමණක් නොවෙයි, ඒ අවස්ථාවේදී ඉඩම් කොමසාරිස්වරයා එතුමාගේ වාර්තාවෙන් පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා, ඉඩම් දීමේදී මධ්‍යම පංක්තියට ඉඩම් අක්කර විශාල ප්‍රමාණයක් දීමට වඩා සුළු ඉඩම් කොටස් ගොවියන්ට බෙදා දීම වඩාත්ම ප්‍රයෝජනවත් බව. මධ්‍යම පන්තියේ පුද්ගලයා ඉඩම්වලින් ආදායම ලබන්නේ කොයි විධියටද යන්න මේ වාර්තාවේ සඳහන් වෙනවා. මේ ආණ්ඩුව බලයට පත්වූදා සිටම ඉඩම් වගාව, ඉඩම් වගාවේ වැඩි වටිනාකම සහ බර, වැඩි වගකීම් මධ්‍යම පන්තියේ පුද්ගලයාට පවරා ඔය විශේෂ බදු මණ්ඩලය ආදී නොයෙක් ක්‍රම යටතේ මධ්‍යම පන්තිකයන්ට ඉඩම් පවරා දුන්නා. නමුත් මේ මධ්‍යම පන්තියේ පුද්ගලයා ඉඩම්වලින් ආදායම ලබන්නේ කොයි ආකාරයටද? ඒ සම්බන්ධයෙන් 1964-65 ඉඩම් කොමසාරිස්තුමාගේ පාලන වාර්තාවේ 7 වන පිටුවේ මෙසේ සඳහන් කර තිබෙනවා :

> "...මධ්‍යම පංතියේ පුද්ගලයා, තේ, රබර්, පොල් වැනි ස්ථිර වාණිජ වැවිලි පමණක් වඩා හොඳින් කල හැකි ඉඩමෙහි නිරතුරුව නොසිටින ඉඩම් හිමියෙක් විය. නැවත වගා කිරීම, ශස්‍ය මාරු කිරීම හා එළු, මිරිස් හා ඇට වර්ග වගා කිරීමට අවශ්‍ය පරිශ්‍රමය ගැන උනන්දුවක් ඔහු නොදැක්වීය. දිනපතාම ඉතා කිට්ටු පරිපාලනයක් අවශ්‍ය විශාල වශයෙන් සතුන් ඇති කිරීමට ඔහු උනන්දුවක් නොදැක්වීය."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අපට පෙන්නුම් කරන්නට වුවමනා කරන්නේ කන්ද උඩරට වාසය කරන ගම්වාසීන්ට ඉඩම් නැතිකම නිසා තමන්ගේ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කර ගැනීමටත් ගොවිතැන් කිරීමටත් විශාල අවහිරයක් අමාරුවක් ඇති වී තිබෙන බවයි. ඒ ප්‍රශ්නය නිරාකරණය කිරීමට උපයෝගී කර ගත හැකි වැදගත් පනතක් තමයි මේ රජයට ඉඩම් අත්පත් කර ගැනීමේ පනත. නමුත් මේ පනත එම ප්‍රදේශවල ගැමියාගේ ආර්ථික තත්ත්වය නගාසිටුවීම පිණිස ක්‍රියාත්මක වන්නේ නැහැ. වතුවලට අයත් ඉඩම් වලින් සියයට 2 ක් අත්පත් කර ගන්න වාය කියා එක් කාලයකදී කියවුණා. නමුත් ඒ වැඩ පිළිවෙළත් ක්‍රියාවේ යෙදුණේ නැහැ. ගම් අවට තිබෙන වතු වලට අයිති ඉඩම් එමට තිබෙනවා. සමහර වතුවලට අයත් ඒ ඉඩම්වල කිසිම වගා ... නැහැ. ඒවා නිකම්ම මුඩු බිම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ප්‍රමණයි. නමුත් එවැනි ඉඩම්වත් පවරා ගැනීමට රජයට පුළුවන්කමක් නැහැ. මක්නිසාද? මේ රජයට උදව් උපකාර කරන, රජයේ ප්‍රතිපත්තිවලට එකඟව ක්‍රියා කරන, ධනපති සමාගම් හිමි ඉඩම් හිමියන් අසතුටු කරවන්නට රජයට ශක්තියක් නැති නිසයි. මා මුලින් සඳහන් කළාක් මෙන් මේ රජය උසස් මධ්‍යම පන්තියට සහ වගා ව්‍යාපාරවල නියුක්ත සමාගම්වලට රජයේ ඉඩම් බෙදා දීමට දැක්වූ උනන්දුව, ඕනෑකම සහ හදිසිය විශේෂයෙන්ම ගෙයක් දොරක් සාදා ගැනීම පිණිස ඉඩම් කැබැල්ලක් නැතිව ඉඩම් පිපාසයෙන් සිටින ගැමියා කෙරෙහි කොයි තරම් දුරට දක්වා තිබෙන වාද යන ප්‍රශ්නයයි මේ අවස්ථාවේදී මා මතු කරන්නෙ. අන්න ඒ කාරණය පැහැදිලි කර දීම අවශ්‍ය වී තිබෙනවා. මේ තරම් දරුණු නීති ඇතිව මේ පනත් කෙටුම්පත සකස් කර ඉදිරිපත් කළේ කාගේ අවශ්‍යතාවක් පිණිසද කියා අප තුල සැකයකුත් පහළ වන්නේ ඒ තත්ත්වය නිසයි.

1965, 1966 වන විට අර මුලින් තිබුණු තත්ත්වය වෙනස් වුණා. ඉඩම් කොමසාරිස්තුමාගේ පාලන වාර්තාවේ 11 වන පිටුව බැලුවොත් කොයි විධියට මධ්‍යම පන්තියට ඉඩම් බෙදා දී තිබෙන වාද යන්න පෙනෙනවා. විශෙෂ බදු මණ්ඩලය යටතේ දී ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 57,415 යි. 1966 වර්ෂය අවසාන වන තෙක් බෙදා දී තිබෙන සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයයි ඒ. මෙම ඉඩම් දී තිබෙන්නේ අවුරුදු 25ක කාලයක් තුළදීයි. ඒ අනුව නොයෙකුත් දේවල් දී තිබෙනවා. එහි සඳහන් වී තිබෙනවා, මේ ක්‍රමය යටතේ අක්කර 70,000 ක් පමණ බෙදා දී තිබෙන බව. ඉඩම් කොමසාරිස්තුමාගේ 1965-66 පාලන වාර්තාවේ 12 වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා :

"සීමාසහිත ඉඩම් බෙදා දීමේ ක්‍රමය යටතේ අළුතින් ඉඩම් බෙදා දී නැත. දැනටමත් මේ යටතේ බෙදා දී ඇති විශාල ඉඩම් ප්‍රමාණය සමාලෝචනයට භාජනය කෙරෙන බව මගේ පසුගිය වාර්තාවේ සඳහන් විය. අනුරාධපුර, පොළොන්නරුව, යාපනය, මන්නාරම, වවුනියාව, බදුල්ල, මොණරාගල, මඩකලපුව, පුත්තලම, කුරුණෑගල, මාතලේ සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල දළ වශයෙන් ඉඩම් අක්කර 70,000 ක් පමණ මේ ක්‍රමය යටතේ බෙදා දී තිබේ."

මධ්‍යම පන්තියටත් ධනපති සමාගම්වලටත් මේ රජය පත් වුණු අවස්ථාවේදීම මේවා බෙදා දී තිබෙනවා. මෙම පනත යටතේ ඉඩම් අත්පත් කර ගෙන කොතරම් අක්කර ප්‍රමාණයක් බෙදා දී තිබෙනවාද යන්නයි අප අහන්නේ—[බාධාකිරීමක්] 70,000ක්. ගම් පුළුල් කිරීමට හා ජනපද පිහිටුවීමට මේ අත්පත් කිරීම යටතේ කොතරම් ප්‍රමාණයක් අරගෙන තිබෙනවාද? 1966-67 ප්‍රධාන තක්සේරුකරුගේ පාලන වාර්තාවෙන් මම කියවන්නම් :

"ගම් පුළුල් කිරීමට හා ජනපද පිහිටුවීමට තක්සේරු කිරීම—සමාලෝචනයට භාජන වූ වර්ෂයේ ප්‍රමාණයෙන් අක්කර 448 කින් යුත් කැබලි 71 ක් රුපියල් 6,71,188 කට තක්සේරු කර තිබේ."

එක පැත්තකට 70,000 ක් බෙදෙන විට අනික් පැත්තට 448 යි. මේ රජයේ ඉඩම් ප්‍රතිපත්තිය විශෙෂයෙන් පැහැදිලි වන්නේ කන්ද උඩරට ඉඩම් අත්පත් කර ගැනීමේ බලතල යටතේ කෙරෙන කටයුතුවලිනුයි. ඒ පැතිවල රජයේ ඉඩම් නැහැ. එසේ හෙයින් කන්ද උඩරට ප්‍රදේශයේ වාසය කරන අයට තමන්ගේ ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීමට හා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නම් මෙන්න මේ ඉඩම් අත්පත් කිරීමේ පනත හරියාකාර ක්‍රියාවේ යෙදවෙන්නට ඕනෑ. එහෙත් එය ක්‍රියාවේ යෙදෙන්නේ නැහැ. එය ක්‍රියාත්මක වන්නේ උදාසීන ලෙසයි; හෙමින් හෙමිනුයි.

ඇමතිතුමා සියයට 2ක් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තියත් වෙනස් කර තිබෙනවා. ඒ පිළිබඳව අක්කර සිය දහස් ගණන් තිබෙන වතුවලින් අක්කර පහක් හයක් ලබාගෙන එය ළඟම සිටින ගම්වාසීන්ගේ අත්‍යාවශ්‍යතාවන් පිරිමසා ගැනීම සඳහා යොදවන්නැයි කී විට ඒ පිළිබඳව එන විරුද්ධතාවන්ටයි වැඩි වාසියක් සැලසෙන්නේ. වැඩි වැඩියෙන් ප්‍රමාණයක් ඉටු කරන්නට කවුරුත් බලාපොරොත්තු වන්නේ අන්න ඒ ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හිමියාටයි. එසේ වුවද මුල් පනතේ කර්තෘවරුන්ගේ අදහස අනුව වැඩියෙන් සාධාරණයක් ඉෂ්ට විය යුතු අසරණ ගැමියන්ට, ඉඩම් නැත්තවුන්ට මෙම පනතෙන් සාධාරණයක් යුක්තියක් ඉෂ්ට වන්නේ නැහැ. ඒ නිසා මෙම පනත මේ විධියට සංශෝධනය කිරීමෙන් පමණක් සෑහීමට පත් විය නොහැකි බව ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. කඩුකර ප්‍රදේශයේ ගම්වාසීන්ගේ ඉඩම් පිපාසය නැති කිරීම සම්බන්ධයෙන් කුමන විධියේ ස්ථිර පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවාදැයි ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමතියි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නද? වාඩි වන්න; උත්තර දෙන්නම්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
උත්තර දුන්නාට පසුව මට නැවත කථා කරන්නට ඉඩ ලැබෙනවාද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනය කරන මේ අවස්ථාවේදී වැඩියෙන්ම ආරක්ෂාව අවශ්‍ය ව සිටින ගම්බද ඉඩම් නැත්තවුන්ගේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම පිණිස මෙම පනත කුමන අන්දමට සංශෝධනය කරනවාදැයි දැන ගන්නට සතුටු බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 2.52

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු දොළහක් පමණ තිස්සේ නිදාගෙන සිට හදිසියේ අවදි වී වට පිට බලන්නකුට හරි ලෙස අවට ලෝකය නොපෙනෙන් නා සේ ඉඩම් අමාත්‍යාංශයත් ඉඩම් දෙපාර්තමේන්තුවත් නින්දේ පසු වී හදිසියෙන් මෙන් අවදිව ඉදිරිපත් කරන ලද පනත එහෙන් මෙහෙන් කපා කොටා කෑල්ලක් පමණක් ඉතිරි කරගෙන තිබෙනවා. මේ පනත නිසා හෝ මේ රටේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සාර්ථක අන්දමින් ඉෂ්ට වෙතැයි මට නම් හිතන්නට අමාරුයි. ඇත්තෙන්ම ඉඩම් දෙපාර්තමේන්තුව ඒ තරමටම මානසික වශයෙන් හා කායික වශයෙන් ලෙඩට වැටුණු දෙපාර්තමේන්තුවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අද උදේ පානදුරේ සිට ලිපියක් ලැබී තිබෙනවා —[බාධාකිරීමක්] මේ දනුයි, ඒ ලියමන ලැබුණේ. මේ, ඒ ලිපියේ පිට කවරයයි. ලියමනේ මෙසේ සඳහන් වෙනවා:

"මෝහන විද්‍යාවේ හාස්කම

මෙය ධන්‍යනලාභී බෞද්ධයකුගේ විසිපස් අවුරුදු පර්යේෂණයක ප්‍රතිඵලයකි. මෝහන නින්දට වැටුණු මාතාවගේ මාර්ගයෙන් ඕනෑම කෙනකුගේ මානසික ශාරීරික ලෙඩ රෝග ගැන පැහැදිලි විස්තරයක් සහ අවශ්‍ය ප්‍රතිකාර ලබා ගත හැක. රුපියල් 10 යි."

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කාටත් හම්බ වුණා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේ මෝහන විද්‍යාත්මක යෝගාවචර නැනැත්තා ළඟට ගරු ඉඩම් ඇමතිතුමා යනවා නම් හොඳයි. එතකොට ලෙඩ රෝග දැනගෙන කටයුතු කරන්නට පුළුවන් වෙයි. එසේ නැතිව නම් මේ ඉඩම් අංශයේ තිබෙන දූෂණ, අකාර්යක්ෂමතාව, අසාධාරණ ක්‍රියා වළක්වා ගන්නට පුළුවන්දැයි මට නම් හිතෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු ගැන විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රී වරුන්ගේ පමණක් නොව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේත් ලොකු දුක්ගැනවිල්ලක් තිබුණා. ඉඩම් අත්පත් කර ගන්නා ආකාරය ගැන තද බල විවේචනයක් ඇති වුණා. ආණ්ඩු පක්ෂයේ උදවිය දෙපිලකට බෙදී සිටින බව හොඳ හැටි පෙනුණා. ඇමතිවරුන් සහ පාර්ලිමේන්තු ලේකම්වරුන් අතර ගැටුම් තිබෙන බව පෙනුණා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඒවා ගෙදර රණ්ඩු.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒවා ගෙදරදීම කර ගත්තා නම් වඩා හොඳයි. මෙතනට නැවිත් ගෙදරදීම කර ගත්තා නම් හොඳයි. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෙදර රණ්ඩු වුණත් ඉවසා ගන්න බැරි තරම් ඒවා උග්‍ර වී තිබෙන නිසා තමයි, මේ මන්ත්‍රී මණ්ඩලයේදී ඒවා පිට කරන්න සිදු වුණේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඇත් ඉවරයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නමුත් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඉඩම් දෙපාර්තමේන්තුව ගැන කතා කරනවා නම්—විස්තර වශයෙන් කතා කරනවා නම්—මා හිතන හැටියට පැය ගණනා වක්ම කතා කරන්න සිදු වෙනවා. නමුත් එයට කාලය මදි. ඒ නිසා ඉඩම් දෙපාර්ත මේන්තුව සම්බන්ධයෙන් කෙටියෙන් කරුණු කිහිපයක් කියන්න මා බලා පොරොත්තු වෙනවා.

තමුන්නාන්සේත් දන්නවා මේ රටේ වැඩි වන ජනගහනය අනුව ගම් පුළුල් කිරීමේ කටයුතු කිරීමට සිදු වන බව. ඒ අනුව ඉඩම් ගෙන ගම් පුළුල් කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට ඉඩම් අමාත්‍යාංශයට සිදු වෙනවා. නමුත් මේ ඉඩම් අමාත්‍යාංශය—ඉඩම් දෙපාර්ත මේන්තුව—මේ ගරු සභාවේ සම්මත වුණ යෝජනාවල් ගැනවත් සැහෙන සැල කිල්ලක් දක්වා නැති බව අද අපට කන ගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා, මාතර කොට්ඨාශයේ තිබෙන ඉඩම් හිඟය වැළැක්වීම පිණිස ගංවතුරෙන් අනාථ වන, ගංවතුරෙන් උන් හිටි තැන් නැතිව පීඩා විඳින ජනතාවට උස් බිම් ලබා දෙන්න වහාම කටයුතු කරන්නය කියා. ඒ සඳහා ඉඩම් කිහිපයක් රජයට අත්පත් කර ගත යුතුය කියායි මා යෝජනාව ඉදිරිපත් කළේ. එම යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කර ගන්නත් පුළුවන් වුණා. එම යෝජනා වෙන් මා විශේෂයෙන් කියා සිටියේ නායිම්මන හිරිදෙනිකන්ද කියන ගමේ වැඩකට ගන්න බැරුව තිබෙන අක්කර 29 ක් පමණ වූ බිම් ප්‍රමාණයක් ඇති මාලිගාතැන්න කියන ඉඩම ගැනයි; ඒ වගේම මැද්දවත්තේ කුරුඳුවත්ත කියන ඉඩම; ඊළඟට කනත්තෙගොඩ අප්පුගෙ වත්ත කියන ඉඩම; වල්ගම නාරඋඩ වත්ත හෙවත් හාමුගේ වත්ත කියන ඉඩම. මේ ඉඩම් රජයට අත්පත් කර ගෙන ඉඩම් නැති, ගංවතුරෙන් පීඩාවට පත් වන ඒ ජනතාව—ඒ දුප්පත් මහ ජනතාව—අතර බෙදා දෙන්නය කියායි මා ඉල්ලා සිටියේ. නමුත් ඒ යෝජනා වල් ගැන කිසිම සැලකිල්ලක් දක්වන බවක් නම් අපට පෙනෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගරු සභාවේ සම්මත වුණ යෝජනාවල් ගැන ඉඩම් අමාත්‍යාංශය කීරි අලියෙක් වගේ බලා ගෙන සිටිනවා නම් එම අමාත්‍යාංශය මේ ගරු සභාවට කොයි තරම් ලොකු නොසැලකිල්ලක් දක්වනවාද කියා කල්පනා කර බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ඉදිරිපත් කළ එම යෝජනාවේ තිබෙන ඉඩම් වලින් එක් ඉඩමක් ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. එම ඉඩම පසුගිය ආණ්ඩු කාලයේදී රජයට අත්පත් කර ගත් ඉඩමක්. නමුත් මේ හත් හවුල් ආණ්ඩුව බලයට පත් වූවාට පසුව එම ඉඩම ආපසු ඉඩම් හිමියාට පැවරුවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
අත්පත් කර ගත්ත ඉඩමක් ආපසු පවරන්නේ කොහොමද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අක්කර 29 ක් පමණ වූ ඒ ඉඩම ආරෝග්‍යශාලාවක් තැනීමටය කියායි ලබා ගත්තෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ආරෝග්‍යශාලාවක් තැනීමටයි ගෙන තිබෙන්නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ආරෝග්‍යශාලාවකටය කියා ඒ ඉඩම අත්පත් කර ගත්තා. නමුත් ආරෝග්‍ය ශාලාව සාදන ස්ථානය වෙනස් කිරීම නිසා මොකක්ද කළේ? වහාම එය එම ඉඩම් හිමියාට ආපසු පවරා දුන්නා. හේතුව මොකක්ද? එම ඉඩම නමුත් නාන්සේලාගේ පක්ෂයේ නායකයෙකුට අයිති ඉඩමක් වීමයි. අක්කර 29 ක් විශාල, නාරෝදවත්ත නම් වූ මේ ඉඩමේ අයිතිකරු නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (රණවීර මයා.) නිසා වන්නට ඇති ඒ විධියට සිදු වන්නට ඇත්තේ. ආරෝග්‍ය ශාලාවක් හදන්නටයි මේ ඉඩම ගත්තේ. ආරෝග්‍යශාලාවක් තැනීම නවත්වා, තිබෙන ආරෝග්‍යශාලාවම වැඩි දියුණු කරන්නට තීරණය කළ හැටියේම ඉඩම ආපසු භාර දුන්නා. ගංවතුරෙන් යට වන ප්‍රදේශවල අමාරුවෙන් වාසය කරන දුප්පත් මිනිසුන් අතර මේ ඉඩම කොටස් වලට කඩා බෙදා දිය යුතුයයි උද්ඝෝෂණයකුත් තිබුණා. තවත් පැත්තකින් ගුරු අභ්‍යාස විද්‍යාලයක් මාතර පිහිටුවන්නට මේ ඉඩම ගන්නැයි ඉල්ලීමක් තිබුණා. මාතර කච්චේරියේ නිලධාරීන්ට නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා මේ ඉඩම ගන්නැයි තවත් එක පැත්තකින් ඉල්ලුවා. ඒ නිලධාරීන්ට ඉන්නට ගෙවල් නැහැ. ඒ නිසා ඒ අයට බදු ගෙවලයි ඉන්නට සිදු වී තිබෙන්නේ. නිවාස යෝජනා ක්‍රමයක් ඇති කරන්නැයි ඒ උදවිය ඉල්ලා සිටියත්, වෙනත් නොයෙක් නොයෙක් අය ඉල්ලා සිටියත්, ඒ එකකටවත් ඇහුම්කන් නොදී වහාම කෙළේ මේ ඉඩම එහි අයිතිකාරයාටම ආපසු පවරා දීමයි.

1968 අප්‍රේල් මාසයේ 30 වැනිදා, මේ ඉඩමට නොදුරින් ජීවත් වන ඉඩම් නැති අය ගිහිල්ලා පොඩි පැල්පත් හදාගෙන පදිංචි වුණා. පොලීසිය ගිහිල්ලා ඒ පැල්පත් ගිනි තබා ඒවායේ පදිංචි වී සිටි අය එලවා දැම්මා. මෙය සිදු වන විට මා ලංකාවේ සිටියේ නැහැ, පිටරටකයි හිටියේ. මා සිටියා නම් පොලීසියට මිනිසුන් එලවා දමන්ට ඉඩ දෙන්නේ නැහැ. පොලීසියට කිසිම යුතුකමක් නැහැ ගෙවල් ගිනි තියන්නට. පොලීසිය කර තිබෙන්නේ අසාධාරණ ක්‍රියාවක්. මිනිසුන් උසාවියට ඉදිරිපත් කරන එක වෙනම කාර්යයක්. ගෙවල් ගිනි තියන්නට පොලීසියට කිසිම යුතුකමක් නැහැ.

මේ ඉඩම කිසිම ප්‍රයෝජනවත් වැඩකට යොදා නැහැ. ළඟදී එය කොටස්වලට කඩා විකුණන්නට වැඩ පිළිවෙළ යෙදුවා. වෙන් දේසිකරුවකුට භාර දී විකුණන්නට නැත් කළ අවස්ථාවේ පළාතේ මහජනයා එකතු වී ඒ කොටස් මිලයට ගැනීමට ආ අය ගෙන් ඒවා නොගන්නා ලෙස ඉල්ලීමක් කළා. ඒ නිසා ඒ ඉඩම විකුණන්නට බැරිව ගියා. ඉඩම තවමත් ඒ විධියටම තිබෙනවා. මේ ඉඩමේ පොල්වත් හරියාකාර වැවෙන්නේ නැහැ. කිසිම වැඩකට නොගෙන නිකම් තිබෙන්නට හැර ඇති මේ ඉඩම එයින් නියම ප්‍රයෝජනයක් ගත හැකි වැඩකට යොදන්නට ඕනෑ. දුප්පත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ජනයාට මෙය බෙදා දෙන්නට ඕනෑ. ආණ්ඩුව එය කරන්නට ලෑස්ති නැහැ. අනෙක් ඉඩම් ගැන කියන්නට තිබෙන්නෙත් මේ තත්ත්වයේ දේවල්මයි.

තවත් ඉඩම් කිහිපයක් ගැන මතක් කරන්නට කැමතියි. ඉඹුල්ගොඩ හේන නමින් තවත් ඉඩමක් තිබෙනවා. එය පිහිටා තිබෙන්නේ අකුරැස්ස මැතිවරණ කොට්ඨාශය තුළයි. අක්කර 175ක් පමණ විශාල මෙය මුඩු ඉඩමක්. 1964 දී මේ ඉඩම ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ගැනීමට වැඩ කටයුතු ආරම්භ කළා. මෙය අවුරුදු 75ක් තරම් වූ දීර්ඝ කාලයක් තිස්සේ කැලෑවට පරිවර්තනය වෙලා තිබෙන ඉඩමක්. ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ අත් කරගෙන මහජනයා අතර බෙදා දෙන්නට යෝජනා කළ අවස්ථාවේ ඉඩම් හිමියා ඊට විරුද්ධ වුණා. කිසිම හේතුවක් නැහැ, විරුද්ධ වීමට. අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ කැලෑවක් බවට පරිවර්තනය වෙමින් තිබෙන මේ ඉඩම වැඩි දියුණු කරන්නට ඉඩම් හිමියා කිසිම දෙයක් කෙළේ නැහැ. දැන් එය කැලෑවක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. පරීක්ෂණවලින් පසු දිසාපතිතුමා නිර්දේශ කළා, ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ මේ ඉඩම් පවරා ගන්නට ඕනෑය කියා. ඒ නිසා එක පවුලකට නිවාස තනා ගැනීමට අක්කර කාල බැගිනුත් නිවාස තැනීමට නුසුදුසු ඉඩම් වෙනත් වගාවන් සඳහා—විශේෂයෙන්ම කුරුඳු වගාවට සුදුසු නිසා කුරුඳු වගාව සඳහා—අක්කරය බැගිනුත් දෙන්නට දිසාපතිතුමා යෝජනා ඉදිරිපත් කර තිබුණා. 1965 අවුරුද්දේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව මෙහි අවශ්‍ය මැනුම් කටයුතු සම්පූර්ණ කළා. ඒ සඳහා රුපියල් 10,000 ක් පමණ වියදම් වුණා. එසේ වියදම් කර ඒ කටයුතු නිම කළාට පසු මේකට විරුද්ධත්වයක් ඇති වුණා. එහි මූලිකයා වශයෙන් කටයුතු කළේ වැලිගම් කෝරලයේ ආදායම් පාලක නිලධාරිතුමායි. ඒ ආදායම් පාලක නිලධාරිතුමා ආණ්ඩුවට කරුණු ඉදිරිපත් කර කිව්වා, මේ ඉඩම ගැනීමෙන් වැඩක් නැහැ, ආණ්ඩුවට අයිති වෙනත් ඉඩම් කිට්ටුව තිබෙනවා, ඒ නිසා මේ ඉඩම ගැනීම නැවැත්වීමට කටයුතු කරන්නය කියා. ඉඩම් කච්චේරිය පවත්වා ඉඩම් බෙදීමට තිබුණේ 1968 දීයි. ඒ අවස්ථාවේදී ආණ්ඩුව තීරණය කළා, මේ ඉඩම ගැනීමෙන් වැඩක් නැත, කිට්ටුව තිබෙන ආණ්ඩුව සතු කැලෑ ඉඩමක් ගැනීම මීට වඩා හොඳය කියා. මේ ගැන පළාතේ විශාල විරුද්ධත්වයක් ඇති වුණා. මීට විරුද්ධව පළාතේ මහජනයා දහස් ගණනින් පෙත්සම් අත්සන් කළා. අක්කර 175 ක් පමණ වූ ඒ ඉඩම බෙදා දුන්නොත් අකුරැස්සේ මන්ත්‍රීතුමාට (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) වැඩි වාසියක් සැලසේය කියන අදහස උඩයි, මේක නවත්වන්නට උත්සාහ කළේ. එහෙත් එයින් කිපුණු මහජනයා පෙත්සම් අත්සන් කරමින් මේ ඉඩම, ඉඩම් නැති මහජනයා අතර බෙදා දෙන්නට ඕනෑය කියා උද්ඝෝෂණයක් කළාම ඉඩම් අමාත්‍යාංශය ටිකක් හය වුණා. මේ ඉඩම ගැනීම නැවැත්වීම මේක අරගෙන බෙදා දීමට වඩා නරක බව තේරුම් ගත්තා. මේක බෙදා දීමෙන් අකුරැස්සේ මන්ත්‍රීතුමාට වාසියක් අත් වන බව ඇත්ත නමුත් ඒ අතරම අපට මහජනයාගේ සිත දිනා ගන්නට පුළුවන්ය, ඒක වඩා වාසිදායක තත්ත්වයක්ය කියා කල්පනා කර ඒ කටයුත්ත කරන්නට දැන් විධිවිධාන යොදා තිබෙනවා. ඉඩම් අමාත්‍යාංශය කටයුතු කරන්නේ ඒවා කරන්නට ඕනෑ නිසා නොව, යම් යම් වාසි බලාපොරොත්තුවෙන් බව, යම් යම් දේශපාලන පරමාර්ථ ඉටු කර ගැනීමේ අදහසින් බව මෙයින් පෙනෙනවා. නිලධාරී මහත්වරුන්, විශේෂයෙන්ම දේශපාලන පක්ෂවලට සම්බන්ධකම් තිබෙන අය, මේවා ඉදිරිපත් කළාම අමාත්‍යාංශය මේවාට යට වෙලා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කොන් කිරීමට, ඔවුන් ජනතාවගෙන් වෙන් කිරීමට, ඔවුන්ට දේශපාලන වශයෙන් පහර ගැසීමට මේ අන්දමට කටයුතු කිරීම සාධාරණ නොවන බව මා සඳහන් කරන්නට ඕනෑ.

වැලිගම් කෝරළයේ ආදායම් පාලක නිලධාරිතුමා පසුගිය දිනක මිලිදුව උප තැපැල් කාර්යාලය විවෘත කළ බව ගරු තැපැල් ඇමතිතුමාට මා මතක් කරන්නට කැමතියි. එහි ටෙලිෆෝන් සේවයක් විවෘත කළා. ගරු ඇමතිතුමාට මතක ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
මම දන්නෙ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
වෙන්න ඇති. ගරු ඇමතිතුමා කියන දේ මම පිළිගන්නවා. මා හිතුවා ඇමතිතුමාත් දන්නවා ඇති කියා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
එහෙම එකක් විවෘත කළ බවක්වත් මම දන්නෙ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
විවෘත කළ බවක්වත් දන්නෙ නැහැ කියා ඇමතිතුමා කියනවා. ඇමතිතුමාගේ දැනගැනීම සඳහා මම කියන්නම්. මලිදුව තැපැල් කාර්යාලයේ මේ අළුත් ටෙලිෆෝන් සේවය විවෘත කිරීමට නියමිතව තිබුණේ උදේ 9.30 ටයි. පළාතේ මන්ත්‍රීතුමාට යවා තිබුණු ලිපියේ සඳහන් කර තිබුණේ එය උදේ 9.30 ට විවෘත කරන බවයි. එහෙත් ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරිතුමා උදේ 8 වන විට මේ ටෙලිෆෝන් සේවය විවෘත කර ඉවරයි. මන්ත්‍රීතුමා පැමිණෙන විට විවෘත කරන්නට දෙයක් නැහැ. එහි ගොස් සිටි තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මර්දනය කරල ඔවුන් භය ගන්වා දේශපාලන වශයෙන් තමන්ගේ තිබෙන බලපුළුවන්කාර කම් පෙන්වල මේ ආදායම් පාලක නිලධාරියා නියමිත වේලාවට කලින් මේ ටෙලිෆෝන් සේවය විවෘත කළා.

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
ඔය ටෙලිෆෝන් සේවය මේ පනතට අදාළ වෙන්නෙ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒ කාරණය සඳහන් කළේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවලට බාධා කරන නිලධාරීන් වෙනත් මාර්ගවලින් අනිකුත් අමාත්‍යාංශවලටත් ඇඟිලි ගසන අන්දම පෙන්නුම් කිරීමටයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අයවැය ලේඛන විවාදයේදී ඒ ගැන සාකච්ඡා කරමු.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක මම අයවැය ලේඛන විවාදයේදීත් කියන්නම්. මේ ආදායම් පාලක නිලධාරියා කොයිතරම් කැත විධියට ක්‍රියා කළා දැයි කිව්වොත්, තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලවා කියෙව්වා, ඔහු තමයි මේ ටෙලිෆෝන් සේවය ලබා දුන්නේ, පළාතේ මන්ත්‍රීවරයා නොවෙයි, කියා. ඒ කාරණය ඇත්තද නැද්ද කියා ඒ ස්ථානයේ සිටි නිලධාරීන්ගෙන් විමසා බලන මෙන් ගරු තැපැල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මේ වගේ කැත වැඩ කරන උදවිය, මේ වගේ වැරදි ක්‍රියාවල යෙදෙන උදවිය, වැඩි වශයෙන් සම්බන්ධ වී සිටින්නේ ඉඩම් අමාත්‍යාංශයටයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඔහු ඉඩම් අමාත්‍යාංශයේ යැ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ආදායම් පාලක නිලධාරියා [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ආදායම් පාලක නිලධාරියා තමයි, මේ අමාත්‍යාංශයට සම්බන්ධ වෙලා මේ වැඩේ කළේ.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
ඒක කච්චේරියට සම්බන්ධ වැඩක් නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ආදායම් පාලක නිලධාරිතුමා කච්චේරිය වත් සම්බන්ධයි; ඉඩම් අමාත්‍යාංශයටත් සම්බන්ධයි. [බාධාකිරීමක්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධකම් ඇති උදවිය තමන්ගේ නිලය පාවිච්චිකර හැම දෙපාර්තමේන්තුවකටම සම්බන්ධ වෙලා ඒ මාර්ග යෙන් දේශපාලන තත්ත්වය දියුණු කර ගන්නවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
කොයි ආණ්ඩුවෙ නිලධාරීනුත් ඒ විධිය වෙන්නට ඇති.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක මා දන්නෙ නැහැ, තමුන්නාන්සේ දන්නවා ඇති. මම දන්න කාරණය ගැනයි කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ වැලිගම් කෝරලයේ සමුපකාර සමිති සංගමය එහි කාර්යාලය තැනීම සඳහා ඉඩමක් ලබා ගන්නට ගියා. තැපැල් හා රජයේ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමා මේ කාරණය හොඳ හැටි දන්නවා ඇති.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
අයවැය ලේඛන විවාදයේදී ගරු බණ්ඩා ඇමතිතුමා ඔය ප්‍රශ්නයට උත්තර දුන්නා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
වෙන්න ඇති. මට නම් උත්තර දුන්නේ නැහැ. [බාධාකිරීමක්] මම අහන්නෙ තමුන්නාන්සේගෙන් නොවෙයි, ඉඩම් ඇමතිතුමාගෙනුයි. [බාධාකිරීමක්] ඉඩම් ඇමතිතුමාගේ දැනගැනීම සඳහා මම කියන්නම්. වැලිගම් කෝරලේ සමුපකාර සමිති සංගමය එහි කාර්යාලය තැනීම සඳහා ඉඩමක් මිළ දී ගන්නට ලැහැස්ති කරල ඒ පිළිබඳව කටයුතු කරගෙන ගියා. ඔය අතර ඉඩම් හිමියා ඒ ඉඩමේ ගොඩනැගිල්ලක් හැදුවා. මේ සියලු කටයුතු සම්පූර්ණ වුණේ පසුගිය ආණ්ඩු කාලයේදීයි. ආණ්ඩුව වෙනස් වුණේ ඒ අතරතුරදීයි. ආණ්ඩුව වෙනස් වූ හැටියේ ඒ ඉඩම් හිමියාට ඕනෑ විධියට නිදහසේ ඒ ඉඩම පාවිච්චි කරන්නට ඉඩ දුන්නා. මේවා දේශපාලන වශයෙන් කරන සංග්‍රහ නොවේදැයි මා අහන්නට කැමතියි. [බාධා කිරීමක්] ඇමතිතුමා දන්නේ නැතිලු.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒක ආහාර අමාත්‍යාංශයේ කටයුත්තක්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
කොයි අමාත්‍යාංශයෙන් වුණත් ඉඩම් අත්පත් කර ගැනීමේ බලය තිබෙන්නේ ඉඩම් අමාත්‍යාංශයටයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුව වේවා, ආහාර දෙපාර්තමේන්තුව වේවා, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වේවා, ඉඩම් ලබා ගැනීමට යාමේදී ඒ ඉල්ලීම් ඉඩම් දෙපාර්තමේන්තුවට ආවාම තමයි, හිර වෙන්නේ. සියලුම දූෂණ සිදු වෙන්නෙ එහිදීයි.

ගරු සභාපතිතුමාගේ දැනගැනීම සඳහා කරුණක් කියන්නම්. මාතර මගේ ඡන්ද කොට්ඨාශයේ රාවත්ත කියන ඉඩම ගම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ පවරා ගැනීමට මාතර දිස්ත්‍රික් සම්බන්ධී කරණ කාරක සභාව තීරණය කළා. එසේ තීරණය කර ඒ සඳහා අවශ්‍ය සියලුම කට යුතු ඉටු කළා. ඒ ඉඩම ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ පවරා ගන්නවාය කියා මට දැනුම් දීමකුත් කළා. ඊට පසුව සිදු වුණේ කුමක්ද ? මා මෙම ගරු සභාවේදී ඉඩම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධව විවේචනයක් කළා. ඒ විවේචනය කර දවස් 2ක් යන්නටත් කලින් අර ඉඩම ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ පවරා ගන්නේ නැත කියා මට ලියමනක් ආවා. එසේ වුණේ මා ඉඩම් නිලධාරීන් විවේචනය කළ නිසයි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මේ ආණ්ඩුව කරන හැම ක්‍රියාවක්ම අපි ඉවසා ගෙන ඉන්නට ඕනෑ කියන එකයි මේ ආණ්ඩුවේ බලාපොරොත්තුව. විවේචනය කිරීමේ නිදහස ගැන මේ ආණ්ඩුව පුරසාරම් කියතත් එය ක්‍රියාත්මක කරන්නට ලැහැස්ති නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය වෙසක් පෝය දවසේ මගේ ඡන්ද කොට්ඨාශයේ ප්‍රසිද්ධ පන්සලක උත්සවයක් තිබුණා. උත්සවයේ ප්‍රධාන හාමුදුරුවෝ ගරු පණ්ඩිත මාලිම්බොඩ වජිරඥාන ස්වාමීන් වහන්සේයි. එම උත්සවයට මාතර මහ දිසාපතිතුමා, උප දිසාපතිතුමා, මාතර සහකාර පොලිස් අධිකාරීතුමා යන අයත් සම්බන්ධ වුණා. මමත් එම උත්සවයට සම්බන්ධ වුණා. එම උත්සවයේ ආරම්භක කථාව කළ වජිරඥාන ස්වාමීන් වහන්සේ මගෙන් එක්තරා ඉල්ලීමක් කළා. "මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ගැන තමුන්නාන්සේ ඉඩම් ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කරන්න එපා ; තමුන්නාන්සේ ඉල්ලා සිටියොත් මෙය ලැබෙන්නේ නැහැ " කියා ඒ ස්වාමීන් වහන්සේ මට කිව්වා. මොකක්ද එයින් තේරෙන්නේ ? ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන සමහර ඇමතිවරුන් ගැන—හැම ඇමතිවරුන්ටම මා දොස් කියන්නේ නැහැ—මහජනතාව අද ඇති කර ගෙන තිබෙන අදහස කුමක්ද කියා එයින් තේරෙනවා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රී කෙනෙක් කීවොත් නොකෙරෙන තත්ත්වයක් අද තිබෙන්නේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඒ අදහස වැරදියි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රී කෙනෙක් යුක්තිසහගත දෙයක් කිව්වත් කෙරෙන්නේ නැහැ. මහජනයා තේරුම් ගෙන තිබෙන්නේ ඒ විධියටයි. අර හාමුදුරුවෝ මගෙන් එම ඉල්ලීම කළේ ඒ නිසයි. එය කීවේ මාතර මහ දිසාපතිතුමාත් ඉදිරියේ දීයි. කාරණය මේකයි : මාතර නගරයේ සිට විදුලිය සපයන්නට ලැහැස්ති කළේ 1964 දී ; ගිය ආණ්ඩු කාලයේදී. ගස් කපලා කනු සිටුවලා තවම මොකවත් වෙලා නැහැ. ඔය පන්සලටත් විදුලි බලය ලබා ගන්නට ඕනෑ කර තිබෙනවා. ඇමතිතුමාට කියා ඉක්මණින් එය කරවා දෙන්නය කියා ඉල්ලීමක් කළේ නගර සභාවේ සභාපති මහතාගෙනුයි. එසේ ඉල්ලන අතර මට කීවා මා කිව්වොත් කෙරෙන්නේ නැති නිසා කියන්නට එපාය කියා. දේශපාලන වශයෙන් තමන්ගේ සගයන්ට තැන ලබා දීමට මේ ආණ්ඩුව ක්‍රියා කරනවාය කියන එක මහජනයා තේරුම් ගෙන හමරායි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
පරාජිත අපේක්ෂකයෙක් ද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
නැහැ ; එක්සත් ජාතික පක්ෂයේ නගර සභාවේ සභාපතිතුමා. උන්නැහේ ගෙනුයි ඉල්ලීම කළේ. මොකක් ද එයින් තේරෙන්නේ ? ඒ හාමුදුරුවෝ මෝඩ ද ? මේ අන්දමට මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මාතර මහජනතාවට එක බිම් අඟලක්වත් දී තිබෙනවා ද කියා මා ඉඩම් ඇමතිතුමාගෙන් අහනවා. [බාධා කිරීමක්.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ගරු මන්ත්‍රීතුමා පැයක් කථා කළා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
නැහැ; මිනිත්තු 10 යි. තවත් මිනිත්තු 10 ක් පමණ කථා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඉඩම් ඇමතිතුමා මේ රටේ ඉඩම් ප්‍රශ්නය විසඳීමට සෑහෙන වැඩ පිළිවෙළක් තවම ඇති කර නැහැ. ඉඩම් නැති මහජනතාව විශාල සංඛ්‍යාවක් මගේ ඡන්ද කොට්ඨාශයෙහි සිටිනවා. ඔවුන්ට දිය හැකි ඉඩම් ඒ ප්‍රදේශයේ ඕනෑ තරම් තිබෙනවා. එහෙත් ඒවා ලබාගෙන ඉඩම් නැති දුප්පත් ජනතාවට දීමට මේ ආණ්ඩුව ලෑස්ති නැහැ. දී තිබෙන ඉඩම් කොටස්වල පවා කෙරෙන දූෂණ එමටයි. උදාහරණයක් වශයෙන් එක් කරුණක් පමණක් පෙන්වා දෙන්නට මා අදහස් කරනවා. ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ අත්පත් කර ගන්නා ලද "පිප්‍රිට්" නම් වත්තක් මාතර ඡන්ද කොට්ඨාශය තුළ තිබෙනවා. බණ්ඩාරනායක ආණ්ඩු කාලයේදී මෙම ඉඩම රජයට ගත් නිසා මෙය දැන් හැඳින්වෙන්නේ "බණ්ඩාරනායක පුර" නමිනුයි. මෙහි ඉඩම් කැබලි කීපයක් "වෙළෙඳ බිම් තීරුව" වශයෙන් නම් කොට වෙන් කර තිබෙනවා. වෙළෙඳ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පුද්ගලයන්ට වෙන්දේසියේ විකිණීම සඳහායි එසේ වෙන් කර තිබෙන්නේ. එසේ විකිණීමෙන් ආණ්ඩුව මුදලක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා. පසුගිය දවසක එක්තරා මුදලාලි කෙනකු එහි ගොස් මේ වෙළෙඳ බිම් තීරුවෙන් කොටසක් බලහත්කාරයෙන් අයිති කර ගත්තා. දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවෙහිදී මා ඒ ගැන ප්‍රශ්න කළා. එහිදී මට දැන ගන්නට ලැබුණේ, එකී බිම් කැබැල්ල ඒ මුදලාලිට දෙන ලෙස ඉඩම් කොමසාරිස්තුමා දිසාපතිතුමාට නියෝගයක් යවා තිබෙන බවයි. ඉඩම් නැති දුප්පත් ජනතාවට බෙදා දෙනු ලැබ ඉතිරි වී වෙළෙඳ ව්‍යාපාරිකයන්ට වෙන්දේසියේ විකිණීම සඳහා වෙන් කරන ලද ඉඩම් කැබලිවලින් එකක්, ඉඩම් තිබෙන බේකරිකාරයකුට දීමට ඉඩම් කොමසාරිස්තුමා ලියුමක් යවා තිබෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) ඉඩම් දෙපාර්තමේන්තුවේ දූෂණ ගැන කථා කරන විට වැලිමඩ ගරු මන්ත්‍රීතුමාට (පර්සි සමරවීර මයා.) බොහෝම රිදුණා. ඉඩම් තිබෙන මුදලාලි කෙනකුට ඉඩමක් දීම සඳහා ඉඩම් කොමසාරිස්තුමා ලියුමක් යවන්නේ මොන යුතු කමක් උඩ ද? එයින් තේරුම් යන්නේ, ඉඩම් කොමසාරිස්තුමාගේ පවා දූෂණ තිබෙන බවයි. ඉඩම් කොමසාරිස්තුමා මේ දූෂණවලට වග කිව යුතුයි. මා මෙය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා. ඉඩම් කොමසාරිස්තුමා එවැනි ලියුමක් යැව්වේ නැද්දැයි මා ඉඩම් ඇමතිතුමාගෙන් අහනවා. එතුමා එවැනි ලියුමක් යවන්නේ මොන බලයක් පිට ද? දුප්පත් මිනිසුන්ට ඉඩම් ලබා දෙන්නට මේ රජයට බැරි වුවත් බේකරිකාර ලොකු මුදලාලිලාට ඉඩම් දෙන්නට පුළුවනි. මෙයින් පෙනෙන්නේ ඉඩම් දෙපාර්තමේන්තුව මුල සිට අගට කුණු වී ගඳ ගහන තත්ත්වයකට වැටී තිබෙන බවයි. මේ දෙපාර්තමේන්තුවෙන් කවදාවත් ජනතාවගේ ඉඩම් ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. මෙම දෙපාර්තමේන්තුව පොදු කටයුතු සඳහා ඉඩම් අත්පත්කර ගැනීම සම්පූර්ණයෙන්ම නතර කර ආණ්ඩු පක්ෂයේ දේශපාලන මිත්‍රයන්ගේ ඉඩම් ආරක්ෂා කර දෙන ආයතනයක් බවට පත් වී තිබෙනවා.

පසුගිය දවස්වලදී මාතර ප්‍රදේශයේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් ගැනීමට කටයුතු යෙදුණා. මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල දුප්පත් දරුවන්ගේ කාර්මික ඥානය දියුණු කර ගැනීමට අවස්ථාවක් ලැබේ යයි අදහස් කළ ඒ ප්‍රදේශවල මහජනතාව මේ ගැන බොහෝම සන්තෝෂ වුණා. නිසි නිලධාරීන් එහි ගොස් ඉඩම බලා එය අත්පත් කර ගැනීමට කටයුතු යෙදුවා. දැන් අවුරුදු දෙකකටත් වැඩි කාලයක් ගත වී ඇතත් ඉඩම අත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණයෙන් කරන්නට ඉඩම් දෙපාර්තමේන්තුවට බැරි වුණා. මේ රටේ අධ්‍යාපනය කාර්මික අංශයට හරවා ඒ මගින් රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳිය යුතුය, දැනට අධ්‍යාපනය ගමන් කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාර වැරදිය, එය වෙනස් කළ යුතුය, කාර්මික අධ්‍යාපනය දියුණු කිරීමට වහාම කට යුතු කරන්නට ඕනෑය ආදී වශයෙන් මේ ආණ්ඩුව කියන නමුත් කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක් ඉදි කිරීම සඳහා ඉඩමක් ලබා ගන්නට අවුරුදු දෙකක් යන තුරුත් ආණ්ඩුවට බැරි වී තිබෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඒ නිසා නොවෙන්නම් සංශෝධනය කරන්න යන්නේ ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේ සංශෝධන ඇතත් නැතත් ඉඩම් අමාත්‍යාංශය එය ගන්නේ නැහැ. මේ සංශෝධන වුවමනා නැහැ, එය ගන්න. 38 ඒ වගන්තිය යටතේ එය ඉක්මනින්ම ගන්න පුළුවනි.

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)
බෑ. ගලිගමුව ජන්දදායක කොට්ඨාශයේ ඉඩම් තුනක් ඒ වගන්තිය යටතේ ගන්න ගිහින් විරුද්ධ වී—[බාධා කිරීම්]

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඉඩමක් රජයට අත්පත් කර ගන්න අවුරුදු දෙකක් ඕනෑද ? තමුන්නාන්සේලාට සංශෝධන වුවමනා වෙන්නේත් මැතිවරණය කිට්ටු වුණාමයි. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මේ සංශෝධන මෙපමණ කාලයක් වුවමනා වුණේ නැහැ ? මොන සංශෝධන මඟින් හෝ මේ වැඩය ඉෂ්ට වනවා නම් ඒ ගැන අප සන්තෝෂ වෙනවා. එහෙත් අපට නම් පෙනෙන්නේ නැහැ, මේ සංශෝධනවලින්වත් මෙම ප්‍රශ්නය විසඳේවිය කියා. මොන සංශෝධන කෙරුණත් මෙම දෙපාර්තමේන්තුවේ තිබෙන දූෂණ, පක්ෂාග්‍රාහී ක්‍රියා කලාපය හා ධනපතියන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියත් දිහා බැලුවාම, මේ රජයේ ධනපති ප්‍රතිපත්තිය දිහා බැලුවාම නම්, මේ හැම නීතියක්ම කඩාගෙන හෝ රජය ධනපතියන් ආරක්ෂා කරන බව පෙනෙනවා. ඇත්ත වශයෙන්ම රජය ලෑස්ති නම් මේ ඉඩම් අත්පත් කර ගන්න පුළුවනි. රජයට වුවමනාවක් නැතිකම පමණයි තිබෙන්නේ. එම නිසා, දැන්ම බැරි වුණත් වැඩි කල් යන්නට මත්තෙන් ඒ අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට මේ සම්මත කරන්නට යන සංශෝධනම පාවිච්චි කරමින් හෝ අපේ ආණ්ඩුවකට පුළුවන් වේ යයි මා විශ්වාස කරනවා.

අ. භා. 3.28

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
Mr. Deputy Chairman, the original Land Acquisition Bill was passed in 1876. That was amended in 1950. In neither of those laws was there an appeal to the courts. The only appeal to the courts was when there was a question of rival claims and the acquiring officer could not decide as to whom compensation should be paid. In the 1876 Ordinance there was an appeal to the courts with regard to the amount of compensation but there was no appeal to the courts with regard to the question of acquisition.

In 1950 the present Prime Minister, then Minister of Agriculture, brought the Land Acquisition Act amending the earlier law of 1876. He removed the right of appeal to the courts with regard even to the question of compensation and gave the right of appeal to a board of review.

The quetion of appeal to the courts with regard to conflicting claims always existed, because it is only a court of law that can decide to whom a land belongs.

Therefore the law as it exists today is that there can be an appeal to the courts only when there are rival claims to a land. The question of compensation cannot be discussed in the courts; the board of review decides on the amount of compensation.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

But I think during the regime of the last Government lawyers found a way of going to the courts by way of writ. They invoked the inherent right of the courts to investigate the rights of the subject. From that time persons whose lands are to be acquired found a way of appealing to the courts either by way of writ or by way of injunction, thereby delaying the whole question of acquisition.

There are today 40 odd cases pending since 1962, though no right of appeal to the courts exists. Forty-three cases are now pending in respect of acquisitions. Of course, some of them may be genuine where the question of boundaries is in dispute or where the land to be acquired is the wrong land, but most of them go on the footing of bad faith or on the footing that the land is not required for public purposes.

The entire procedure of land acquisition, therefore, has been set at nought by the courts inquiring into any application that comes before them.

The actions are filed in the Supreme Court or in the Districts Court and the court issues notice, and if there is an inquiry it may take two or three years. So, to expedite the demands of Members of Parliament with regard to village expansion, requisition of land for post offices, for community centres, for cemeteries and so on, it was thought that we should restrict the right of appeal to the courts, not to take away the right altogether but to restrict it. The amending Bill originally restricted the right of appeal to the courts, except in the case of bad faith, malice and political motives.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)
(Mr. Leslie Goonewardene—Panadura)

Malice was mentioned, but I do not think political motives were mentioned.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Malice is not mentioned—none of those motives are mentioned. The courts have the right to inquire if such motives are alleged.

But we said that the court cannot inquire into one matter, and that is the suitability of the land for acquisition. That is, the Minister and the Minister alone must decide whether a particular land is necessary for a public purpose.

Otherwise they will go to court and say, " Why do you acquire this land ? Acquire the land next to this." Or they will say, " Why do you want this land for a hospital ? "—or for a school or for village expansion, whatever the case may be.

The entire area of acquisition was open to a court to inquire into when a person goes to the court. And on inquiry, the court may throw it out. But the delay of so many months set the procedure for land acquisition at nought.

The clause I meant stated that the suitability of the land for acquisition could not be called in question. That is all that we prohibited—the question whether the land should be acquired or not. Every other right was there as before, except that we have restricted the time of hearing to three months. If the Supreme Court did not decide in three months, the action should abate. And we also restricted the right of the litigants to go to court in that we said he could go only to the Supreme Court and not to the District Court.

So, I want to emphasize that we did not seek to shut out the courts altogether. We restricted the court to which a litigant should go, we restricted the rights of the court in regard to what it should inquire into, and we restricted the time which a court should take to decide.

But since the hon. Member for Agalawatte (Dr. Colvin R, de Silva) made those very important points,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and since we also were not very happy keeping the courts restricted in this way, we thought we should, to some extent, meet the view of the Opposition since the main idea of the Government was to expedite a court inquiry and not to shut out the court.

Everybody will agree that there must be some limit to the right of a person whose land is to be acquired for a public purpose to hold up an acquisition. We discussed the matter with the hon. Member and the Legal Draftsman and we will move during the Committee stage the Amendment that is before the House.

In other words, we leave it open to a litigant to go to court as before. It might be to the Supreme Court by way of writ, it might be to the District Court by way of a substantive action for injunction.

The plaintiff may plead that the land should not be acquired. Even that can be pleaded. He may plead that the wrong land has been acquired. He may plead that the boundaries are wrongly defined. He may plead political motives or malice. He may plead anything he likes, but the court must give priority to the hearing and, as quickly as possible, deal with the matter and decide.

I think everybody will agree that that is what we want. The complaint here was that there are delays. We want to expedite proceedings. You may be the Government, we may be the Government, but land has to be acquired for public purposes and urgent purposes. Even where a land is to be acquired under emergency procedures, acquisition can be stopped by recourse to the courts.

So, the hon. Member for Agalawatte, the hon. Member acting on behalf of the S.L.F.P., all have agreed on this Amendment. But most of the Debate is irrelevant to the Amendment.

I remember, Sir, when Mr. Molamure was the Speaker, he would not allow any matter to be debated other than the principle of a Bill during the Second Reading Stage. The principle of the Amendment before the House is, are you going to stop delays in acquisition procedures. But the whole range of acquisition has been discussed.

So, we propose to close the Debate at 4 P.M. today and take up the Committee stage. The Bill, amended as we propose to amend it, deals with only one point, namely, do we want delays in acquisition procedures or not? We are going to prevent delays as far as possible by requesting the court to decide any matter before it as quickly as possible. We are not shutting out the courts. Any matter can go before the courts. But let the courts decide it as quickly as possible. Therefore, at 4 p m. we will be moving the Closure of the Debate.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,—

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
මගේ නම පෞද්ගලික වශයෙන් සඳහන් වී තිබෙන නිසා මටත් වචන කීපයක් කථා කිරීමට අවශ්‍ය බව නමුත් නාන්සේට දන්වා සිටිනවා. [බාධාකිරීම්]

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ ගැන කථා කරන්නට තවත් මන්ත්‍රීවරුන් ගණනාවක් සිටිනවා. [බාධාකිරීම්]

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
හබරාදූව ගරු මන්ත්‍රීතුමා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ගරු රාජ්‍ය ඇමතිතුමා ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථාවක් පැවැත්තුවා. මෙම පනතේ තිබෙන සම්පූර්ණ විෂම ගතිය මරා මෙම පනත එතරම් භයානක පනතක් නොවේය, කලබල වන්නට කිසිම දෙයක් මෙහි නැත, මේ තරම් සාධාරණ යුක්තිගරුක දෙයකදී මේ තරම් දිගින් දිගට කථා කරන්නේ මොකටදැයි කියා එතුමා බොහොම උපාසක ලීලාවෙ කථාවක් කළා. එහෙත් මෙම පනතෙහි ඇතුළත් වී තිබෙන ප්‍රතිපත්ති ටික විග්‍රහ කර බැලුවොත්—ඊයේ හැන්දෑවේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා තෝරා දුන් විධියට මෙම පනතෙහි සඳහන් වී තිබෙන කරුණු මොනවාදැයි විග්‍රහ කර බැලුවොත්—මේ ආණ්ඩුවේ විෂම ප්‍රතිපත්තිවලට අප විරුද්ධ වන්නේ කුමක් නිසාදැයි හොඳ හැටි පැහැදිලි වෙනවා ඇති.

ගරු රාජ්‍ය ඇමතිතුමා කියනවා, මේ පනතේ එකම පරමාර්ථය කොයි තරම් ඉක්මනින් ඉඩමක් රජයට පවරා ගන්න වාද කියන ප්‍රශ්නය පමණය කියා. ආණ්ඩුව අදහස් කරන්නේ එපමණයි. ඒක හැබෑව. මේ රජය එම ප්‍රශ්නය දෙස බලන්නේ ඒ ඇසින් පමණයි. එහෙත් පුළුවන් තරම් ඉක්මනින් ඉඩම් රජයට පවරා ගන්නට ඒ පියවර ගන්න විට රටවැසියන්ගේ අයිතිවාසිකම් කොපමණ දුරට පෑගී යනවාද කියන ප්‍රශ්නයයි අපි මතක් කරන්නෙ. එතුමන්ලාට ඕනෑ වී තිබෙනවා ඉක්මනින් ගමන් කරන්න. අනික් මහා මැතිවරණයට තව අවුරුද්දක්වත් නැහැ. මී ළඟ මැතිවරණයේදී ආපසු ඒවිද නැද්ද කියා විශ්වාසත් නැහැ. එම නිසා මේ කාල සීමාව ඇතුළත පුළුවන් තරම් දුරට, දේශපාලන වශයෙන් තමන්ගේ විරුද්ධවාදීන්ගේ, තමන් අකමැති අයගේ ඉඩම් ටික අර ගැනීමෙන් කරන්නට යන පලිගැනීමයි මෙයින් පැහැදිලි වෙන්නෙ.

රජයේ වැඩ පිළිබඳ ඇමතිතුමා මේ විවාදයේදී කථා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවාදයට ලක් වන මෙම පනත පිළිබඳ විවාදයේදී තුන් ඇමතිවරුන් සහ උප ඇමතිවරුන් විවාදයකට සහභාගි වුණ පනතක් මේ මන්ත්‍රී මණ්ඩලයේදී මෑතදී ඉදිරිපත් වී නැහැ. මන්ත්‍රී මණ්ඩලයට පනතක් ඉදිරිපත් කරන බොහෝ අවස්ථාවලදී එම පනත ඉදිරිපත් කරන ඇමතිතුමා පනතේ පරමාර්ථ තෝරා දෙමින් කථා කරනවා. ඒ ගැන වැඩිපුර කථා කරන්නේ විරුද්ධ පක්ෂයයි. ඒ කථාවලට පිළිතුරු වශයෙන් අවසාන කථාව ඒ ඇමතිතුමා විසින්ම හෝ උප ඇමතිතුමා විසින් කරනු ලබනවා. එහෙත් මෙම විවාදයේදී විශේෂ ලක්ෂණයක් හැටියට අපට පෙනී ගියේ, ඇමතිවරුන් එක්කෙනෙක් නොවෙයි තුන් දෙනෙක්ම දැනටමත් කථා කළ බවයි. තමන්ගේ ආත්මාරක්ෂාව සඳහායි ඒ ඇමතිතුමන්ලා කථා කෙළේ. උප ඇමතිවරුන් කථා කළා. ඒවාට පිළිතුරු දීම් වශයෙන් ඇමතිවරුන් කථා කළා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
මීට පසුව, මේ පැත්තෙන් එක්කෙනයි ඔය පැත්තෙන් එක්කෙනයි කථා කරන විධියටයි විවාද කරන්න අදහස් කරන්නෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මෙහිදී ඒ කථා ඇති වුණේ විවාදයකට පිළිතුරු දීම් වශයෙන් නොවෙයි. ඇමතිවරයෙකු කථා කරනවා. නැවත උප ඇමතිවරයකු කථා කරනවා. නැවතත් පෞද්ගලික කරුණු පැහැදිලි කර දීමක්ය කියා ඇමතිවරයකු කථා කරනවා. ඒ විධියේ සිදුවීම්වලින් අපට පෙනී යනවා, මේ ප්‍රශ්නය නිසා කොයි තරම් කුනු කන්දල් ඇවිස්සී තිබෙනවාද කියා. මෙය ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ විවාදයක ස්වරූපයක් ගත් බවයි අපට ඒත්තු ගියේ. උප ඇමතිවරුන් ඇමතිවරුන්ට දොස් කියනවා. ඇමතිවරුන් තමන්ගේ ආරක්ෂාව සඳහා හේතු ඉදිරිපත් කරනවා. තමන්ගේ ආසනයේ ඉඩම් ගත්තේ නැත කියා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් දොස් කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගත්ත ඉඩම් ආපසු දුන්නාය කියා ආණ්ඩු පක්ෂයේම තවත් මන්ත්‍රීවරුන් කොට සක් දොස් කියනවා. [බාධාකිරීම්] විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පමණක් නොව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් කියනවා. දැනටමත් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ඇමතිවරුන් තුන් දෙනකුත්, පාර්ලිමේන්තු ලේකම්වරයකුත් කථා කර ඉවරයි. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීව රුන්ට කථා කරන්නට තිබෙන කාල යෙන් සෑහෙන කොටසක් අරගෙන—

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
නෑ, නෑ.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
කාටත් අයිතියක් තිබෙනවා, කථා කරන්නට.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கா)*
(Mr. Prins Gunasekera)
සවස 4 ට විවාදය කෙළවර කරන හැටියට රාජ්‍ය ඇමතිතුමා යෝජනාවක් කර නවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ම තමන්ගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ඔය තරම් කථා කර නවා නම්, ඒවාට පිළිතුරු දීමට පමණක් නොව තම තමන්ගේ ඡන්දදායක කොට්ඨාශවලදී මේ ඇමතිතුමා කළ නොපණත් කම් ගැන මන්ත්‍රී මණ්ඩලයට කරුණු දැක්වීමටත් විරුද්ධ පාර්ශ්වයට අයිතියක් තිබෙන්නට ඕනෑ. එම නිසා කල් තබාම එකක් කියන්නට ඕනෑ. මේ විවාදය සවස 4 ට කෙළවර කළොත් අප සහ මුලින්ම ඊට විරුද්ධ වෙනවා. [බාධාකිරීම්]

රාජ්‍ය ඇමතිතුමා පැහැදිලි කරන්නට උත්සාහ කළ පරිදි, ඒ තරම් පුංචි චාම් ප්‍රශ්නයක් නොවෙයි මේ පනතට ඇතුළත් වී තිබෙන්නේ. උසාවියේ නඩු කියන්නට යන පැමිණිලිකාරයන් විසින් උසාවියේදී ඉදිරිපත් කෙරෙන කාරණා පිළිබඳව පරීක්ෂා කිරීමට අධිකරණයට ඇති අයිතිය සීමා කරන්නට ඔවුනුත් අකමැති නිසාත්, විරුද්ධ පාර්ශ්වයේ ඉල්ලීම අනුවත් යම් සංශෝධනයක් පිළිගත්තා යයි රාජ්‍ය ඇමතිතුමා කීවා. ඒ සංශෝධන ගැන තව මොහොතකින් කියන්නම්.

මේ පනතට පදනම් වී ඇති ප්‍රතිපත්තිය මොකක්ද? කැබිනට් මණ්ඩලය මන්ත්‍රී මණ්ඩලයට කෙටුම්පත් පනතක් ඉදිරිපත් කරන්නට පළමු එයට ඇතුළත් වන පරමාර්ථ සලකා බැලීම සාමාන්‍ය සිරිතයි. මා කැබිනට් මණ්ඩලයක සේවය කර නැතත්, කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයකු මගින් මෙබඳු පනතක් ඉදිරිපත් කරන්නට පෙර එම ඇමතිවරයා තමන්ට පැනවීමට අවශ්‍ය නීතිය පිළිබඳ විස්තරයක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමයි සාමාන්‍ය සිරිත. එසේ ඉදිරිපත් කිරීමෙන් පසුව එම ඉල්ලීම්වලට ඉඩදිය යුතුද, ඉල්ලුම් කරන කාරණය ගැන නීති පැනවිය යුතුද කියා සලකා බලනවා. එසේ සලකා බැලීමෙන් පසුවයි නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට නියෝග කරන්නේ අසුවල් අසුවල් ප්‍රතිපත්ති ඇතුළත් කර නීති සකස් කර දෙන්නටය කියා. එසේ සකස් කරනු ලබන නීති කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසුව සාකච්ඡා කර අනුමත කළායින් පසුව ඇමතිවරයකුගේ මාර්ගයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මෙයයි සම්ප්‍රදාය. යම්කිසි කෙටුම්පත් පනතකට පදනම් වුණු පරමාර්ථයන් ගැන සාකච්ඡා කර ඉන් අනතුරුව මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනවා නම්, දැනට ඉදිරිපත් කර ඇති මෙම පනත් කෙටුම්පතට පදනම් වුණු පරමාර්ථයන්, පදනම් වුණු චේතනාවන් මොනවාදැයි පරීක්ෂා කර බැලීම වැදගත් බව සඳහන් කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම පනත් කෙටුම්පතට පදනම් වූ පරමාර්ථය නම් සාමාන්‍ය රටවැසියකුට උසාවිය ඉදිරියට ගොස් තමන්ගේ ආරක්ෂාව සඳහා, තමන්ගේ අයිතිවාසිකම් සඳහා ගත හැකි පියවර සීමා කළ යුතුය කියන කාරණයයි. අදහස් කරන මෙම පරමාර්ථය කැබිනට් මණ්ඩලය මගින් අනුමත කළා නම් එයට අපේ බලවත් විරුද්ධතාව පළ කරන්න ඕනෑ. ඒ මක් නිසාද? පෞද්ගලික පළිගැනීම් උඩ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

දේශපාලන හේතුන් උඩ, නොයෙකුත් චේතනාවන් උඩ, ඉඩම් අත්පත් කර ගැනීමේ නීතිරීති උපයෝගිකොට ගෙන ඕනෑම කෙනෙකුගේ ඉඩමක් බලයෙන් අත්පත් කර ගැනීමට ඇමතිවරයාට පුළුවන්කමක් මෙයින් ලැබෙන නිසයි. අද බලපවත්නා පොදු නීතිය යටතේ සාමාන්‍ය රටවැසියකුට වුණත් උසාවියකට ගොස් එබඳු නොපනත්කම් ගැන පැමිණිලි කිරීමට, නීතියේ ආරක්ෂාව ලබා ගැනීමට පුළුවන්කම තිබෙනවා. නමුත් සාමාන්‍ය රටවැසියකුට තිබෙන එම අයිතිය සීමා කරන්නට ඕනෑය කියන අදහස මෙමකැබිනට් මණ්ඩලය දැන් අනුමත කර තිබෙනවා. මෙබඳු පියවරක් ගන්නවා නම් අප තුළ භයක් ඇති වීම සවාභාවිකයි. උසාවියෙන් පමණක් සාමාන්‍ය රටවැසියනට ලබා ගත හැකිව තිබූ සහනයක් වළක්වන්න ඕනෑය කියන අදහස මෙම කැබිනට් මණ්ඩලය අනුමත කළා නම් ඇමති මණ්ඩලයේ සිත් කොයි ආකාරයෙන් ක්‍රියා කරනවාද කියන කාරණය ගැන අප තරමක් සැලකිලිමත් වෙන්න ඕනෑ. බල යට පත් වී සිටින මෙම ආණ්ඩුවේ ඇමතිවරුන් යටතේ ඇති දෙපාර්තමේන්තුවලින් කැමති විධියේ දෙයක් කර ගන්නට ඔවුනට පුළුවන්කම තිබියදී, බලකාමයෙන් මත්ව සිටින මේ ඇමති මණ්ඩලය, මහජනතාවට මෙතෙක් උසාවියෙන් පමණක් ලබා ගැනීමට හැකිව තිබුණු සහනයත් නැති කර දැමීමට නීතිරීති ගෙනෙනවා. මෙබඳු තත්ත්වයක් ඇති වීම නිසා මේ පිළිබඳව අනතුරු හැඟවීමක් මේ රටේ පොදු ජනතාවට කරන්න අපට සිදු වී තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා මෙම විවාදය සවස හතරට නවත්වන්නටයි කීවත්, එළිවන තුරු කියා හෝ රටවැසියාට මෙම අනතුර පිළිබඳව කරුණු පැහැදිලි කර දෙන්න ඕනෑ. මේ රජය උත්සාහ කරන්නේ තමන්ට ලැබුණු බලය අයුතු ප්‍රයෝජන සඳහා යොදවන්නටයි. උසාවියකට ගොස් ලබාගත හැකි සහනය නැතිකර දමනවා පමණක් නොවෙයි, උසාවිය තුට්ටුවකටවත් ගණන් නොගන්නා පිළිවෙළට ක්‍රියා කරනවා. උසාවි ගියාම ප්‍රමාද වන නිසා, ඇමතිවරයාගේ නියෝගයන්ට අනුව ක්‍රියා කළ යුතුය කියා මහජන අයිතිවාසිකම් නැති කිරීම පිණිසයි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

එපමණක් නොවෙයි, මෙම ආණ්ඩුව අලුතෙන් පිළිගත් නවත් ප්‍රතිපත්තියක් ද මේ පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා. එනම්, එක් අයකු කළ වරදකට තවත් කෙනෙකුට දඬුවම් කිරීමයි. මෙය දෙවන වරටත් පනත් කෙටුම්පතකට නීතියක් වශයෙන් ඇතුළත් කර තිබෙනවා. ඊයේ පෙරේදා මෙම ගරු සභාවේදී විවාද කර අනුමත කළ සමුපකාර සමිතිවලට ණය දීම සඳහා වූ පනත් කෙටුම්පතටත් එම නීතිය ඇතුළත් ව තිබුණා. රජයේ එම ප්‍රතිපත්තිය අනුව වරදක් කළොත් දඬුවම් කරන්නේ වරදකරුවාට නොවෙයි; ණය ලබාගත් ගොවියාට එම ණය ගෙවන්න බැරි නම් ඔහුගේ සලාක පොත පමණක් නොවෙයි, පවුලේ උදවියගේ—භාර්යාවගේ හා දරුවන්ගේ—සලාක පොත් පවා රජයට ගන්නවා. වරද කරන්නේ ගොවියායි. නමුත් ගොවියාගේ අඹුවටත් දරුවන්ටත් දඬුවම් ලැබෙනවා. ඒවාගේ මෙතැනත් වරද කරන තැනැත්තාට නොවෙයි දඬුවම් දෙන්නෙ. මේ පනතේ තිබෙන විධියට යම් යම් හේතුන් උඩ අධිකරණයක් ඉදිරිපිටට යන්නට අවසරයක් දී තිබෙනවා. නමුත් අධිකරණයක් ඉදිරිපිටට ගිය පළියට තමන්ට වුවමනා කරන දේ ඒ වේලාවේම ඉෂ්ට වන්නේ නැහැ. මාසයක් ඇතුළත උසාවිය ඉදිරිපිටට යන්නට පුළුවනි, නමුත් මාස තුනක් ඇතුළත නඩුව විසඳා අවසාන වන්නටත් ඕනෑය කියා නීතියෙන් කියනවා. මාස තුනක් ඇතුළත නඩුව විසඳා අවසාන වුණේ නැත්නම් එය කාගේ වරදද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
දැන් එහෙම නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
කොහේද නැත්තෙ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අළුත් සංශෝධනයෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர்)*
(Mr. Prins Gunasekera)
අළුත් සංශෝධනයක් තවම මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අප කිව්වා නොවැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
තමුන්නාන්සේලා කිව්වා. නමුත් රීත්‍යනුකූලව තවම අළුත් සංශෝධනයක් මන්ත්‍රී මණ්ඩලය ඉදිරිපිට නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කාරක සභා අවස්ථාවේදී—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
කාරක සභා අවස්ථාවේදී ඒ ගැන කථා කරමු. දැන් අප කථා කරන්නේ මේ පනත් කෙටුම්පත ගැනයි. දැන් අප කථා කරන්නේ මේ පනත් කෙටුම්පතට පදනම් වූ පරමාර්ථ ගැනයි. රීති ප්‍රශ්න මතු කර කවිකයින්ගේ කටවල් වසනවා වාගේ දැන් මේ පනත් කෙටුම්පතට පදනම් වූ පරමාර්ථ ගැන මන්ත්‍රීවරුන් කථා කිරීම වළක්වන්නට තමුන්නාන්සේට බැහැ. දැන් වේලාව අ. භා. 3.50 යි. තවමත් මන්ත්‍රී මණ්ඩලය ඉදිරිපිට තිබෙන්නේ මේ පනත් කෙටුම්පතයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
මාසයකින් මෙපිට නැවත රැස් වන්නේ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
